නිගමනය : විධිමත් සහ අවිධිමත් මාර්ග දෙකකට මේවා වර්ග කළ හැකිය. (ලකුණු 01)

02. i. **ප්‍රවේශය** : මෙම මතය අවධාරණය කරන දේශපාලන මතවාදය අපේක්ෂකයා තේරුම්ගෙන තිබීම (ලකුණු 01)
අන්තර්ගතය : 1. රාජ්‍යයේ ආරම්භය (ලකුණු 02)
2. රාජ්‍යයේ විකාශනය (ලකුණු 02)
3. රාජ්‍යයේ අවසානය (ලකුණු 02)
4. කොම්යුනිස්ට් සමාජය (ලකුණු 02)
නිගමනය : රාජ්‍යය පන්ති අරගලයක ප්‍රතිඵලයක් ලෙසත් පන්ති විරහිත සමාජයේ දී රාජ්‍යය විඳැකී යයි. (ලකුණු 01)

ii. **ප්‍රවේශය** : සම්මුතියක් මගින් රාජ්‍ය බිහිවූ බවට අපේක්ෂකයාගේ අවබෝධය (ලකුණු 01)
අන්තර්ගතය : 1. සමාජ සම්මුතිවාදය ඉදිරිපත් කළ දාර්ශනිකයන් දෙදෙනාගේ ප්‍රකෘතික සමාජය පිළිබඳ අදහස් (ලකුණු 02)
2. ප්‍රකෘතික සමාජයෙන් සිවිල් සමාජයට ප්‍රවේශ්‍ය වීමේ ආකාරය (ලකුණු 02)
3. රාජ්‍යය හා ආණ්ඩුවේ ස්වභාවය පිළිබඳ අදහස් (ලකුණු 02)
4. රාජ්‍යයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අදහස් (ලකුණු 02)
නිගමනය: (ලකුණු 01)

iii. **ප්‍රවේශය** : විකාශනාත්මකවාදය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න දක්වා තිබීම (ලකුණු 01)
අන්තර්ගතය : 1. රාජ්‍ය බිහිවීමට බලපෑ ආර්ථික , දේශපාලන හා සමාජ කාරණා (ලකුණු 02)
2. රාජ්‍ය විකාශනය (ලකුණු 04)
3. රාජ්‍යයේ පැවැත්ම (ලකුණු 02)
නිගමනය : (ලකුණු 01)

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

03. i. **ප්‍රවේශය** : ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි අපේක්ෂකයන් සතු අවබෝධය (ලකුණු 01)
අන්තර්ගතය : 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අන්තර්ගත විය යුතු කරුණු (ලකුණු 02)
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රටින් රටට වෙනස් වීමේ ස්වභාවය (ලකුණු 02)
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වභාවය (ලකුණු 04)
නිගමනය: රාජ්‍ය පාලනයේ උත්තරීතර ලියවිල්ල රටේ මූලික නීතිය වන බව (ලකුණු 01)

ii. **ප්‍රවේශය** : ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වභාවය පිළිබඳ මනාව වටහාගෙන තිබීම (ලකුණු 01)
අන්තර්ගතය : ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳව විශ්ලේෂණය (ලකුණු 08)
නිගමනය : (ලකුණු 01)

iii. **ප්‍රවේශය** : පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය පිළිබඳ අවබෝධය (ලකුණු 01)
අන්තර්ගතය : 1. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වාසි (ලකුණු 04)
2. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ අවාසි (ලකුණු 04)
නිගමනය : (ලකුණු 01)

04. i. **ප්‍රවේශය** : බ්‍රිතාන්‍ය කැබිනට් ආණ්ඩුක්‍රමයේ ස්වභාවය සහ ව්‍යවස්ථාදායක-විධායකය සම්බන්ධතා පිළිබඳ අවබෝධය (ලකුණු 02)
අන්තර්ගතය : විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතා ගොඩනැඟී ඇති ආකාරය (ලකුණු 06)
නිගමනය : ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර ඇති සම්බන්ධය. අනෙක්නා රඳා පැවැත්ම සහ එකක් අනෙකෙන් පාලනය වීම (ලකුණු 02)

ii. **ප්‍රවේශය** : ඇමරිකානු ජනාධිපති තෝරාගැනීමේ මැතිවරණ ක්‍රමය පිළිබඳ අවබෝධය (ලකුණු 01)
අන්තර්ගතය : 1. ඇමරිකානු ජනාධිපතිවරයා තෝරාගැනීමේ ක්‍රියාවලිය (ලකුණු 06)
2. ජනාධිපතිවරයා තනතුරෙ හාරගැනීම (ලකුණු 04)
නිගමනය: එම ක්‍රියාවලියේ සංකීර්ණබව සහ ප්‍රජාතන්ත්‍රවාදීබව පිළිබඳ විග්‍රහයක් (ලකුණු 01)

iii. **ප්‍රවේශය** : ඉන්දීය ආණ්ඩුක්‍රමයේ ස්වභාවය පිළිබඳ අවබෝධය (ලකුණු 01)
අන්තර්ගතය : 1. ඉන්දීය ආණ්ඩුක්‍රමයේ සන්ධීය ලක්ෂණ (ලකුණු 04)
2. ඉන්දීය සන්ධීය ක්‍රමයේ ඒකීය ලක්ෂණ (ලකුණු 04)
නිගමනය : සහසන්ධීය ක්‍රමයක් ලෙස ඉන්දීය ආණ්ඩුක්‍රමය (ලකුණු 01)

05. අ. **ප්‍රවේශය** : කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණ පිළිබඳ අවබෝධය (ලකුණු 01)
අන්තර්ගතය : 1. කෝල්බෘක් නිර්දේශ සහ කැමරන්ගේ නිර්දේශ (ලකුණු 04)
2. ඒවායේ වාසි (ලකුණු 07)
3. ඒවායේ අවාසි (ලකුණු 07)
නිගමනය : ශ්‍රී ලංකාවට සිදුවූ සමාජ, ආර්ථික සහ දේශපාලන බලපෑම් (ලකුණු 01)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

05. අ. **ප්‍රවේශය** : ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය පිළිබඳ අවබෝධය (ලකුණු 01)

අන්තර්ගතය : 1. ඩොනමෝර් කොමිසමේ යෝජනා (ලකුණු 02)
2. කාරක සභා ක්‍රමය පිළිබඳ හැඳින්වීම (ලකුණු 02)
3. කාරක සභා ක්‍රමයේ වාසි (ලකුණු 02)
4. කාරක සභා ක්‍රමයේ අවාසි (ලකුණු 02)

නිගමනය : වඩා ප්‍රජාතන්ත්‍රවාදී වූ යෝජනාවක් වන අතර සියලුම දෙනාටම රාජ්‍ය පාලන කටයුතු වලදී සහභාගී වීමට හැකි වීම (ලකුණු 01)

06. i. **ප්‍රවේශය** : සොල්බරි සහ 1972 ව්‍යවස්ථා යටතේ නාමික විධායකය පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය (ලකුණු 01)

අන්තර්ගතය : 1. සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නාමික විධායකයේ බලතල කාර්යයන් සහ තත්ත්වය (ලකුණු 04)
2. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නාමික විධායකයේ බලතල කාර්යයන් සහ තත්ත්වය (ලකුණු 04)

නිගමනය : සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නාමික විධායකයට සාපේක්ෂව 1972 ව්‍යවස්ථාවේ නාමික විධායකයේ බලතල අවප්‍රමාණය කිරීම (ලකුණු 01)

ii **ප්‍රවේශය** : සොල්බරි සහ 1972 ව්‍යවස්ථාදායකයන් හි නිති සම්පාදන බලය පිළිබඳ දැනුම සහ අවබෝධය (ලකුණු 01)

අන්තර්ගතය : 1. සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාදායකයේ බලතල කාර්යයන් සහ තත්ත්වය (ලකුණු 04)
2. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාදායකයේ බලතල සහ කාර්යයන් සහ තත්ත්වය (ලකුණු 04)

නිගමනය : සොල්බරි ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාදායකයට සාපේක්ෂකව 1972 ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාදායකය දුර්ණ බලතල සහිත එකක් වීම (ලකුණු 01)

iii. **ප්‍රවේශය** : සොල්බරි ව්‍යවස්ථාව මගින් සහ 1972 ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ අවබෝධය (ලකුණු 01)

අන්තර්ගතය : 1. සොල්බරි ව්‍යවස්ථාවෙන් අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ හඳුන්වා දී තිබූ විධි විධාන (ලකුණු 03)
2. 1972 ව්‍යවස්ථාව යටතේ අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ විධිවිධාන (ලකුණු 03)
3. අධිකරණයේ ස්වාධීනත්වයේ ප්‍රයෝගික තත්ත්වය (ලකුණු 02)

නිගමනය : (ලකුණු 01)

Alevel ඇසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

07. i. **ප්‍රවේශය :** ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ ක්‍රියාදාමය පිළිබඳ අවබෝධය (ලකුණු 01)
අන්තර්ගතය : ජනාධිපතිවරණ ක්‍රියාදාමය (ලකුණු 08)
නිගමනය : නියත බහුතරයක් නොමැති වූවහොත් දෙවැනි සහ තෙවැනි මනාප ගණනය කිරීම (ලකුණු 01)

ii. **ප්‍රවේශය :** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයාගේ ස්වභාවය සහ තත්ත්වය (ලකුණු 01)
අන්තර්ගතය : 1. 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකරන ලද වෙනස්කම් (ලකුණු 04)
2. 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකරන ලද වෙනස් කම් (ලකුණු 04)
නිගමනය : 18 වන සංශෝධනය මගින් ජනාධිපති විධායකය අධිආඥාදායකත්වයක් බවට පත්කිරීමට ද 19 වන සංශෝධනය මගින් ජනාධිපති තනතුරේ ප්‍රජාතන්ත්‍රවාදීභාවය නැවත අනුගත කිරීම (ලකුණු 01)

iii. **ප්‍රවේශය :** ජනාධිපතිවරයා තනතුරෙන් ඉවත් කිරීම පිළිබඳ අදහස්කයාගේ අවබෝධය (ලකුණු 01)
අන්තර්ගතය : ඉවත් කිරීමේ ක්‍රමවේදය (දෝෂාභියෝගය) (ලකුණු 08)
නිගමනය : දෝෂාභියෝගය ඉතා සංකීර්ණ ක්‍රියාදාමයක් ලෙස (ලකුණු 01)

08. i. **අර්ථ දැක්වීම** (ලකුණු 06)
මූලධර්ම (ලකුණු 04)

ii. **අර්ථ දැක්වීම** (ලකුණු 06)
මූලධර්ම (ලකුණු 04)

iii. **බලතල** (ලකුණු 04)
කාර්යයන් (ලකුණු 06)

Alevel ලැබ් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

B - කොටස

Q1. මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නේ කෙසේ ද?

අරමුණ: මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා ආකාරය පිළිබඳව අපේක්ෂයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක් කිරීමය. පරිපූර්ණ පිළිතුරක එම සියලුම විධිමත් සහ අවිධිමත් මූලාශ්‍ර අන්තර්ගත විය යුතු අතර එම මූලාශ්‍රයන්හි සාපේක්ෂ වැදගත්කමද කෙටියෙන් සාකච්ඡා කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රවේශය: දේශපාලනය යනු සංවිධිත දේශපාලන ක්‍රමයක් තුළ මිනිසුන් බලය ඇල්ලා ගැනීම හා ක්‍රියාවට නැංවීම සඳහා එමගින් ඇති කරන දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිඵල පිළිබඳ සමස්ථ ක්‍රියාදාමය වේ. ජනතාවට මෙම ක්‍රියාදාමයට සහභාගී විය හැක්කේ ඔවුන් කොතෙක් දුරට දේශපාලන සමාජානුයෝජනයට ලක්වී තිබෙනවාද යන කරුණු මතය. දේශපාලන සමාජානුයෝජනය යනු මිනිසුන් දේශපාලනය ඉගෙනගැනීම හා ඒ අනුව තම දේශපාලන චර්යාව ඉගෙනගැනීම ය.

අන්තර්ගතය: මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා මූලාශ්‍ර රාශියක් හිඳෙන අතර ඒවා පහත දැක්වේ.

(1) පවුල
(2) පාසැල
(3) ආගමික සංවිධාන
(4) සමවයස් කණ්ඩායම්
(5) සමාජ ජංගම
(6) ආහාර කණ්ඩායම්
(7) දේශපාලන පක්ෂ
(8) ජනමාධ්‍ය
(9) ආණ්ඩුව

(1) පවුල

මිනිසුන් දේශපාලනය ඉගෙන ගැනීම ආරම්භ කරන්නේ ළදරු වයසේදීමයැයි පිළිගැණෙන අතර එසේ ඉගෙන ගන්නා ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ පවුලය. මෙම මූලාශ්‍රය හරහා කුඩා ළමයින් ඉගෙනගැනීම කරනු ලබන්නේ තම පවුලේ වැඩිහිටියන් අණුකරණය කිරීම මගිනි. මෙම මූලාශ්‍රය හරහා කුඩා ළමයින් අයත් කර ගන්නා දේශපාලන දැනුම පදනම් කරගෙන වර්ධනය කර ගන්නා දේශපාලන ගතිගුණ කිහිපයක් තිබේ.

(අ). වැඩිහිටියන් විශ්වාස කරන දේශපාලන අදහස්, මතිමතාන්තර සහ දේශපාලන බැඳීම් විශ්වාස කිරීමට සහ අනුගමනය කිරීමට පෙළඹීම හා ලැදියාවක් දැක්වීම. මෙසේ අයත් කර ගන්නා දේශපාලන දැනුම මගින් වර්ධනය කර ගන්නා දේශපාලන ගතිගුණ සමහරවිට මුලු ජීවිත කාලය පුරාම පවතින බව පර්යේෂණ මගින් පෙන්වා දී තිබේ.

(ආ). පවුලේ අධිකාරී බලයට යටත් වීම මගින් රාජ්‍ය අධිකාරී බලයට යටත් වීමට පුරුදු පුහුණු වීම.

(ඇ). පවුලේ තීරණගැනීමේ ක්‍රියාදාමයට සහභාගී වීම මගින් අයත් කරගන්නා දේශපාලන කුසලතාවන්. එනම් වැඩිහිටියෙක් වූ පසු තරඟකාරී විවෘත දේශපාලන ක්‍රියාදාමයට සහභාගී වීමට අදාළ කුසළතා වර්ධනය කර ගැනීමට හැකිවීමය.

(ඈ). ප්‍රශ්න කිරීමකින් තොරව දෙමව්පියන්ගේ තීරණ වලට අවනතභාවය දැක්වීම් තුළින් පුරුදු පුහුණු වෙන විනයානුකූල පැවැත්ම මගින් යහපත් පුරවැසියෙකු ලෙස රාජ්‍ය බලයට යටත් වීමට පුරුදු වීම.

(ඉ). පවුලේ බලපෑමෙන් කුඩා ළමයින් තුළ වර්ධනය වන වෙනත් දේශපාලන ගුණාංග. කමන්ගේ අනාගත සමාජ තත්ත්වය ගැන සිතීමට පුරුදු වීම සහ වාර්ගික, භාෂා, පංතිය හා ආගම යනාදී සමාජ කරුණු සමඟ පවත්වා ගෙන යා යුතු සම්බන්ධතාවන් පිළිබඳව පුරුදු පුහුණු වීම.

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

හෙසේවුවද, ළමුන් තම පවුල තුළින් අත් කර ගන්නා දේශපාලන දැනුමේ ප්‍රමාණය සහ පවුල තුළින් ඔවුනට වන බලපෑම් තීරණය වන්නේ දෙමව්පියන්ගේ සහ අනෙක් වැඩිහිටි සහෝදර සහෝදරියන්ගේ දේශපාලන සමාජානුයෝජන මට්ටම, නිවස තුළ දේශපාලන කරුණු සාකච්ඡා කරන ප්‍රමාණය, තීරණ ගැනීමේදී පවතින ප්‍රජාතන්ත්‍රවාදීභාවයේ ප්‍රමාණය, දෙමව්පියන් සහ අනෙක් වැඩිහිටියන් සක්‍රිය දේශපාලනයට සහභාගි වන ප්‍රමාණය, පවුලේ ආර්ථික හා සමාජ මට්ටම යනාදී කරුණු මතය.

(2) පාසැල

මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා දෙවන මූලාශ්‍රය වන්නේ පාසැලය. දේශපාලන දැනුම ලබාදීම සඳහා පාසැල මගින් කරන කාර්යභාරය දෙයාකාර වේ. එනම්;

(අ). පන්ති කාමරය තුළ කරන ඉගැන්වීම

(ආ). පන්ති කාමරයෙන් බාහිරව සිදුවන ක්‍රියාකාරකම්

(අ). පන්ති කාමරය තුළ කරන ඉගැන්වීම

මේ සඳහා පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අදාළ දැනුම් ලබා දේ.

i. දේශපාලනය යනු කුමක්ද?
ii. දේශපාලන ක්‍රීඩාව කරන ආකාරය සහ ඒ සඳහා සම්බන්ධ නෛතික පද්ධතිය
iii. දේශපාලන ආයතන, ඒවාට හිමි බලතල හා කාර්යයන් සහ ඒවා කෙරෙහි පවතින නෛතික සීමාවන්
iv. දේශපාලන ආයතන සහ මිනිසුන් අතර පවතින සම්බන්ධතාවන්හි ස්වරූපය
v. දේශපාලන ක්‍රමය සහ පුරවැසියන් අතර පවතින බැඳීම් වල ස්වරූපය
vi. ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික මුද්‍රාව, ජාතික වීරයින් වැනි දේශපාලන හා ජාතික සංකේත සහ දේශපාලන ක්‍රමය පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් ඒවාට ගරු සැළකිලි දැක්වීමේ වැදගත්කම
vii. පුද්ගලයින්ගේ දේශපාලන කුසලතා සහ හැකියාවන් වර්ධනය කර ගැනීමට අවශ්‍ය දැනුම

(ආ). පන්ති කාමරයෙන් බාහිරව සිදුවන බලපෑම්

පාඨශාලාව අයත් කරගෙන ඇති සමාජ තත්ත්වය, ආදි ශිෂ්‍යයින්ගේ සමාජ මට්ටම හා තත්ත්වය, පාඨශාලාව තුළ ක්‍රියාත්මක වන විවිධ සංවිධාන, සමිති සමාගම්, විෂය බාහිර ක්‍රියාකාරකම් යනාදිය මගින් ඇතැම් දේශපාලන ගතිගුණ, ගුණාංග, විශ්වාස සිරිත් සහ අගයකිරීම් හැඩ ගැස්වීම් කෙරෙහි සිදුවන බලපෑම් මෙයින් අදහස් වේ. නිදසුන් ලෙස සහභාගි වීම, නායකාරී වීම, අරමුණු සාධනය සහ නිසිරීති පිළිපැදීම් යනාදී ගුණාංග වර්ධනය වීම සම්බන්ධයෙන් ක්‍රීඩා වලින් සිදුවන බලපෑම් පෙන්වා දියහැක.

(3) ආගමික සංවිධාන

ආගම් විසින් කරනු ලබන්නේ සාස්කෘතික සහ සදාචාරාත්මක අගයකිරීම් ප්‍රකාශ කිරීම පුවද එම අගයකිරීම් බොහෝවිට දේශපාලන කරුණු කාරණා සමඟ සම්බන්ධ වී තිබෙන ආකාරය දැකිය හැකිය. දෙමව්පියන් තම දූ දරුවන් සමාජානුයෝජන ක්‍රියාදාමයට සම්බන්ධ කරන්නේ පාඨශාලා, ආගමික දේශනා සහ ආගමික සේවාවන් යන මාර්ග ඔස්සෙය. මෙසේ කිරීමේදී ළමයින් නිරායාසයෙන්ම ආගම් වල බලපෑමට හසුවන අතර ඒ අනුව තමන්ගේ දේශපාලන අදහස් උදහස් මෙන්ම ගතිගුණ හා විශ්වාස කිරීම් හැඩ ගස්වා ගැනීමට මඟුන් පෙළඹේ. ආණ්ඩුව සහ ආගම් අතර පවතින සම්බන්ධතාවයන්ද පුද්ගලයින්ගේ දේශපාලන ගතිගුණ හා විශ්වාස කිරීම් හැඩ ගැස්වීම කෙරෙහි බලපානු ලැබේ. ගබ්සා කිරීම යන කරුණ සම්බන්ධයෙන් ආණ්ඩු සහ ආගමික සංවිධාන අතර පවතින ප්‍රතිපත්තිමය සම්බන්ධතාවන් මිනිසුන්ගේ දේශපාලන හැසිරීම් කෙරෙහි බලපා තිබෙන ආකාරය නිදසුන් ලෙස දැක්විය හැකිය. මෙයට අමතරව ආගමික සංවිධාන විසින් දේශනා කරන සහ ඉදිරිපත් කරන සදාචාරාත්මක නියමයන් සහ ආචාර ධර්ම මිනිසුන්ගේ ජීවික හැඩ ගැස්වීම කෙරෙහි දැඩි බලපෑමක් කරන අතර සමහර විට රාජ්‍ය ප්‍රතිපත්ති ඒවා සමඟ ගැටෙන විට ආණ්ඩුව සමඟ මිනිසුන් ගැටුම් ඇතිකර ගන්නා ආකාරය නිරන්තරයෙන්ම දැකිය හැකිය. වේ. නිදසුන් ලෙස ප්‍රංශයේ

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ ලෞකිකවාදය හා ලෝකෝත්තරවාදය අතර පවතින ගැටුම, ඇමරිකාවේ පාසැල් තුළ යාඥා කිරීම නීතිගත කිරීම සම්බන්ධයෙන් ආගමික අත්තවාදීන් සහ පෙඩරල් ආණ්ඩුව අතර පවතින ගැටුම, ඇල්ජීරියාව හා ඊජිප්තුව වැනි රාජ්‍යයන්වල තුළ මුස්ලිම් ආගමික අත්තවාදය හා ලෞකිකවාදය අතර පවතින ගැටුම් පෙන්වා දිය හැකිය.

(4) සමවයස් කණ්ඩායම්

සමවයස් කණ්ඩායම් පුද්ගලයින් දේශපාලනය ඉගෙන ගන්නා තවත් මූලාශ්‍රයක් වන අතර එයට අයත් වන්නේ ළමා වයසේ ක්‍රීඩා කණ්ඩායම්, මිත්‍ර සංගම්, පාඨශාලා මට්ටමේ සහෝදර කණ්ඩායම්, කුඩා වැඩ කණ්ඩායම් සහ වෙනත් එවැනි සංවිධානයන්ය. මෙම සංවිධාන වල මූලික ලක්ෂණය වන්නේ ඒවායේ සාමාජිකත්වය දරන සියලු දෙනාම තම තත්ත්වය අතින් එක සමාන වීමය. අනෙක් ලක්ෂණය වන්නේ සාමාජිකයින් අතර ඉතාම සමීප සම්බන්ධතා ජාලයක් පැවතීමය. සමවයස් කණ්ඩායම් මගින් කෙරෙන ප්‍රධානම කාර්යය වන්නේ කණ්ඩායමේ ගතිගුණ හා වර්යා රටාවට සාමාජිකයින් හුරුපුරුදු කරවීමය. එම කණ්ඩායම් වල සාමාජිකයින් ආශ්‍රිතව දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ තම කණ්ඩායමේ අදහස්, ආකල්ප, වර්යා රටාවන් එයාකාරයෙන්ම පිළිපැදීමට සහ අනුගමනය කිරීමට ඇති ඉහා දැඩි ලැදියාවය. මේ සම්බන්ධයෙන් දැක්විය හැකි නිදසුනක් වන්නේ අන්තර් ජාතික තරුණ සංගමයේ ක්‍රියා කලාපයයි. සමහර විවාරකයින් පෙන්වා දෙන ආකාරයට සෝවියට් රුසියාවේ සහ නැගෙනහිර යුරෝපයේ කොමියුනිස්ට් රාජ්‍යයන්හි තරුණයින් කොමියුනිස්ට් සංස්කෘතියට බැඳ නඛා ගැනීම අඩපන කිරීම කෙරෙහි ඉතාම දැඩි බලපෑමක් කළේ අන්තර්ජාතික තරුණ සංගමය විසින් රොක් සංගීතය, සංවිධානයේ අනන්‍යතාව පෙන්නුම් කළ ටී ෂර්ට් සහ තිල්පාට වෙනිම කුලිසම මෙන්ම එමගින් අවධාරණය කළ ලිබරල් දේශපාලන අදහස් පදනම් කරගත් තරුණ ව්‍යාපාරයයි.

(5) සමාජ පංතිය

කොමියුනිස්ට් නොවන සෑම සමාජ ක්‍රමයක් තුළම විවිධ සමාජ පංතිවල ක්‍රියාකාරිත්වය දැකිය හැකි අතර ඒ සෑම සමාජ පංතියකටම තමන්ට වෙන් වූ දේශපාලන, ආර්ථික හා සමාජ අරමුණු ඉටු කිරීම් මත ගොඩනඟා ඇත් පොදුලික පංති අනන්‍යතාවක් පවතින ආකාරය දැකිය හැක. මෙම අරමුණු ඉටු කිරීම් ඒ ඒ සමාජ පංතියේ දේශපාලන විඥානය සහස් වීම කෙරෙහි ඉතාම දැඩි බලපෑමක් කරනු ලැබේ. නිදසුන් ලෙස ඕනෑම රටක කම්කරු පංතිය යනහොත් එයටම වෙන් වූ කෘෂාසිරිමේ ශෛලියක්, ඇඳුම් පැලඳුම් ශෛලියක්, සතුටු සාමිචියේ සහ විනෝද වීමේ ශෛලියක් සහ තමන්ටම වෙන් වූ සංවිධාන ගොඩනඟා ගැනීමේ ශෛලියක් එනම් වෘත්තීය සමිති, සමාජ ශාලා (Social Clubs) සහ දේශපාලන පක්ෂ යනාදිය දැකිය හැකි වේ. මෙයාකාරයටම බොහෝ රටවල් තුළ ග්‍රාමීය ගොවීන් සහ නාගරිකයින් අතර පවතින පංති බෙදීම් දැකිය හැක. මෙම සෑම බෙදීමක්ම දේශපාලන වශයෙන් ඒ ඒ සමාජ පංතියේ අනන්‍යතාව කෙරෙහි බලපාන අතර මෙයද මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා තවත් මූලාශ්‍රයක් වේ.

(6) ආගා කණ්ඩායම්

ආගා කණ්ඩායම් මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා තවත් මූලාශ්‍රයක් වේ. ආගා කණ්ඩායම් ලෙස සලකන්නේ දේපොලන බලය මෙහෙයවන ආයතන වලට හා පුද්ගලයින්ට බලපෑම් කිරීම මගින් තම පොදුලික ආගාවන් ඉටුකර ගැනීමට හෝ ආරක්ෂා කර ගැනීමට මිනිසුන් විසින් පිහිටුවා ගෙන ඇති සංවිධානයන්ය. විවිධ ආගාවන් සහ වෘත්තීන් පදනම් කරගෙන සංවිධානය වූ ආගා කණ්ඩායම් සිය දහස් ගණනකගේ ක්‍රියාකාරිත්වය වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ දැකිය හැකි සාමාන්‍ය ලක්ෂණයක් වේ. සාමාන්‍යයෙන් ආගා කණ්ඩායම් විවෘතව දේශපාලනයේ නොයෙදුනද තම ආගාවන් වෙනුවෙන් පෙනී සිටීමේදී අනියම් ආකාරයට දේශපාලනයේ නියැලීම් සාමාන්‍ය දෙයක් වේ. හේතුව තමන් පෙනී සිටින ආගාවන් වෙනුවෙන් සහාය දක්වන දේශපාලන පක්ෂ වලට හෝ ආයතන වලට තමන්ගේ සහාය පල කිරීමට ආගා කණ්ඩායම් ක්‍රියා කිරීමය. මෙසේ කිරීම මගින් තම සාමාජිකයින් දේශපාලන වශයෙන් සජීවීකරණය කිරීමට සෑම ආගා කණ්ඩායමක්ම කටයුතු කරනු ලැබේ. යුරෝපයේ කාර්මිකකරණය වූ රටවල් වල බිහි වූ වෘත්තීය සමිති ව්‍යාපාරය මේ සම්බන්ධයෙන් දිය හැකි හොඳම නිදසුනක් වේ. එසේ බිහි වූ වෘත්තීය සමිති වල බලපෑම හේතුවෙන් එම රටවල දේශපාලන සංස්කෘතිය මුලුමණින්ම වෙනස් විය. දේශපාලන බල අරගලය කරගෙන යන ආකාරය වෙනස් විය. අළුත් දේශපාලන

A/L උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

පක්ෂ බිහි විය. නව සමාජ සංරක්ෂණ සහ සුභසාධන වැඩ සටහන් රාශියක් ක්‍රියාවට නැංවීමට එම රටවල ආණ්ඩු වලට හිඳුවිය. ආසා කණ්ඩායම් වල ප්‍රමුඛයා වන්නේ වෘත්තීය සංගමය. ඒවා වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ දේශපාලන බල අරගලයේ ප්‍රධාන ක්‍රියාකාරිකයෙක් වේ. සාමාන්‍යයෙන් දැකිය හැක්කේ වෘත්තීය සංගම් පමණක් නොව සෑම ආසා කණ්ඩායමක්ම තම සාමාජිකයින් දේශපාලන වශයෙන් දැනුවත් කිරීමට නිරන්තරයෙන්ම කටයුතු කරන ආකාරයයි.

(7) දේශපාලන පක්ෂ

දේශපාලන පක්ෂ මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා ඉතාම වැදගත් මූලාශ්‍රයක් වේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ දේශපාලන පක්ෂ විසින් සත්කාලීන දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රශ්න සහ ගැටළු පිළිබඳව නිරන්තරයෙන්ම ජනතාව දැනුවත් කරනු ලැබේ. එමෙන්ම යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් විකල්ප මතවාද කිහිපයක් තිබෙන විටක ඒවා අතුරින් වඩාත්ම සුදුසු එක තුමක්ද යන්න තෝරා ගැනීම සඳහා ජනතාවට මග පෙන්වන්නේ දේශපාලන පක්ෂ විසිනි. බලයේ සිටින ආණ්ඩුව කුමක් කරනවාද? ඒවායේ හොඳ නරක මොනවාද? යන්න පිළිබඳව ජනතාව දැනුවත් කරන්නේ දේශපාලන පක්ෂ විසිනි. දේශපාලන පක්ෂ මෙම කාර්යයන් සිදු කරන්නේ රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ, අත්පත්‍රිකා, පෝස්ටර් යනාදී මාධ්‍යයන් භාවිතයට ගනිමිනි. මෙයට අමතරව සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා දේශපාලන පක්ෂ විසින් විශේෂ පාඨමාලා පවත්වන ආකාරයද දැකිය හැකිය.

දේශපාලන පක්ෂ ජනතාව දේශපාලනය ඉගෙන ගන්නා ඉතාම වැදගත් මූලාශ්‍රයක් වුවද සමහර විට සමහර දේශපාලන පක්ෂ විසින් ලබාදෙන දැනුම හේතුවෙන් ජනතාව ප්‍රතිවිරුද්ධ පාර්ශව වලට බෙදී එකිනෙකා සමඟ ඇණගෙනටා ගන්නා තත්වයක්ද ඇතිවන ආකාරය දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණය වේ. හේතුව සමහර දේශපාලන පක්ෂ ජාතික මට්ටමෙන් ඉවතට ගොස් වර්ගය, ආගම, භාෂාව, කුලය වැනි සාධක මත සංවිධානය වීමත් එම පටු කරුණු මත තම පාක්ෂිකයින් දැනුවත් කිරීමට කටයුතු කිරීමත්ය.

(8) ජනමාධ්‍යය

පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය සහ සඤරා යනාදිය මෙයට අයත් වේ. මිනෑම සමාජයක් තුළ ආණ්ඩුව හා එහි ක්‍රියාකාරීත්වය, දේශපාලන වශයෙන් වැදගත් සිදුවීම්, දේශපාලනඥයින් සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ වෙනත් ආර්ථික හා සමාජීය වශයෙන් වැදගත් වන සිදුවීම් පිළිබඳව ජනතාව තොරතුරු ලබා ගන්නේ ජනමාධ්‍ය මඟිනි. ජනතාවට දෛනික දේශපාලන තොරතුරු ලබා දෙන ප්‍රධානම මාධ්‍යය ලෙස නවමක් සලකන්නේ පුවත්පත්ය.

(9) ආණ්ඩුව

ආණ්ඩුව සමඟ මහජනතාව පවත්වන සෘජු සම්බන්ධතා මඟින් ලබාගන්නා දේශපාලන දැනුම මෙයින් අදහස් වේ. ඉමයට අමතරව සමහර විට ආණ්ඩුව විසින් ජනතාව දේශපාලන වශයෙන් දැනුවත් කිරීම සඳහා දේශපාලන වැඩසටහන් ක්‍රියාවට නංවන ආකාරයද දැකිය හැකිය.

නිගමනය: ඉහත දක්වා තිබෙන්නේ ජනතාව දේශපාලන දැනුම හා අවබෝධය ලබා ගන්නා මාර්ගයන්ය. මෙම මාර්ග විධිමත් සහ අවිධිමත් වශයෙන් නැතිනම් නියම සහ අනියම් වශයෙන් කොටස් දෙකකට වර්ග කරනු ලැබේ. ඉහත දැක්වූ මාර්ග අතුරින් පාඨශාලාව, විශ්වවිද්‍යාල සහ වෙනත් විධිමත් ලෙස සංවිධානය කර ඇති අධ්‍යාපන ආයතන යනාදිය හැරුණු විට අනෙක් සෑම මාර්ගයක්ම අයත් වන්නේ අවිධිමත් මූලාශ්‍ර සහයටය.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

Q2. පහත සඳහන් ඕනෑම දෙකක් විභාග කරන්න.

i. පන්ති අරගලයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

ii. සමාජ සම්විධියක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

iii. සමාජ විකාශනයක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

2.i පන්ති අරගලයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

අරමුණ: රාජ්‍යයේ ප්‍රභවය සහ එහි විකාශනය සම්බන්ධව මාක්ස්වාදී චින්තනය මගින් ඉදිරිපත් කොට ඇති අදහස් පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂාකිරීම.

ප්‍රවේශය: රාජ්‍යයේ ආරම්භය කවදා කෙසේ සිදුවුවාද යන්න නිශ්චිතව අවබෝධකර ගැනීම පහසු එකක් නොවන අතර එය තහවුරු කිරීමට යොදාගතහැකි ඓතිහාසික සාක්ෂි සම්බන්ධව එකඟතාවයක් ද නොමැත. එබැවින් දේශපාලන දාර්ශනිකයන් සහ දේශපාලන විද්‍යාඥයන් රාජ්‍යයේ ආරම්භය විස්තර කිරීමට නානයන් රැසක් ගොඩනගා තිබේ. රාජ්‍යය ඇති නැති සමාජ පන්ති දෙක අතර පවතින ආර්ථික වෙනස්කම් පදනම් කොට ගෙන ඇතිවන අරගලයක ප්‍රතිඵලයක් ලෙස මාක්ස්වාදී මතවාදය මගින් විස්තර කෙරේ.

අන්තර්ගතය: මාක්ස්වාදය රාජ්‍යය සහ එහි පරිවාර ආයතනත් ඒවායේ ක්‍රියාකාරිත්වයත් සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ලිබරල්වාදී මතවාදයට එරෙහිව ඉදිරියට පැමිණි මතවාදයක් වේ. කාල් මාක්ස් සහ ෆෙඩ්රික් ඒංගල්ස් මෙම මතවාදයේ ප්‍රධාන නායකාචාර්යවරුන් වේ. ද්වන්ද්වාත්මක භෞතිකවාදය විශ්වාස කළ මාක්ස් මිනිස් ඉතිහාසය භෞතිකවාදී දෘෂ්ටියකින් විශ්ලේෂණය කරයි. රාජ්‍යය වනාහි සියළු මිනිසුන්ගේ යහපත වෙනුවෙන් පවතින්නක් වන බවත් එය මිනිසාගේ නිදහස් කැමැත්ත මත නිර්මාණය වූ කෘතිම එකක් හෝ ස්වභාවික එකක් වීමට හෝ ඉඩ ඇතැයි යන ලිබරල්වාදී මතයට මාක්ස්වාදීන් දැඩි ලෙස විරුද්ධ වේ.

මාක්ස්වාදී මතවාදයට අනුව රාජ්‍යය යනු පන්තියක ආයුධයකි. එමගින් ධනපති පන්තිය විසින් නිර්ධන පන්තිය සූරාකෑමේන් තම පැවැත්ම සහතිකකර ගැනීමටත් සමාජ වරප්‍රසාද ආරක්ෂා කර ගැනීමටත් මාවත විවර කරගෙන ඇත. රාජ්‍යය වනාහි පන්ති ප්‍රතිවිරෝධතාවක ප්‍රතිඵලයක් විනා අන් කිසිවක් නොවේ. රාජ්‍යයේ බලය මෙහෙයය වන්නේ එම ප්‍රතිවිරුද්ධතාවයේ නියැලී සිටින දේපල හිමි සූරාකරුය වේ. සමාජ, ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍රයේ සියලම දෑ තම සිතැඟියාවන්ට අනුව පාලනය කරන ඔවුන් ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රයක්ද ගොඩනගාගෙන ඇත. රාජ්‍යයේ සියළු පරිවාර ආයතන එම යන්ත්‍රයට අයත් වේ.

හේතු දෙකක් පදනම් කොට ගෙන ධනපති කොටස් විසින් තම ප්‍රයෝජනය සඳහා රාජ්‍යය හිමිකර කරගෙන ඇති බව මාක්ස්වාදීන් පොදුවේ පිළිගනී.
(අ). තමන් සතු නිෂ්පාදන මාර්ග සහ නිෂ්පාදන බලවේග ආරක්ෂා කරගැනීමේ අවශ්‍යතාවය
(ආ). අධිරාජාණය අවශ්‍යතා ක්‍රම්වත්ව සහ සංවිධානාත්මකව ඉටුකර ගැනීමේ අවශ්‍යතාවය

මේ අනුව රාජ්‍යය එක් අතකින් ආර්ථික සංවිධානයක් වශයෙනුත් අනෙක් අතින් දේශපාලන සංවිධානයක් වශයෙනුත් හඳුන්වා දෙනු ලැබේ.

රාජ්‍යය මේ දක්වා ඉදිරියට පැමිණ ඇත්තේ විවිධ සමාජ ස්ථර කිහිපයක් හරහාය. වර්ථමාන සමාජ අවධිය සමාජ ප්‍රතිවිරෝධතා වල උච්චතම අවස්ථාව වන අතර අවසානයේ නිර්ධන පන්තිය දේශපාලන බලය අල්ලා ගන්නා බව මාක්ස්වාදීන්ගේ අදහසයි. එසේ රාජ්‍ය බලය අල්ලා ගන්නා නිර්ධන පන්තිය කවදුරටත් රාජ්‍යය පවත්වා ගන්නා අතර එහි අරමුණු තුනක් ඇති බව මාක්ස්වාදීන්පෙන්වා දෙයි.

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(අ). කොම්යුනිස්ට් සමාජ ක්‍රමයක් ගොඩනැගීමට අවශ්‍ය වටපිටාව සකස් කරගැනීම
(ආ). පාගාගෙන සිටින ධනපති කොටස් නැවත නැගිසිටීමට උත්සාහ කළහොත් එය මර්ධනය කිරීම
(ඇ). අධිරාජ්‍යවාදී බලවේගවලින් ආරක්ෂා වීම
මෙම අරමුණු ජයගැනීමෙන් පසු රාජ්‍යයේ අවශ්‍යතාව නැතිව යන අතර, එහි අවශ්‍යතා ප්‍රතිසම්පාදනය වන්නේ කොම්යුනිස්ට් සමාජයක් බිහිවීමය. එවිටත් සමාජවාදී යුගයේ බිහිවන කොම්යුනිස්ට් සමාජය පන්ති විරහිත එකක් බවට පත්වන බව මාක්ස්වාදීන්ගේ අපේක්ෂාව වේ.

මේ ආකාරයට රාජ්‍යය පන්ති අරගලයෙහ ප්‍රතිඵලයක් ලෙස විශ්ලේෂණය කරන මාක්ස්වාදීන්ගේ මතයට එරෙහි විවේචන කිහිපයක් ද එල්ලවී තිබේ. ඒ අතර පන්ති අරගලය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය ඔප්පුකළ හැකි සත්‍යයක් නොවීම, සමාජය ප්‍රධාන පන්ති දෙකකට බෙදූ පමණින් සෙසු පන්ති සමාජයෙන් අතුරුදහන් නොවීම, ප්‍රචණ්ඩත්වයට ආයාචනා කිරීම, ආර්ථික සාධකය පමණක් වැදගත් කොට සැලකීම, රාජ්‍යය සුරාකෑමේ උපකරණයක් නොවීම සහ ප්‍රතිවිරුද්ධ පන්ති සමාජය තුළ නොතිබුණද රාජ්‍යය සමාජයට අවශ්‍යවීම ප්‍රධාන විවේචන වේ.

නිගමනය: රාජ්‍යයේ සම්භවය හා විකාශනය යනු පන්ති අරගලයෙහ ප්‍රතිඵලයකි යන මාක්ස්වාදී මතවාදය පොදුවේ පිළිගත්තා මතවාදයක් නොවූවත් එහි ඇති විශ්ලේෂණාත්මක හැකියාව සහ ගුණය නිසා දේශපාලන විද්‍යාව තුළ එක් ප්‍රධාන ප්‍රවේශයක් ලෙස තවදුරටත් හඳුනා ගනී.

2.ii සමාජ සම්මුතියෙහ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

අරමුණ: රාජ්‍යයේ ආරම්භය සහ වර්ධනය පිළිබඳව සමාජ සම්මුතිවාදය මඟින් ඉදිරිපත් කොට ඇති අදහස් සහ ඒවායේ අදාළත්වය හා වැදගත්කම සම්බන්ධයෙන් අපේක්ෂකයන් ලබාගෙන ඇති දැනුම් සහ අවබෝධය පරීක්ෂාකිරීම.

ප්‍රවේශය: සමාජ සම්මුති න්‍යාය රාජ්‍යයේ උපත සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති පැරණිම සහ ජනප්‍රිය න්‍යායක් වන අතරම එය නතවර්ම ගණනාවක් දේශපාලන චින්තනය තෙරෙහි බලපෑම් කරමින් ප්‍රායෝගික ආධිපත්‍යයක් හිමිකරගෙන තිබුණි. ග්‍රීක යුගයේ දී ඉදිරියට පැමිණියද සමාජ සම්මුතිවාදී න්‍යාය 12වන සියවසේ තෝමස් හොබ්ස් සහ ජෝන් ලොක් මෙන්ම 18වන සියවසේ ජීන් ජැක්ස්ස් රූසෝ ගේ අදහස් වටා කේන්ද්‍රගත වේ. මෙම නතුයේ මූලය වන්නේ මිනිස් සමාජයේ ආරම්භයේ සිට ආණ්ඩු සංවිධානයක් නොමැතිව ජීවත් වූ මිනිසුන් විසින් ඇතිකරගත් හිවිසුමක නැතහොත් සම්මුතියෙහ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය බිහිවූවාය යන්නය.

අන්තර්ගතය: සමාජ සම්මුතිවාදී න්‍යායට අනුව මිනිස් ඉතිහාසය ප්‍රධාන යුග දෙකකට බෙදන අතර මුල් යුගයේ මිනිසුන් ආණ්ඩුවක් හෝ නීතියකින් තොර පුකෘති නූතනයෙහ් ස්වභාවික සමාජයක් තුළ ජීවත් විය. පසුව මෙවැන් සම්මුතියක් නරහා සිවිල් සමාජයට ප්‍රවිෂ්ට වන අතර එය රාජ්‍යයක් සහිත එකක් ලෙස සලකන ලදී.

සමාජ සම්මුති න්‍යායේ ප්‍රධාන කරුණයන් කිහිපයා ඉදිරිපත් කළ අදහස් වල සාරාංශයක් පහත වගුවේ දක්වේ. සිවිල් සමාජයට ප්‍රවිෂ්ට වීම සම්මුතියක් නරහා සිදුවූවා යයි පිළිගන්නා මෙම න්‍යායවාදීන් එතෙක් ක්‍රියාත්මක වූ ස්වයං පාලනය වෙනුවට ජනතා එකඟත්වය මඟින් පිහිට වූ අධිකාරී දේශපාලන ඒකකයක් තම පැවැත්ම සඳහා පිහිටුවා ගන්නා බව පෙන්වා දෙයි.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

චින්තකයා	ප්‍රකෘති සමාජයේ ස්වභාවය	සිවිල් සමාජයේ අවශ්‍යතාව	සම්මුතියේ ස්වභාවය
තෝමස් හොබ්ස්	දුක්ඛිත, කටුක, අධම මෙන්ම විනාශකාරී එකකි	ස්වභාවික සමාජයේ පැවති අනාරක්ෂිත භාවයෙන් මිදීම සඳහා	එක් සම්මුතියක් මගින් අසහාය පාලකයකු නිර්මාණය කිරීම
ජෝන් ලොක්	ස්වභාවික නීති මගින් පාලනය වූ යහපත් ජීවිතයක් ගතකිරීම	ජීවිතය, නිදහස සහ දේපල ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය වීම	සම්මුති දෙකක් මගින් අධිකාරී බලයට කොන්දේසි සහිතව යටත් වීම
රූසෝ	යහපත් ජීවිත ගතකරමින් සතුටින් ජීවත් වූ මිනිසුන්ගෙන් සමන්විත විය	මිනිසුන් හට වැඩි නිදහසක් ලුක්සිවිදීමට අවශ්‍ය වීම	එක් සම්මුතියක්; පොදු ස්වාධිපත්‍යය එනාහි පොදු කැමැත්තයි

සමාජ සම්මුතිවාදයේ ප්‍රධාන ලක්ෂණ තුනක් හඳුනාගත හැක.

- එගසීමකට හෝ උත්තරීතර නීතීන්වලට යටත් නොවූ නිදහස් සහ ස්වාධීන පිවිතයක් ගතකළ ප්‍රකෘති සමාජය
- පිවිතයේ අවශ්‍යතා ඒ තුළ ඉටුකර ගැනීමට නොහැකි වනවිට සම්මුතියක් මගින් ප්‍රකෘති සමාජයෙන් ඉවත් වීම
- එම සම්මුතියේ ප්‍රතිඵලයක් ලෙස එතෙක් පැවති ස්වභාවික නීතිය සහ අයිතිවාසිකම් වෙනුවට රාජ්‍ය නීතිය සහ සිවිල් අයිතිවාසිකම් සහිත සිවිල් සමාජය ස්ථාපිතකර ගැනීම

මෙම න්‍යායට විරුද්ධව ප්‍රධාන විවේචන කිහිපයක් ඉදිරිපත් වී තිබේ. ඒ අතර එය ඓතිහාසික නොවූ එකක් බවටත්, තාර්කිකත්වයෙන් තොර එකක් බවටත් සහ වැරදිසහගත එකක් බවටත් අදහස් ඉදිරිපත් කොට ඇත.

නිගමනය: මෙබඳු විවේචන ඉදිරිපත් වුවත් සමාජ සම්මුතිවාදයේ වැදගත්කම අවතක්සේරු කළ නොහැකි අතර එය රාජ්‍යයේ ආරම්භය සහ ස්වභාවය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ වඩා ප්‍රායෝගික එකක් වන අතර එමගින් රාජ්‍යයේ පසුකාලීන සංවර්ධනය කෙරෙහි අංශ ගණනාවකින් දායක වී ඇති මතවාදයකි.

2.iii සමාජ විකාශනයක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

අරමුණ: රාජ්‍යය යනු සමාජ විකාශනයක ප්‍රතිඵලයක් ලෙස විශ්ලේෂණය කිරීමට විභාග අපේක්ෂකයන් විසින් අන්කරගෙන ඇති දැනුම පරීක්ෂාකිරීම මෙම කොටසින් අපේක්ෂා කෙරේ.

ප්‍රවේශය: මෙම මතවාදය ඉදිරිපත් කරන්නේ විකාශනාත්මකවාදය නැතහොත් ඓතිහාසික න්‍යාය මගිනි. රාජ්‍යය යනු ස්වභාවික විකාශනයක ප්‍රතිඵලයක් ලෙසට තර්කකරන විකාශනාත්මකවාදීන් මිනිසුන් අතර නීතිය සහ සාමය පවත්වා ගනිමින් ආරක්ෂාව සලසා ගැනීම ඉන් අපේක්ෂා කරන බව පෙන්වා දෙයි.

අන්තර්ගතය: අධිකාරී බලයක් මගින් මෙහෙයවන සමාජ ක්‍රමයකින් තොරව පොදු සුභසාධනය ලබාගත නොහැකි බව විශ්වාස කරන මෙම මතවාදය සලකා බලන ප්‍රධාන කරුණු දෙකකි.

- රාජ්‍ය වනාහි කෘතිමව නිර්මාණය කරන ලද්දක් නොව ක්‍රමික විකාශනයක නැතහොත් පරිණාමයක ප්‍රතිඵලයකි
- රාජ්‍යයේ සම්භවය කරුණු රාශියක් මත පදනම් වේ.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

මෙම මතවාදය රාජ්‍යය පිළිබඳව දක්වන අදහස් පහත ආකාරයෙන් සාරාංශ කළ හැකිය.

- මිනිසා යනු සමාජ සත්වයකු වන අතර මිනිස් ඉතිහාසයේ ආරම්භයේ සිටම මිනිසුන් සමාජගතව ජීවත් වේ
- රාජ්‍යය යනු දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රමිකව සහ මන්දගාමීව සිදුවූ විකාශනයක ප්‍රතිඵලයකි
- පවුල් පදනම් කරගත් ආරම්භක සමාජයේ පදනම වූයේ ඥාතිත්වය හෝ ලේ සබඳතාවයි
- එසේ ඇරැඹී සමාජය පහත කරුණුවල බලපෑම සහිතව විකාශණය විය.
  - ස්වභාවික සමාජ සහජාසයන්
  - ඥාතිත්වය
  - ආගම
  - බලය
  - ආර්ථික කටයුතු
  - දේශපාලන සවිඥානිකත්වය

- නූතන රාජ්‍යය පහත සඳහන් අදියරයන් මඟින් විකාශනය වී ඇත.
  - ගෝත්‍ර රාජ්‍යය
  - පෙරදිග රාජධානිය
  - ග්‍රීක නගර රාජ්‍යය
  - රෝම අධිරාජ්‍යය
  - වැඩවසම් අවධිය
  - නූතන ජාතික රාජ්‍යය
  - නූතන අධිරාජ්‍යවාදය

විකාශනාත්මකවාදයේ මෙම අදහස් පොදුවේ ගෙන බලන විට රාජ්‍යය යනු දේවප්‍රසාදය මත පදනම් වූ ආයතනයක් නොවන බවත් සම්මුතියකින් නිර්මානය වූ එකක් නොවන බවත් පවුල් සංස්ථාවේ සරල සංවර්ධනයක් ප්‍රතිඵලයක් නොවන බවත් පෙනී යයි. ඒ හේතුවට රාජ්‍යය යනු ස්වභාවික විකාශනයක ප්‍රතිඵලයක් වන බවත් දේශපාලන සවිඥානිකත්වයේ ඉහලයාමට සමගාමීව ඉදිරියට පැමිණි එකක් බවත් ලේ සම්බන්ධතා රාජ්‍යයේ සංවර්ධනයට සාපේක්ෂව සම්බන්ධ වී ඇති බවත් දැකගත හැකිය.

නිගමනය: අනෙකුත් මතවාද සමඟ සසඳන විට රාජ්‍යයේ ආරම්භය සමාජ විකාශනයක ප්‍රතිඵලයක්ය යනුවෙන් ඓතිහාසික නැතහොත් විකාශනාත්මක නාහය ඉදිරිපත් කරන මතය වඩා යථාර්ථවාදී එකක් ලෙස පිළිගත හැකිවේ.

Q3 පහත දැක්වෙන ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අත්‍යවශ්‍ය මූලිකාංග

ii. ඒකීය සහ සන්ධිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතර ඇති වෙනස් කම්

iii. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වාසි සහ අවාසි

3.i ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අත්‍යාවශ්‍ය මූලිකාංග

අරමුණ: රාජ්‍ය පාලනයේ නෛතික රාමුව ලෙස සැලකෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත විය යුතුයැයි පිළිගන්නා මූලික කාරණා පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

ප්‍රවේශය: ව්‍යවස්ථාවක් යනු ලිඛිත සහ නිර්ලිඛිත මූලික නීති වලින් සමන්විත එකක් වන අතර එමඟින් පුරවැසියන්ගේ මෙන්ම දේශපාලන බලය හසුරුවන කණ්ඩායමේ ක්‍රියාකාරිත්වය පාලනය කරයි. මහාචාර්ය කේ සී වියර් දක්වන ආකාරයට ව්‍යවස්ථාවක් යනු රටක ආණ්ඩුව පාලනය කරනු ලබන, ලේඛණගත කොට ඇති නීතිමය නියමයන් සමූහයක එකතුවකි. ඒ අනුව එය පුරවැසියන්ගේ විවිධ වූ අභිනිවාසිකම් සහ චරප්‍රසාද පැහැදිලිව දක්වා ඇති, ජාතික මට්ටමේ දේශපාලන ආයතන තුළ ක්‍රියාත්මකවීමට අවශ්‍ය මූලික සුදුසුකම් නිර්ණය කොට ඇති ආණ්ඩුවේ ප්‍රධාන ආයතන සහ ඒවාට අයත් බලය පැහැදිලිව නිර්ණය කොට ඇති ලියවිල්ලකි. මේ අනුව බලන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

යනු රටක මූලික නීතියයි. ප්‍රාදේශීය, ප්‍රාන්ත සහ ජාතික ආණ්ඩුවල නීති අතිබවා මූලිකස්ථානය ගන්නේ ව්‍යවස්ථාවයි. ආණ්ඩුවේ සංවිධානය හෝ ව්‍යුහය තීරණය කරන, ආණ්ඩු අංශයන අතර බලතල බෙදා දෙනු ලබන සහ එම අංශයන අතර සම්බන්ධය තීරණය කරන මූලික නීති වලින් සමන්විත එකක් ව්‍යවස්ථාව බලස මේ අනුව හඳුනා ගත හැකි වේ.

අන්තර්ගතය: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ස්වභාවය ද්විපාර්ශ්වීකාර වේ.

1. එය උත්තරිතර නීතිය නැතහොත් මූලික නීතිය ලෙස සැලකේ. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:
   - ආණ්ඩුවක් නිර්මාණය කිරීමේ ඒකායන පඥප්තිය වේ.
   - සියලු පුරවැසියන් සහ ආණ්ඩුවේ සෑම ඒකකයක් ම එකට එක්කරනු ලබන බැමීම වේ.
   - අවසාන නීතිය මෙන්ම අනෙකුත් නීති වලට නෛතික පදනම ලබාදේ.
   - ආණ්ඩුවේ නිලධාරීන් විසින් තම කාර්යයන්වල නෛතිකත්වය තීරණය කිරීමට යොදාගන්නා ලේඛනය වේ.

2. එමඟින් ආණ්ඩුවේ පදනම් මූලධර්ම මෙන්ම එය ක්‍රියාකළ යුතු ක්ෂේත්‍රයේ රාමුව ස්ථාපිත කරයි. ඒ අනුව ව්‍යවස්ථාව:
   - ආණ්ඩුක්‍රමයේ ස්ථිර රාමුව විස්තර කරන අතර ආණ්ඩුවේ විවිධ දෙපාර්තමේන්තු හා ආයතන වලට අයත් බලතල සහ කාර්යයන් නිර්ණය කරයි.
   - ආණ්ඩුව නිර්මාණය කොට ඇති සමහර මූලික මූලධර්ම නිර්ණය කරයි
   - රාජ්‍යයේ බලයට එදිරිව පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කොට සුරක්ෂිත කිරීමට අවශ්‍ය විධිවිධාන සලසා දෙයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පැවතිය යුතු අත්‍යාවශ්‍ය මූලිකාංග සම්බන්ධයෙන් විශේෂිත වශයෙන් පිළිගන්නා පොදු එකඟත්වයක් නොමැත. ව්‍යවස්ථාවේ ස්වභාවය එහි අන්තර්ගතය මෙන්ම එය සංශෝධනය කරන්නේ කෙසේද යනාදී කාරණා සම්බන්ධයෙන් සහමතික අදහස් නොමැතිවාක් මෙන්ම ඒ ඒ සමාජ දේශපාලන සන්දර්භයට අනුව ඒවා වෙනස්වන ආකාරය නිරීක්ෂණය කළහැක. නිදසුන් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් විය යුතු දෑ ලෙස ආගම සහ භාෂාව හඳුනා ගැනීමට කොටසක් ක්‍රියාකරන අතර තවත් කොටසක් පරිසරය සහ වනාන්තර ආරක්ෂණය මෙන්ම දූෂණ විරෝධී ක්‍රියාමාර්ගද ව්‍යවස්ථාවට ඇතුලත් විය යුතු බවට තර්ක කරති. කෙසේ වෙතත් වඩා හොඳ යැයි පිළිගන්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්හි දැකගතහැකි මූලිකාංග කිහිපයක් දේශපාලන විද්‍යාඥයින් විසින් පෙන්වා දී ඇත. මහාචාර්ය රූත් ගැවිසන්ට අනුව එවැනි මූලිකාංග කාණ්ඩ 3ක් තිබේ.

a. මූලික ආණ්ඩු ව්‍යුහයන් සහ ආණ්ඩුවේ බලතල සහ කාර්යයන් අතර ඇති සම්බන්ධකාරී විදහා පෙන්වීම
b. රාජ්‍යයේ ස්වභාවය සම්බන්ධයෙන් ඇති ඇගයුම් සහ වගකීම් නිරූපනය කිරීම
c. පුරවැසි අයිතිවාසිකම්වල ස්වරූපය විදහා දැක්වීම

කෙසේ වෙතත් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල පොදුවේ ප්‍රකාශිත මූලිකාංග කිහිපයක් පහත ආකාරයට පෙන්වා දිය හැකි වේ.

- පැහැදිලි සහ යථාතථ්‍ය එකක් වීම
  මින් අදහස් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අත්‍යාවශ්‍යයෙන්ම නොපැහැදිලිකමින්, මකමේදෘත්මක බවින් සහ සැකසහිත බවින් නිදහස් විය යුතු බවය.

- විස්තීර්ණ එකක් වීම
  ආණ්ඩුවේ බලය සහ එහි සීමාවන් මෙන්ම පුරවැසි අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව පැහැදිලි අගපෙන්වීමක් කිරීමට තම ව්‍යවස්ථාවක් සෑම විටම විස්තීර්ණ එකක් විය යුතු බව මින් අදහස් වේ.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- අසීමිත වූ විස්තරාත්මක එකක් නොවීම
  ව්‍යවස්ථාවක් පැහැදිලි, යථාතථ්‍ය මෙන්ම විස්තීර්ණ එකක් විය අත්‍යාවශ්‍ය ලෙස පිළිගනු ලැබුවද අනවශ්‍ය විස්තර වීට එක්කොට දීර්ඝ සහ විස්තරාත්මක එකක් නොකළ යුතුයැයි පොදු එකඟත්වයක් පවතී.

- ස්ථාවර සහ නම්‍ය එකක් වීම
  මෙනස් වන සමාජ, ආර්ථික තත්ත්වයන්ට අනුරූපීව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යාවත්කාලීන කිරීමට එය නම්‍ය ස්වභාවයක් ගත යුතු බව අවිවාදාත්මක කරුණුයක් වුවත් එය දේශපාලන නිලධාරීන්ගේ අවශ්‍යතා සහ සිතැඟියාවන්ට අනුව වෙනස් කිරීමට සහ සංශෝධනය කිරීමට ඇති ඉඩකඩ අවම කිරීම කරණා ව්‍යවස්ථාව ස්ථාවර එකක් බව පිළිබිඹු වීම මෙහි දී අපේක්ෂා කෙරේ.

- ලිඛිත වීම
  ව්‍යවස්ථාවක් ලේඛණගත වී පැවතීම එසේ නොමැති තත්වයන් තුළ ඇතිවන මතභේදාත්මක තත්වයන් අවම මට්ටමක පවත්වා ගැනීමට උපකාරී වේ.
- මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් ඇතුලත් කොට තිබීම
  මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් සියල්ල ව්‍යවස්ථාවකට ඇතුලත් වීය යනු අතරම එවා බුක්තිවිඳීමේ රාමුව මෙන්ම උල්ලංඝනය වුවහොත් ගතහැකි ක්‍රියාමාර්ගද විදහා පෙන්විය යුතුය.

- ආණ්ඩුවේ බලය සීමා කොට තිබීම
  හුදෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පැවැත්ම මගින් ආණ්ඩුවේ බලය සීමාවනවාය යන්න පිළිගත නොහැකි අතර ව්‍යවස්ථාව මගින් පැහැදිලි ලෙස ආණ්ඩුවේ බලය සීමා කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැකසිය යුතු වේ. එක් අතකින් ආණ්ඩුව සහ එහි පරිවාර ආයතන රාජ්‍ය බලය තම හස්තයට පේක්ෂාකර ගැනීම වැලැක්වීමටත්, රාජ්‍ය නිලධාරීන් හිතුවක්කාරී ලෙස පුරවැසි අයිතීන් උල්ලංඝනය කිරීම වැලැක්වීමටත්, ආණ්ඩු බලය සීමා කිරීමේ විධිවිධාන සැකසීම අවශ්‍ය වේ. එවැනි විධිවිධාන අතර සංචරණය සහ කුළුනය, බලතල බෙදීම සහ විමධ්‍යගතකරණය, අධිකරණමය ක්‍රියාමාර්ග සහ වෙනත් ව්‍යවස්ථා අංග වැදගත් කොට සැලකේ.

- රාජ්‍යයේ ප්‍රායෝගික පරාර්තය සමඟ අනුරූපී වීම
  ව්‍යවස්ථාව රටේ ජනතාවගේ අපේක්ෂාවන් බලාපොරොත්තු සහ පොදු පිළිගැනීම් වලට සේවය කරන එකක් විය යුතු බව මින් දහස් වේ, එසේ නොමැති විටෙක ජනතාව විප්ලවීය ක්‍රියාමාර්ගවලට යොමුවීමේ ඉඩකඩ ඉහල යා හැකිය.

- ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ ක්‍රියා පිළිවෙත.

නිගමනය: ඉහතින් දැක්වෙන්නේ නුතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අත්‍යාවශ්‍ය මූලිකාංග කිහිපයක් වන අතර ඒවායේ සංඛ්‍යාව සහ ස්වභාවය සම්බන්ධව පොදු එකඟතාවයක් නිරීක්ෂණය කළ හැකි නොවේ. ව්‍යවස්ථාවක් යනු රටේ මූලික නීතිය වන අතර රාජ්‍ය පාලනය උදෙසා අවශ්‍ය නෛතික විධිවිධාන ඉන් පිළිබිඹුවීම අවශ්‍යය. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහය නූතන ලෝකයේ පිළිගත් ප්‍රධානතම පාලන ආකාරය බැවින් එම මූලධර්ම මනාව විද්‍යමානවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නූතන දේශපාලන කථිකාවේ කේන්ද්‍රය බවට පත්ව ඇත.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

3.ii. ඒකීය සහ සන්ධිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතර ඇති වෙනස්කම්

අරමුණ: බලතල බෙදීමේ ආකාරය සහ එහි ස්වභාවය අනුව සිදුකරන බොහෝවිට ප්‍රායෝගික යැයි විශ්වාස කරන ඒකීය සහ සන්ධිය ආණ්ඩුක්‍රම වර්ගීකරණයේ මූලික ලක්ෂණ සම්බන්ධ විභාග අපේක්ෂකයාගේ අවබෝධය මැනබැලීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

ප්‍රවේශය: විශාල භූමියක් එසා රාජ්‍යය ව්‍යාප්තවන විට සිරස් අතට බලය බෙදීම අවශ්‍යතාවයක් බවට පත් වේ. රාජ්‍යයේ විශාලත්වය, භූගෝලීය ස්වභාවය, සංස්කෘතික විවිධත්වය සහ සන්නිවේදනයේ අපහසුතා ආදී කාරණා මත මේ ආකාර රාජ්‍ය බලය සිරස් අතර බෙදීමේ ස්වරූපය වෙනස් වේ. ඒ අනුව ඒකීය ආණ්ඩු, සන්ධිය සහ සහසන්ධිය වශයෙන් විවිධ ආකාරයෙන් බලතල බෙදී ඇති ආකාරය අනුව රාජ්‍යයන් වර්ගීකරණය කරනු ලැබේ.

අන්තර්ගතය: ඒකීය රාජ්‍යයක් යනු සියලු ස්වාධිපත්‍ය බලතල මධ්‍යම හෝ ජාතික ආණ්ඩුව වෙත පිහිටා ඇති රාජ්‍යය වේ. මෙම රාජ්‍යයන් වල පලාත්, ප්‍රාදේශීය වැනි ආණ්ඩුවේ කුඩා ඒකක ක්‍රියාත්මක වුවත් ඒවා සතුව ස්වාධීන තීරණ නිර්මාණයට අවශ්‍ය අධිකාරීත්වයක් නොමැත. මෙම ආයතන වෙත මධ්‍යම ආණ්ඩුවේ කිසියම් බලයක් පැවරීමට මධ්‍යම ආණ්ඩුවට හැකියාව ඇති අතර ඒවා මධ්‍ය ව්‍යවස්ථාදායකයේ සම්මත අනපනත් මඟින් සිදු කරනු ලැබේ. අවශ්‍ය කිසියම් අවස්ථාවක ඒවා නැවත පවරා ගැනීමට මධ්‍යම ආණ්ඩුවට හැකි වන්නේ එම බලය පැවරීම ව්‍යවස්ථාවෙන් සිදුකොට නොමැති නිසාය. ඒකීය ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථාදායකය යනු සමස්ථ රාජ්‍යයටම නීති සම්පාදනය කිරීමේ උත්තරීතර ආයතනය වේ.

ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ:

- කැනී මධ්‍යම ආණ්ඩුව තුළ බලය සහ අධිකාරීත්වය පිහිටා තිබීම සහ උපජාතික ආණ්ඩු සහ අනෙක් ප්‍රාදේශීය ඒකක ස්වාධීන දේශපාලන බලයක් නිම් නොවීම
- ආණ්ඩුවේ ප්‍රාදේශීය සහ කලාපීය ඒකක මධ්‍යය මඟින් පැවරූ බලය සහ අධිකාරිය ක්‍රියාවට නැංවීම
- මධ්‍යම ආණ්ඩුවට කිසිදු මොහොතක ප්‍රාදේශීය ඒකක වල සීමාවන් ඉවත් කිරීමට හෝ වෙනස් කිරීමට කටයුතු කළ හැකි වීම
- මධ්‍යම ආණ්ඩුවේ ක්‍රියාවන් සහ ප්‍රතිපත්ති මඟින් උප ජාතික මට්ටමේ ක්‍රියාවන් සහ ප්‍රතිපත්ති පාලනය කිරීමට හෝ බලරහිත කිරීමට හැකිවීම

ෆෙඩරල් යන පදය ලතින් භාෂාවෙන් බිහි වූ ඒකක් වන අතර එහි අර්ථය ඔක්සත් මණ්ඩලය යන්නය. සන්ධිය ආණ්ඩුවක් යනු අඩුම වශයෙන් ආකාර දෙකක පැවැත්ම සහිත එකකි. ආණ්ඩුවේ බලය ජාතික ආණ්ඩුව සහ ව්‍යවස්ථානුගත ඒකක අතර බෙදා හැර ඇත. මහාචාර්ය කේ සී වියර් දක්වන ආකාරයට ආණ්ඩුවේ බලය සමස්ථ රට පෙනුමෙන් ආණ්ඩුවක් වෙත සහ රාජ්‍යයේ කොටස් වෙනුවෙන් ආණ්ඩු කිහිපයක් අතර බෙදී ඇත. තම සීමාව තුළ මෙම ආණ්ඩු තෛතික වශයෙන් ස්වාධීන වේ. එකක් අනෙකට යටත් නොවන අතර ඒවා සම්බන්ධීකරණය කෙරේ. මේ ආකාර බලය බෙදීමක් සිදුවන්නේ ව්‍යවස්ථාවෙනි. සන්ධිය ක්‍රමයක පහත සඳහන් ලක්ෂණ අන්තර්ගත වේ.

- මට්ටම් දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වීම
- මධ්‍යය සහ ප්‍රාන්ත අතර ව්‍යවස්ථාවෙන්ම බලබෙදීමක් පැවතීම
- ව්‍යවස්ථාව උත්තරීතර නීතිය ලෙස පිළිගැනීම
- අධිකරණ විවරණ බලය සහිත සුප්‍රීම් උසාවියක ක්‍රියාකාරීත්වය

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

www.AlevelApi.com

ඒකීය සහ සන්ධීය ආණ්ඩු අතර ඇති වෙනස්කම් පහත ආකාරයට සාරාංශ කොට දැක්විය හැකිය.

ඒකීය ආණ්ඩු	සන්ධීය/ෆෙඩරල් ආණ්ඩු
• එකට ඒකාබද්ධ වූ ආයතන සහිත එක් ආණ්ඩුවක පැවැත්ම	• මට්ටම් දෙකක ආණ්ඩු පවතින අතර බලය මධ්‍යම හා ප්‍රාන්ත අතර බෙදා තිබේ.
• දේශපාලන බේදීම් යනු ආණ්ඩුවේම වෙන්කළ නොහැකි කොටස්වීම	• ප්‍රාන්ත ආණ්ඩුවලට හිමි කාර්යයන් සම්බන්ධ පූර්ණ බලයක් බුක්ති විඳී.
• මධ්‍යම ආණ්ඩුව යනු දේශපාලනික බේදීම්වල නිර්මාපකයා වන අතර පලාත් යනු එහි යටත් ඒකක වේ.	• මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු වල ස්වභාවය සහ පැවැත්ම තීරණය කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි
• ප්‍රාදේශීය හෝ පලාත් ඒකක සම්බන්ධ නියෝග නිකුත් කිරීම තම කැමැත්ත මත සිදුකළ හැකි අතර ඒවායේ බලය අඩු වැඩි කිරීමටත් ඒවා විසුරුවා හැරීමටත් නව ඒකක පිහිටුවීමටත් බලය ඇත්තේ මධ්‍යම ආණ්ඩුවටය.	• මධ්‍යම හෝ ෆෙඩරල් ආණ්ඩුව ප්‍රාන්ත ආණ්ඩු සමග හතුදෙණු කළ යුත්තේ ව්‍යවස්ථානුකූල විධිවිධාන වලට අනුකූලවය
• මධ්‍ය මට්ටමේ ඇති විධායක ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලය සම්බන්ධ උත්තරීතර බලය	• සියලු බලකළ මධ්‍යම ආණ්ඩුවට හිමි නොවන අතර සෑම ප්‍රාන්ත ආණ්ඩුවකම ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ යන ආයතන පද්ධතියක් ද වේ.
• ආණ්ඩුව ඉහා මධ්‍යගතවන අතර සියලු තීරණ ගනු ලබන්නේ මධ්‍යය විසිනි.	• ව්‍යවස්ථා රාමුව තුළ විමධ්‍යගතකොට ඇති බලය නිදහස්ව බුක්තිවිඳීමට ප්‍රාන්ත වලට හැකියාව ඇත.
• එක්සත් බව ආරක්ෂා කළ හැකිවේ	• විවිධත්වය සහ එක්සත් බව අතර සාංගමික ස්වරූපයක් දිස්වේ.
• පොදුවේ කුඩා රාජ්‍යයන්ට වඩාත් යෝග්‍ය වේ.	• සාපේක්ෂව විශාල ජනගහනයක් සහ භූමියක් සහිත රටවලට වඩාත් යෝග්‍ය වේ
• සන්ධීය ක්‍රමයට සාපේක්ෂව ආණ්ඩුවේ වියදම් පහළ මට්ටමක පවතී.	• කාණ්ඩ දෙකක ආණ්ඩු සහිත නිසා ආණ්ඩුවේ වියදම් සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී
• මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතර බව නිසා ප්‍රාදේශීය ඒකක සමග ඇතිවිය හැකි ගැටුම් අවම වේ.	• මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතරත් ප්‍රාන්ත ආණ්ඩු අතරමත් ඇතිවන ගැටුම් නිරාකරණය කිරීම ෆෙඩරල් නැහෙහොත් සුප්‍රීම් උසාවිය මගින් සිදු කරයි.
• ආණ්ඩු යාන්ත්‍රණය සරල සහ නම්‍ය ස්වරූපයක් ගනී.	• ආණ්ඩු යාන්ත්‍රනය සංකීර්ණ මෙන්ම අනම්‍ය ස්වරූපයක් ගනී.
• ස්ථාවරත්වය සහ ජාතික සමගිය පවත්වාගෙන යාමට යෝග්‍ය වේ.	• ස්ථාවරත්වය සහ ජාතික සහජීවනය ලඟාකරගැනීම සාපේක්ෂව අපහසු වේ
• මධ්‍යයේ කාර්යයන් විශාල ප්‍රමාණයක් පවතින බැවින් සමහර කලාතිය ඒකක නොසලකා හැරීමේ ඉඩකඩ පවතී.	• විමධ්‍යගතකරණය හරහා බලකළ බෙදා ඇති බැවින් මධ්‍යම ආණ්ඩුවේ කාර්යභාරය සාපේක්ෂව සීමා වේ
• ප්‍රාදේශීය ප්‍රාරම්භනයන් අධෛර්යමත් වන අතර ප්‍රාදේශීය ජනතා ආශාවන් හා අපේක්ෂාවන් යටපත් වීමට ඉඩකඩ පවතී	• ප්‍රාදේශීය ප්‍රාරම්භනය දිරිමත් කරයි
• සර්වාධිකාරී පලනයක් බිහිවීමට ඇති ඉඩකඩ ඉහළ මට්ටමක පවතී	• මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු ව්‍යවස්ථා මූලධර්ම මගින් බැඳ ඇති බැවින් සර්වාධිකාරීත්වයක් වර්ධනය වීමට ඇති ඉඩකඩ අවම මට්ටමක පවතී

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

නිගමනය: පොදුවේ ගත්විට සන්ධිය ක්‍රමවල දකිය හැකි ප්‍රවනතාව වන්නේ විවිධ ජනකොටස් තම ස්වාධීනත්වය පවත්වාගෙන යාමට අවශ්‍ය ස්වයං පාලනය වෙනුවෙන් අරගල කරන කත්වයක් තිබියදීත් මධ්‍යම ආණ්ඩුව සතු බලතල ක්‍රමයෙන් ප්‍රසාරණ කිරීමට බලයේ සිටින ආණ්ඩු ක්‍රියා කිරීමය.

3.iii. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වාසි සහ අවාසි

අරමුණ: විවිධ ආණ්ඩු ආකෘති අතුරින් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ඇති වාසි සහ අවාසි පිළිබඳව සිසුන්ගේ අවබෝධය පරීක්ෂා කිරීම මෙම කොටසින් අපේක්ෂා කෙරේ.

ප්‍රවේශය: ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර සම්බන්ධතාව පදනම් කරගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ප්‍රධාන වර්ග දෙකක් හඳුනා ගතහැකි අතර පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ඉන් එකකි. ව්‍යවස්ථාදායකය හා විධායකය ඒකාබද්ධ වූ ආණ්ඩුක්‍රමය වන මෙය මහා බ්‍රිතාන්‍යය, ඉන්දියාව, මැලේසියාව, කැනඩාව, ඔස්ට්‍රේලියාව වැනි රටවල ක්‍රියාත්මක වේ. මෙම ක්‍රමයේ ඇති විශේෂ ලක්ෂණයක් වන්නේ ප්‍රධාන විධායකය ජනතාවගේ සෘජු ඡන්දයෙන් තෝරාපත් කර නොගැනීමය. ජනතාව තම ඡන්දයෙන් නියෝජිතයන් පත් කරන්නේ ව්‍යවස්ථාදායකට වන අතර අගමැති ලෙස බොහෝවිට හඳුනාගන්නා ප්‍රධාන දේශපාලන විධායකය එම නියෝජිතයන් අතරින් තෝරා ගනී. ආණ්ඩුවේ ඇමතිවරුන් තෝරාගැනීම සිදුකරන්නේ අගමැති විසිනි.

අන්තර්ගතය: පාර්ලිමේන්තු ක්‍රමයේ මූලික ලක්ෂණ කිහිපයකි.

- විධායකය නාමික සහ දේශපාලන ලෙසයෙන් කොටස් දෙකකින් යුක්ත වීම.
- රාජ්‍ය නායකයා විසින් ආණ්ඩුවේ නායකයා පත්කිරීම.
- බලය ප්‍රකාශිත වීමේ මූලධර්මය මත පදනම් වීම.
- අමාත්‍යවරුන් බොහෝවිට පාර්ලිමේන්තු නියෝජිතයන් වීම.
- ආණ්ඩුවේ නායකයා විසින් රාජ්‍ය නායකයාට කරන උපදෙස් දීම මගින් ව්‍යවස්ථාදායකය වීසුරුවා හැරීම.
- ආණ්ඩුව සාමූහික මණ්ඩලයක් වන අතර එහි සියලු සාමාජිකයන් සාමූහික වගකීමට යටත් වීම.
- ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් ඡන්ද කොට්ඨාස පදනමින් තෝරා පත්කරගන්නා බැවින් ජනාධිපතික්‍රමයට සාපේක්ෂව ජාතික පදනම නියෝජනය නොකිරීමේ අවධානමක් පවතී.

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වාසි

i. ව්‍යවස්ථාදායකය සහ විධායකය එකම මැතිවරණයෙකින් තේරීපත්වන නිසාත් ව්‍යවස්ථාදායකය නියෝජනය කරන නිසාත් එම ආයතන දෙක අතර සහජීවන සුහිබන්ධතාවක් පවත්වාගෙන යාමට ඇති හැකියාව ඉහළ මට්ටමක පැවතීම.

ii. ඡායා කැබිනට් මණ්ඩලයක් ලෙස විරුද්ධ පක්ෂය ක්‍රියාකරන නිසා වගකීම් සහගත ආණ්ඩුවක් පවත්වාගෙන යාමට ඇති ඉහළ මට්ටමක පැවතීම.

iii. පාර්ලිමේන්තුවේ විශ්වාසය පවතිනතාක් පමණක් දේශපාලන විධායකයට පැවැත්මක් ඇති අතර යම් හෙයකින් විශ්වාසය නිදවැටුනහොත් ආණ්ඩු වෙනස්කිරීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතීම.

iv. නායකත්ව කුසලතා සහිත විධායකයක් සඳහා ඇති ඉඩ ප්‍රස්ථා වැඩිවීම.

v. ආණ්ඩුවේ නායකත්වය සහ රාජ්‍යයේ නායකත්වය වෙන්ව පැවතීම.

vi. ප්‍රතිපත්ති සම්පාදනය සහ ඒ ආශ්‍රිත කාර්යයන් කාර්යක්ෂමව සිදුකිරීමට හැකි වීම.

vii. ජනතා වගවීම ඉහළ මට්ටමක පැවතීම.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ අවාසි

i. ව්‍යවස්ථාදායක හා විධායක බලතල එක් ආයතනයට සංකේන්ද්‍රණය වීම
ii. ආණ්ඩුවේ ස්ථාවරත්වය පිළිබඳ පවතින අවිනිශ්චිතභාව
iii. පහළ සලකාබැලීම් මත කැබිනට් මණ්ඩලය පත්කරන බැවින් අන්දැකීම් අඩු පුද්ගලයන්ගේ ග්‍රහණයට දේශපාලන විධායකය යටත් වීමට ඇති ඉඩකඩ
iv. බහුතර දේශපාලන පක්ෂයේ හෝ සන්ධානයේ ආධිපත්‍යයක් ඇතිවීමට ඇති ඉඩකඩ
v. කැබිනට් මණ්ඩල ආඥාදායකත්වයක් වර්ධනය වීමට පවතින හැකියාව

නිගමනය: පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ යහපත් සහ අයහපත් ලක්ෂණ කිහිපයක් ඉහත ආකාරයට පෙන්වා දිය හැකි මුත් පොදු මතය වන්නේ එය කාර්යක්ෂම බවින් අඩුවුන් ප්‍රජාතන්ත්‍රවාදී බවින් ඉහල වන බවය. මෙම ක්‍රමයේ ඇති වාසි සහ අවාසි තීරණය වන්නේ එය ක්‍රියාත්මක වන දේශපාලන ක්‍රමය රඳා පවතින දේශපාලන සංස්කෘතියේ සංවර්ධන මට්ටම අනුවය.

Q4.පහත දැක්වෙන ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

i. ඕස්ට්‍රේලියා කැබිනට් ක්‍රමයේ විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතා
ii. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති තෝරා පත්කිරීමේ ක්‍රියාදාමය
iii. ඉන්දියාවේ සන්සිය ක්‍රමයේ මූලිකාංග

4.i. ඕස්ට්‍රේලියා කැබිනට් ක්‍රමයේ විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතා

අරමුණ: පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ කිඹිරිගෙය ලෙස සලකන එක්සත් රාජධානියේ අද දක්වා ක්‍රියාත්මකවන පාර්ලිමේන්තු කැබිනට් ක්‍රමයේ නීති සම්පාදන ආයතනය වන පාර්ලිමේන්තුව සහ නීති විධානය කරන ආයතනය වන අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය විශ්ලේෂණය කිරීමට විභාග අපේක්ෂකයන් සතු හැකියාව පරීක්ෂා කිරීම මෙම කොටසේ ඉලක්කයයි.

ප්‍රවේශය : බ්‍රිතාන්‍යයේ දේශපාලන ක්‍රමය තුළ විධායකය ලෙස සලකන්නේ අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයයි. ව්‍යවස්ථාදායකය ලෙස සලකන්නේ පාර්ලිමේන්තුවයි. මෙය ද්වි මාණ්ඩලික ආයතනයක් වන අතර සාමී මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යන ආයතන දෙකකි. විධායක හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතා පහත සඳහන් ආකාර වේ.

(අ). ව්‍යවස්ථාදායකය තුළින් විධායකය පත්වීම

පාර්ලිමේන්තුවට නියෝජිතයින් තෝරාපත් කර ගැනීම සඳහා පවත්වන මහා මැතිවරණයකිදී වැඩිම ආසන සංඛ්‍යාවක් දිනාගත් පක්ෂයේ නායකයා සම්ප්‍රදායානුකූලව රජු හෝ රැජිනා විසින් අගමැති තනතුරට පත් කරනු ලැබේ. එසේ පත් කරන නැනැත්තා මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතුයැයි නියමයක් නැත. නමුත් 1902 වර්ෂයෙන් පසුව සාමී මන්ත්‍රී මණ්ඩලයෙන් අගමැතිවරයකු පත් වී නැත. අවසාන වතාවට සාමී මන්ත්‍රී මණ්ඩලයෙන් පත් වූ අගමැතිවරයා වූයේ **Robert Gascoyne** (1895 – 1902) ය. එම නිසා වර්තමානයේ අගමැතිවරයා මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් පත්විය යුතුයැයි සම්ප්‍රදායක් ගොඩනැඟී ඇත.

(ආ). ව්‍යවස්ථාදායකය තුළින් සෙසු කැබිනට් ඇමතිවරු පත් කිරීම

කැබිනට් මණ්ඩලයේ සෙසු සාමාජිකයින් අගමැතිගේ උපදෙස් පරිදි රජු/රැජින විසින් පත් කරන්නේ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින් අතරිනි. එහිදී මුදල් අමාත්‍යවරයා අනිවාර්යයෙන්ම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සමාජිකයකු විය යුතු අතර අධිකරණ ඇමතිවරයා සාමී මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු ය.

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ඇ). විධායකයට අවශ්‍ය නීති අනුමත කරවීම

ව්‍යවස්ථාදායකය විසින් කරනු ලබන්නේ විධායකයට අවශ්‍ය නීති විධායකය විසින් ව්‍යවස්ථාදායකය වෙත ඉදිරිපත් කළ පසු ඒවාට අනුමැතිය ලබා දීම ඔව සම්ප්‍රදායක මහයයි. ව්‍යවස්ථාදායකයේ බහුතරය මහබවත පක්ෂයේ නායකත්වය විධායකය ලෙස කටයුතු කරන හෙයින් මෙම කාර්යය ඉටුකරගත හැකි වී තිබේ. ඒ අනුව වර්තමානයේ ව්‍යවස්ථාදායකය විසින් අනුමත කරන පනත්වලින් 95% කටත් වඩා විධායකය විසින් ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් ය. ඉතිරිය ද විධායකයේ කැමැත්ත නැතිව අනුමත කරවා ගත නොහැකි ය.

(ඈ). විධායකය ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකීමට බැඳී සිටීම.

විධායකය ව්‍යවස්ථාදායකයට වගකීම යනුවෙන් අදහස් කරන්නේ දේශපාලන හේතු මත විධායකය ඉවත් කිරීමේ හැකියාව ව්‍යවස්ථාදායකය වෙත පැවරීම ය. මෙහිදී දේශපාලන හේතු යනුවෙන් අදහස් කරන්නේ

- රාජාසන කථාව පරාජය කිරීම
- වාර්ෂික අයවැය ලේඛණය පරාජය කිරීම
- විශ්වාසභංග යෝජනාවකින් ආණ්ඩුව පරාජය කිරීම ය,

එහෙත් බ්‍රිතාන්‍යයේ පක්ෂ දේශපාලනය තහවුරු වී ඇති පසුබිමක නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයක සහාය සහිත පක්ෂයකින් පත්වන ආණ්ඩුවක් ඉහත සඳහන් ක්‍රියාමාර්ග මඟින් පරාජයට පත්කළ නොහැක. 1909 දී අයවැය පරාජය කිරීමෙන් පසු (එයද සිදුකළේ හාමි මන්ත්‍රී මණ්ඩලය විසිනි. වර්තමානයේ එම බලතල සාමී මන්ත්‍රී මණ්ඩලයට අහිමිකර ඇත) ඉහත සඳහන් ක්‍රියාමාර්ග උපයෝගී කරගෙන ආණ්ඩු පෙරලා දමීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය කටයුතු කර නැත.

(ඉ). විධායකය විසින් ව්‍යවස්ථාදායකයේ පැවැත්ම තීරණය කිරීම

අගමැතිවරයාට තමන් කැමති කිනෑම අවස්ථාවක ව්‍යවස්ථාදායකය විසුරුවා හරින ලෙස රජු හෝ රැජින වෙත උපදෙස් දිය හැකි ය. එවිට ඔහු නෝ ඇය පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබේ. ව්‍යවස්ථාදායකය තමන්ට අවශ්‍ය නැතැයි හැඟී ගිය විට එය විසුරුවා හරින ලෙස රජුට නෝ රැජිනට දැනුම් දීමට අගමැතිවරයා කටයුතු කරයි. එත්මන් අගමැතිනී තෙරේසා මේ විසින් 2015 මැතිවරණයෙන් පසු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ආයුකාලය තවත් වසර කුනක් ඉතිරිව තිබිය දී 2017 දී විසුරුවා හැරීම මෙයට කදිම නිදසුන වේ.

නිගමනය: මේ ආකාරයෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි විධායකය සහ ව්‍යවස්ථාදායක අතර සෘජු හා සමීප සම්බන්ධතාවක් පවතින අතර කැබිනට් ආණ්ඩුක්‍රමයක පවතින මූලික ස්වභාවය මෙය වේ.

4.ii. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ඡෝරා පත්කිරීමේ ක්‍රියාදාමය

අරමුණ: ලෝකයේ දියුණු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් වන එක්සත් ජනපදයේ ජනාධිපතිවරණ ක්‍රියාවලිය පිළිබඳව විභාග අපේක්ෂකයා තුළ පවතින දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

ප්‍රවේශය: ජනාධිපතිවරණය එක්සත් ජනපද දේශපාලන ක්‍රමයෙහි වඩාත් කැපී පෙනෙන සංසිද්ධිය වශයෙන් හැඳින්වීමට පුළුවන. ජනාධිපතිවරණය විදහාන් වන්නේ ජාතික වශයෙන් පමණක් නොව එය අන්තර් ජාතික වශයෙන් ද ඉමහත් වැදගත්කමක් දරයි. මක්නිසාදයත් එය අන්තර්ජාතික නායකයා තෝරා පත්කරන මැතිවරණය වන බැවිනි. ලෝකයේ අන් කිසිදු දේශපාලන ක්‍රමයක දක්නට නොලැබෙන ආකාරයෙන් ඉතා සංකීර්ණ වූත්, දීර්ඝතම වූත්, අතිවියාල ධන සම්භාරයක් වැය කෙරෙන මැතිවරණය මෙය වේ. එහෙත් මෙය පුරාල් ජන සහභාගිත්වයකින් සිදුවන මැතිවරණ ක්‍රියාවලියක් නොවීම ද කැපී පෙනෙයි.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

අන්තර්ගතය: ව්‍යවස්ථානුකූලව සලකා බලන කළ මහජන ඡන්දයෙන් තොව ඡන්ද විද්‍යාලයක් (Electoral College) තුළින් සිදුකරන්නකි. එහෙත් වර්තමානයේ දී ජනාධිපතිවරයා තෝරා පත්කරන්නේ මහජන ඡන්දයෙනි. එය කෙලින් මහජන ඡන්දයක් නොව වක්‍ර මහජන ඡන්දයකි. වර්තමානයේදී පවා ඡන්ද විද්‍යාලයෙන් ජනාධිපති තෝරාපත් කළ ද එම ඡන්ද විද්‍යාලයේ සමාජිකයින් තෝරා පත්කරන්නේ මහජන ඡන්දයෙනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපති ධුරයේ නිලකාලය වසර 04 ක් වේ. ජනාධිපති ධුර අපේක්ෂකයකු එක්සත් ජනපදයේ ස්වභාවික උපත ලද, වයස අවුරුදු 35 ඉක්ම වූ, අවුරුදු 14 එක්සත් ජනපදයේ පුරවැසියකු විය යුතු ය. ජනාධිපති ධුරයට තේරී පත්වීමේ වාර ගණන 02 කි. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22 සංශෝධනයට අනුව)

එක්සත් ජනපදයේ ජනාධිපති මැතිවරණ ක්‍රියාවලිය ආරම්භ්ත්තේ ජනාධිපතිවරණයට වසරකට හෝ වසර එකහමාරකට පූර්වයෙනි. මෙහිදී සමූහාණ්ඩුවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී යන පක්ෂ දෙකෙහි භූමිකාව වඩාත් ප්‍රධාන වේ. මේ අනුව ජනාධිපති මැතිවරණ ව්‍යාපාරය ඇරඹෙන්නේ ප්‍රධාන පක්ෂ දෙක විසින් එම පක්ෂවල ජනාධිපති අපේක්ෂකයා සහ උප ජනාධිපති අපේක්ෂකයා තෝරා පත්කර ගැනීමට මූල පූරන අවස්ථාවේදී පටන් ය. අනෙකුත් දේශපාලන පක්ෂවලින් මෙන්ම ස්වාධීනව ඉදිරිපත්වන ජනාධිපති අපේක්ෂකයින් ජනාධිපතිවරණ ක්‍රියාදාමය තුළ එතරම් වැදගත් කමක් උසුලන්නේ නැත.

ප්‍රධාන පක්ෂ දෙක විසින් එම පක්ෂවල ජනාධිපති අපේක්ෂකයා සහ උප ජනාධිපති අපේක්ෂකයා තෝරා ගැනීම සඳහා පක්ෂ සම්මේලන පවත්වනු ලැබේ. ප්‍රධාන පක්ෂ දෙක ඒවායේ ජාතික පක්ෂ සම්මේලනවලට සහභාගිවන පක්ෂ නියෝජිතයින් තෝරා ගැනීම සිදුකරන්නේ ප්‍රාන්ත නීතිවලට අනුකූලව සහ ජාතික මට්ටමේ නීති රෙගුලාසිවලට අනුකූලව "ප්‍රාථමික ඡන්ද විමසීම්" තුළින් සහ "ප්‍රාන්ත පක්ෂ සම්මේලන" තුළිනි. මෑත කාලයේ පටන් පක්ෂ සම්මේලනවලට සහභාගිවන නියෝජිතයින් තෝරා ගන්නා ප්‍රධාන මාර්ගය වන්නේ ප්‍රාථමික ඡන්ද විමසීම් ය. මෙහිදී ප්‍රාථමික ඡන්ද විමසීම් නොපවත්වන ප්‍රාන්ත සහ දිස්ත්‍රික්කවලින් පක්ෂ නියෝජිතයින් තෝරාගනු ලබන්නේ ප්‍රාන්ත සහ දිස්ත්‍රික් මට්ටමේ පක්ෂ සම්මේලනවලිනි.

ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිත වර්ෂයේ දී සමූහාණ්ඩුවාදී පක්ෂයේ සහ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ජනාධිපති අපේක්ෂකත්වය හිමිකර ගැනීම සඳහා තරඟකරන අපේක්ෂකයින් දේශපාලන කරලියට අවතීර්ණ වේ.

ප්‍රධාන පක්ෂ දෙක විසින් එම පක්ෂවල ප්‍රාන්ත මට්ටමේ පක්ෂ සම්මේලන පැවැත්වීමෙන් පසු පක්ෂයේ ජනාධිපති ධුරාපේක්ෂක තරඟකරුවන් අතුරින් බහුතර ඡන්ද සංඛ්‍යාවක් හිමිකරගන්නා තරඟකරුවා පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ද, උප ජනාධිපති ධුර අපේක්ෂක තරඟකරුවන් අතුරින් සුදුසු තැනැත්තෙක් පක්ෂයේ උප ජනාධිපති ධුරාපේක්ෂකයා වශයෙන් ද තෝරාපත්කරගනු ලබන්නේ ජාතික මට්ටමේ පක්ෂ සම්මේලනයේදී ය.

ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරණය පැවැත්වෙන්නේ අධික අවුරුද්දක නොවැම්බර් මස පළමුවන සඳුදා දිනට පසුව එලැඹෙන අඟහරුවාදා දිනයේ දී ය. ජනාධිපතිවරණයේ දී ඡන්දදායකයින් විසින් ඡන්දය ප්‍රකාශ කරන්නේ ජනාධිපති අපේක්ෂකයින්ගේ වරණ මණ්ඩල සාමාජික ලැයිස්තුවලට ය. සෑම ප්‍රාන්තයකින්ම සහ දිස්ත්‍රික්කයකින් ම ඡන්ද විද්‍යාලයට තෝරාපත් කරන නියෝජිත සංඛ්‍යාව තීරණය කරනීබේ. ඒ පහත සඳහන් ආකාරයෙනි.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා නවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

සමාජීක සංඛ්‍යාව	ජනපද ප්‍රදේශය
3 x 8 = 24	වර්මොන්ට්, වයෝමින්ග්, මොන්ටානා, උතුරු ඩැකෝටා, දකුණු ඩැකෝටා, ඩෙල්වෙයාර්, ඇලස්කා, කොලොම්බියා දිස්ත්‍රික්කය
4x 5 = 20	හවායි, අයිඩහෝ, මේන්, නිව් හැම්ප්ෂෙයර්, රෝඩ් දිවයින,
5x 3 = 15	නෙබ්‍රස්කා, නිව් මෙක්සිකෝ, බටහිර වර්ජිනියා
6 x 6 = 36	අර්කැන්සාස් , අයෝවා, කැන්සාස්, මිසිසිපි, නෙවාඩා, උටා
7x 3 = 21	කොහෙක්ටිකට්, මක්ලැහෝමා, ඔරිගන්,
8x 2 = 16	ලුසියලානා, කෙන්ටකි
9x 3 = 27	ඇලබාමා, කොලරාඩෝ, දකුණු කැරොලිනා
10x 4 = 40	මේරිලන්නය, මිනසෝටා, මිසූරි, විස්කොන්සින්
11x 4 = 44	ඇරිසෝනා, ඉන්දියානා, මැසචුසෙස්ට්, ටෙනසී
12x 1 = 12	වොෂින්ටන්
13x 1 = 13	වර්ජිනියා
14x 1 = 14	නිව්ජර්සි
15x 1 = 15	උතුරු කැරොලිනා
16x 2 = 32	ජෝර්ජියා, මිචිගන්
18x 1 = 18	ඔහියෝ
20 x 2 = 40	ඉලිනොයිස්, පෙන්සිල්වේනියා
29 x 2 = 58	ෆ්ලොරිඩා, නිව්යෝක්
38 x 1 = 38	ටෙක්සාස්,
55 x 1= 55	කැලිෆෝනියා
538	

ඡන්ද විද්‍යාලයේ මුළු සාමාජික සංඛ්‍යාව 538 කි. එයින් 535 ක් ප්‍රාන්ත මට්ටමෙන් ඡන්දයෙන් තෝරන අතර 03 දෙනෙක් මධ්‍යම ආණ්ඩුවේ හෙවත් කොලොම්බියානු දිස්ත්‍රික්කයේ (වොෂින්ටන්) නියෝජිතයින් වේ.

ඡන්දය ණෙන් කිරීම සිදුකරන්නේ ප්‍රාන්ත මට්ටමෙන් සරල බහුතර ක්‍රමයට ය. මෙහිදී යම ප්‍රාන්තයක ජයග්‍රාහී අපේක්ෂකයාට හෙවත් වැඩිම ඡන්ද සංඛ්‍යාව හිමිකරගත් අපේක්ෂකයාට එම ප්‍රාන්තයේ සියලුම ඡන්ද නිම්වුවා සේ සැලකෙන අතර ඔහුගේ වරණ මණ්ඩල නියෝජිත ලැයිස්තුවේ සියලුම සාමාජිකයින් යටොක්ත ප්‍රාන්තය වෙනුවෙන් වරණ මණ්ඩලයට හෙවත් ඡන්දදායක විද්‍යාලයට පත්වේ. මෙය "ජයග්‍රාහකයා සියලුම ඡන්ද අයත්කර ගැනීමේ මූලධර්මය (Winner takes all principle)" යනුවෙන් හඳුන්වයි.

ජනාධිපතිවරණය අවසන් වීමත් සමග ජනාධිපති ධුරයට තේරිපත්වන අපේක්ෂකයා නිල නොවන ආකාරයෙන් ප්‍රකාශයට පත්වුවද, ඡන්ද විද්‍යාලයේ සාමාජිකයින් හෙවත් ඡන්ද හිමියන් ජනාධිපති අපේක්ෂකයින් වෙත ඡන්දය ප්‍රකාශ කරන්නේ දෙසැම්බර් මස දෙවන බදාදා දිනයට පසුව එලැඹෙන සඳුදා දිනයේ දී ය. මේ අනුව ඡන්ද විද්‍යාලයේ ඡන්ද හිමියන් (සාමාජිකයින්) ඔවුනොවුන්ට ප්‍රාන්තවල අනුවර්ථ රාජ්‍ය වී ජනාධිපති සහ උප ජනාධිපති තේරීම සඳහා ඡන්දය ප්‍රකාශ කරයි. එහිදී ජනාධිපති සහ උප ජනාධිපති තේරීම සඳහා ඡන්දය ප්‍රකාශ කරයි. එහිදී ජනාධිපති සහ උප ජනාධිපති වෙනුවෙන් ඡන්ද පත්‍රිකා දෙකක් භාවිත කෙරේ. ඡන්ද පත්‍රිකාවේ අපේක්ෂකයාගේ නම සඳහන් කළ යුතු ය. ඉන්පසු එම ඡන්ද ලේඛණ මුද්‍රා තබා සෙනට් සභාවේ සභාපතිවරයා වෙත යොමු කරයි. සෙනට් මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියේ ඡන්ද ණෙන් කරයි. එය ජනවාරි 06 හෝ 07 වන දිනයේ දී සිදුකරනු ලැබේ. එහිදී ඡන්ද විද්‍යාලයේ සාමාජිකයින් අතුරින් බහුතරය හෙවත් ඡන්ද 270 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හිමිකරගන්නා ජනාධිපති අපේක්ෂකයා ජනාධිපතිවරයා වශයෙනුත්, ඔහුගේ සහායක උප ජනාධිපති අපේක්ෂකයා, උප ජනාධිපතිවරයා වශයෙනුත් තේරී පත් වේ.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ජනාධිපතිවරණයේදී යම් ජනාධිපති අපේක්ෂකයෙකු වෙනුවෙන් ඡන්ද විද්‍යාලයට පත්වන ඡන්ද හිමි සාමාජිකයින් අනිවාර්යයෙන්ම එම ජනාධිපති අපේක්ෂකයාට ඡන්දය ප්‍රකාශ කිරීමේ සම්ප්‍රදාය ක්‍රියාත්මක වේ.

ජනාධිපතිවරණයේදී කිසිදු ජනාධිපති අපේක්ෂකයෙකුට බහුතර ඡන්ද සංඛ්‍යාව හිමි නොවුනහොත් පිළිවෙලින් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන ඇති ජනාධිපති අපේක්ෂකයින් දෙදෙනා අතුරින් එක් අයෙකු ජනාධිපති ධුරයට තෝරා පත්කිරීමේ බලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හිමිවේ. මෙහිදී ප්‍රාන්ත වශයෙන් ඡන්ද ගණන් ගැනීම සිදුකෙරුනා අතර එක් ප්‍රාන්තයකට හිමි වන්නේ එක් ඡන්දයකි. ප්‍රාන්ත ඡන්ද හිමියන් ප්‍රාන්තයේ 2/3 ක බහුතරයෙන් තෝරන අතර ජනාධිපති තෝරා පත් කිරීම සඳහා බහුතර ප්‍රාන්ත ඡන්ද සංඛ්‍යාවක් අවශ්‍ය වේ. මෙසේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් ජනාධිපති පත් කිරීම මාර්තු 04 දිනට ප්‍රථමයෙන් නිදුකළ යුතු ය. එමෙන්ම උප ජනාධිපති පත්කිරීමේ බලය සෙනට් සභාව වෙත හිමිවන අතර එහිදී උප ජනාධිපති තෝරාගත යුත්තේ ද වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලැබූ දෙදෙනකු අතුරිනි. මෙහිදී සන පූර්ණය සෙනට් සභාවේ 2/3 කි. ඒ සඳහා සම්පූර්ණ මන්ත්‍රී සංඛ්‍යාවෙන් බහුතරයක් සිටිය යුතු ය.

නිගමනය: ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති තෝරා පත්කරන මැතිවරණය රටෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉක්මවා ඉස්මතුවී ඇති සම්ප්‍රදායන් ඇසුරු කරගෙන ක්‍රියාත්මක වන මැතිවරණයක් බවට පත්ව තිබේ. එම සම්ප්‍රදායන් දේශපාලන ක්‍රමය තුළ ප්‍රබල ලෙස තහවුරුවී ඇති බව පෙනේ.

4.iii. ඉන්දියාවේ සන්ධීය ක්‍රමයේ මූලිකාංග

අරමුණ: දකුණු ආසියාතික කලාපයේ ස්ථිරී බලවතා ඔබෙන්ම ලොව විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය වන ඉන්දියාවේ සන්ධීය ක්‍රමය සම්භවය පසුබිම ක්‍රමයක් නොවන අතර එහි මධ්‍යම ආණ්ඩුව වඩාත් බල සම්පන්න කර තිබේ. මේ පිළිබඳව විභාග අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

ප්‍රවේශය: ඉන්දියානු ආණ්ඩු ක්‍රමයේ පදනම වන්නේ 1950.01.16 දින සම්මත කර ලද ව්‍යවස්ථාවයි. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වර්තමානයේ ඉන්දියාව ප්‍රාන්ත රාජ්‍ය 29 කින් හා මධ්‍යම ආණ්ඩුවේ සෘජු පාලනය යටතේ පවතින සාංගමික දේශභූමි (Union Territories) 07 කින් සමන්විත ය.
ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එය සන්ධීය ක්‍රමයක් ලෙස දක්වා නැත. එහි පළමුවන වගන්තියේ දක්වා ඇත්තේ India shall be a Union of States යනුවෙනි. එය ෆෙඩරල් රාජ්‍යයක් යැයි එහි සඳහන් නොවේ.

අන්තර්ගතය: සාම්ප්‍රදායික සන්ධීය ආණ්ඩුක්‍රමයක අන්තර්ගත වන අංග ලක්ෂණ ඉන්දියානු සන්ධීය ක්‍රමයෙහි ද අන්තර්ගත වේ. ඒවා පහත දක්වෙන පරිදි වේ.

(අ). ලිඛිත ව්‍යවස්ථාවක් පැවතීම

ඉන්දියානු ආණ්ඩුක්‍රමය ලොව දීර්ඝතම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. එය වගන්ති 395 කින් ද, උප ලේඛණ 09 කින් ද, ඇමුණුම් 03 කින් ද, සංශෝධන 101 කින් ද (අවසාන සංශෝධනය කෙරුනේ 2017.07.01 දින දී ය) සමන්විත ය.

A/L උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ආ). ව්‍යවස්ථාවේ අනම්‍යභාවය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක නම්‍ය හෝ අනම්‍ය භාවය තීරණය කරන්නේ එය සංශෝධනය කරන ආකාරය අනුව ය. ව්‍යවස්ථාදායකයේ සාමාන්‍ය බහුතර ඡන්දයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිනම් එය නම්‍ය ව්‍යවස්ථාවක් ලෙස සැලකේ. එය සංශෝධනය කිරීම සඳහා විශේෂිත ක්‍රමයක් අනුගමනය කරන්නේ නම් එය අනම්‍ය ව්‍යවස්ථාවක් ලෙස සැලකේ. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා යොදා ඇති විධිවිධාන ත්‍රිවිධාකාර ය. එනම්

I. මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ සරළ බහුතරයක අනුමැතියෙන් පමණක් සංශෝධනය කළ හැකි වගන්ති තිබීම.

II. මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ ද්විත්ව මණ්ඩලයන් හි වෙන වෙනම විශේෂ බහුතර අනුමැතියෙන් (2/3) හා ප්‍රාන්ත රාජ්‍යයන්හි අඩක අනුමැතියෙන් සංශෝධනය කළ හැකි වගන්ති තිබීම.

III. මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ ද්විත්ව මණ්ඩලයන්හි වෙන වෙනම විශේෂ බහුතරයකින් (2/3) සංශෝධනය කළ හැකි වගන්ති තිබීම.

(ඇ). ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය

ව්‍යවස්ථාව මගින් දක්වා ඇති විධි විධාන අනුව ඉන්දියානු දේශ සීමා තුළ ඇති උත්තරිතර නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි. මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාන්ත ආණ්ඩුවලට බලය ලැබෙන්නේ එම නීතියෙනි. එසේම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතියට ඉහළින් සිටින නීතියක් ඉන්දියාව තුළ නොමැති බව එහි ව්‍යවස්ථාවේ ම සඳහන් වේ.

(ඈ). මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලය බෙදා හිඳීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලේඛණ 03 ක් යටතේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලය බෙදාහැර ඇත. එනම්

- මධ්‍යම ආණ්ඩුවේ බලතල — කරුණු 97 (වර්තමානය වන විට එය කරුණු 100 දක්වා වර්ධනය වී තිබේ.)
- ප්‍රාන්ත ආණ්ඩුවල බලතල — කරුණු 66 කින් (වර්තමානයේ දී එම කරුණු සංඛ්‍යාව 61 දක්වා අඩු වී තිබේ.)
- සමගාමී බලතල ලැයිස්තුව — කරුණු 47 (වර්තමානයේ දී එය කරුණු 52 ක් දක්වා වර්ධනය වී තිබේ.)

ඉහත සඳහන් බලතල ලැයිස්තු 03 ට අතිරේක වූ බලතල ව්‍යවස්ථාවෙන් මධ්‍යම ආණ්ඩුවට පවරා තිබේ.

(ඉ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමේ බලය අධිකරණය වෙත පැවරීම.

ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විවරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා නැතත්, ශ්‍රේෂ්ඨාධිකරණය එම බලය ක්‍රියාවට නංවනු ලබයි. එසේම මධ්‍යම ආණ්ඩුව ද, ප්‍රාන්ත ආණ්ඩුව ද පනවන නීති ව්‍යවස්ථානුකූල නොවන්නේ නම් ඒවා බල රහිත කිරීමේ බලය ද ශ්‍රේෂ්ඨාධිකරණය සතු ය. මේ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයා ලෙස ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය කටයුතු කරයි.

(ඊ). ද්විත්ව දේශපාලන ක්‍රමයක් පැවතීම

ඉන්දියාව තුළ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු වශයෙන් පාලන කොටස් දෙකක් වේ. ඒවාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා ඇති බලතල ක්‍රියාවට නැංවීමට ස්වාධීන බලයක් හිමි ව තිබේ.

A/L උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ඇ). මධ්‍යම ආණ්ඩුව කුළ ප්‍රාන්ත රාජ්‍යයන්ට නියෝජනයක් හිමි වීම
සන්ධීය රාජ්‍යයන්හි ප්‍රාන්ත රාජ්‍යයන්ට මධ්‍යම ආණ්ඩුව කුළ නියෝජනයක් හිමි වන්නේ ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ දෙවන මණ්ඩලය කුළයි. ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවේ දෙවන මණ්ඩලය වන්නේ රාජ්‍ය සභාවයි. එහි නියෝජිතයින් ගණන 250 කි. ඉන් 238 ක් ප්‍රාන්ත නියෝජනය කරනු ලබයි. එහෙත් ඇමරිකා එක්සත් ජනපදයේ මෙන් සෑම ප්‍රාන්තයකටම සමාන නියෝජනයක් හිමි නොවේ.

ඒකීය ලක්ෂණ අන්තර්ගත සන්ධීය ක්‍රමයක් වීම
ඉන්දීය සන්ධීය ක්‍රමයේ පහත සඳහන් ඒකීය ලක්ෂණ හඳුනා ගත හැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අතිරේක බලතල මධ්‍යම ආණ්ඩුව වෙත පැවරීම.
- හදිසි අවස්ථා යටතේ සන්ධීය ක්‍රමය ඒකීය ක්‍රමයක් බවට පත්වේ.
- ප්‍රාන්ත ආණ්ඩු තාවකාලිකව විසුරුවා හැරීමේ බලය මධ්‍යම ආණ්ඩුවට හිමි වීම.
- ඉන්දියානු භූමිය පිළිබඳ අයිතිය මධ්‍යම ආණ්ඩුවට හිමි වීම
- ඒකීය අධිකරණ ක්‍රමයක් සහ ඒකීය සිවිල් නීති ක්‍රමයක් පැවතීම.
- සමස්ත ඉන්දියානු රාජ්‍ය සේවය
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 254 වන වගන්තිය අනුව මධ්‍යම ආණ්ඩුවේ නීතිය හා ප්‍රාන්ත නීතිය අතර ගැටුමක් ඇති වුවහොත් වලංගු වන්නේ මධ්‍යම ආණ්ඩුවේ නීතියයි.
- මධ්‍යම ආණ්ඩුවේ කොංග්‍රසය පහත දැක්වෙන නීති මඟින්
අ. ප්‍රාන්ත රාජ්‍ය පවරා ඇති නීතිවලට අලුත් නීති එකතු කළ හැක.
ආ. ප්‍රාන්ත නීති සංශෝධනය කළ හැකි ය.
ඇ. ප්‍රාන්ත නීති මුලුමනින් ම ඉවත් කිරීමට හෝ ක්‍රියාත්මක වන ස්වරූපය වෙනස් කිරීමට හැකි ය.
- මූල්‍ය පාලන බලතල මධ්‍යම ආණ්ඩුවට හිමිවීම.

නිගමනය: ඉහත සඳහන් කරුණුවලින් පෙනී යන්නේ සන්ධීය ආණ්ඩුක්‍රමයක අන්තර්ගත ලක්ෂණ සියල්ලම ඉන්දීය ආණ්ඩුක්‍රමය තුළ ද පවතින බවයි. එහෙත් ඉන්දියානු සන්ධීය ක්‍රමයෙහි විශේෂ ලක්ෂණය වන්නේ සන්ධීය මූලධර්ම ඉක්මවා ඒකීය ලක්ෂණ ඉස්මතු කර ඇති බවයි. මෙය ආණ්ඩුක්‍රම සම්පාදකයින් නිර්මාණාත්මක ඇති කළ හැක්කක් බව ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ සභාපති ආචාර්ය බී.ආර්. අම්බේඩ්කාර් මහතාගේ ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

Q5 කෝල්බෘක්-කැමරන් නිර්දේශවල වාසි සහ අවාසි හෝ ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විධායක කාරක සභා ක්‍රමයේ වාසි සහ අවාසි විශ්ලේෂණය කරන්න.

කෝල්බෘක්-කැමරන් නිර්දේශවල වාසි සහ අවාසි
අරමුණ: කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ වසර දහස් ගණනාක් තිස්සේ විකාශනය වූ සමාජ ක්‍රමයේ විප්ලවීය පරිවර්තනයකට හේතු විය. එහි බලපෑම් කොතෙක් ද යන්න අද වන විට ලංකාවේ පවතින සමාජ ආර්ථික ක්‍රමයේ පදනම් බවට පත්වීම කුළින් වටහා ගත හැකිය. මේ සම්බන්ධව සිසුන්ගේ අවබෝධය පරීක්ෂා කිරීම මෙම කොටසින් අපේක්ෂා කෙරේ.

ප්‍රවේශය: එක්දහස් අටසිය තිස් ගණන වල ලංකාවේ පාලනය සම්බන්ධව පැනනැඟී තිබූ විවිධ ගැටළු සහ ප්‍රශ්න අවබෝධකර ගනිමින් ඒවාට විසඳුම් සෙවීමටත් ලංකාවේ යටත් විජිත පාලනය ශක්තිමත්ව පවත්වාගෙන යාම් සඳහා කුමන සියවර ගතයුතු ද යන්න පිළිබඳව නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීමට කෝල්බෘක් කැමරන් කොමිසමට පැවරුණි. ඒ අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයේ ප්‍රතිව්‍යුහගත කිරීම් සඳහා කෝල්බෘක් ස්වාමිවරයා විසින් ද එයට සරිලන ආකාරයට නිති ක්‍රමය

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ප්‍රතිසංස්කරණය සඳහා කැමරන් විසින් ද වෙන වෙනම යෝජනා ඉදිරිපත් කරන අතර සමස්ථයක් ලෙස හන්ට්ට ඒවා කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණ ලෙස හැඳින්වේ. මෙම නිර්දේශවල වාසි මෙන්ම අවාසි ද දැක ගත හැකිය.

අන්තර්ගතය: වර්ෂ 1829 දී බ්‍රිතාන්‍ය යටත්විජිත කාර්යාලය ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර පරිපාලන තත්ත්වය පරීක්ෂා කොට වර්ධනා කිරීම සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත කොමිෂන් සභාවක් පත්කර එවනු ලැබේ. එහි සාමාජිකයන් වූයේ ඩබ්. ඒම්. ජී. කෝල්බෘක් සහ සී. එච්. කැමරන්ය. 1833 වර්ෂයේ දී කොමිසම විසින් ඉදිරිපත් කළ නිති සහ ආර්ථික ප්‍රතිසංස්කරණ පදනම්කොට ගෙන සකස් වූ කෝල්බෘක් කැමරන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ලංකාවේ ආණ්ඩු තුනක් එනම් ආණ්ඩුව, ආර්ථිකය සුභ අධීක්ෂණය යන සම්බන්ධ යෝජනා රාශියක් ඉදිරිත් කළේය. කෝල්බෘක් කැමරන් කොමිසමේ ප්‍රධාන නිර්දේශ පහත සඳහන් වේ.

(1) රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
(2) ආණ්ඩුකාරවරයා විසින් ව්‍යුක්තිවිඳි අසීමිත බලතල අඩු කිරීම
(3) ආණ්ඩුකාරවරයාට සහායවීම පිනිස ව්‍යවස්ථාදායක සභා විධායක සභා ස්ථාපිත කිරීම
(4) උඩරට පලාත්වල පැවති වෙනම පරිපාලනය ලංකාවේ නව ආණ්ඩු පරිපාලනය තුළට අන්තර්ග්‍රහනය කිරීම
(5) එකෙක් ක්‍රියාත්මක වූ පලාත් පරිපාලන ඒකක සංඛ්‍යාව 16 සිට 5 දක්වා අඩුකිරීම සහ ජනතාවගේ පහසුව, පොදු ව්‍යාපාර කටයුතු, වෙළඳාම සහ අනෙකුත් කාර්යයන් පිළිවත් කිරීමේ අරමුණින් එම පලාත්වල සීමාවන් අලුතෙන් නිර්ණය කිරීම
(6) සිවිල් සේවාවට ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම
(7) සියලු සිවිල් සේවකයන්ගේ වැටුප් සැලකිය යුතු ලෙස අඩුකිරීම සහ ඔවුන්ගේ කාර්යයන් සරල කිරීම
(8) වැටුප් අඩුකිරීමෙන් මතුවිය හැකි අපහසුතා වැළැක්වීමට සිවිල් සේවකයන්හට ඉඩම් ලබාදීම

කැමරන්ගේ ප්‍රධාන නිර්දේශ

(1) ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය ඒකීය එකක් බවට පත් කිරීම
(2) උඩරට සහ මුහුදුබඩ පලාත්වල ක්‍රියාත්මක වූ විවිධ උසාවි අවලංගුකිරීම
(3) යුක්තිය පසිදලීමට අවශ්‍ය අගවිනිසුරු සහ තවත් විනිසුරුවරු දෙදෙනෙකුගෙන් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණයක් ස්ථාපිත කිරීම
(4) සියළු අධිකරණ කාර්යයන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධීක්ෂණය යටතට පත්කිරීම
(5) අධිකරණය සහ විධායකය එකිනෙකින් වෙන් කිරීම
(6) දිස්ත්‍රික් උසාවි පිහිටුවා අදාළ දිස්ත්‍රික්කය තුළ සිවිල් හා අපරාධ කාර්යයන් පිළිබඳ අධිකරණ බලතල පැවරීම

කෝල්බෘක්-කැමරන් නිර්දේශවල වාසි

(1) අනිවාර්ය සේවා ක්‍රමය (රාජකාරික්‍රමය) අහෝසි කිරීම මඟින් ලංකාවේ සිංහල සහ දෙමළ සමාජයේ පැවති කුලය පදනම් වූ ධුරාවලීක්‍රමය දුර්වල කිරීම
(2) කෘෂිකර්මාන්තය සහ වෙළඳාම සම්බන්ධ ආණ්ඩුවේ ඒකාධිකාරීය දුර්වල කිරීම මඟින් ලංකාව තුළ නිදහස් වෙළඳාම සහ පෞද්ගලික ව්‍යවසායට අවශ්‍ය මාවත සැකසීම
(3) සැලකිය යුතු ලාංකීය මධ්‍යම පන්තියක බිහිවීමට අවශ්‍ය පසුබිම විවර කිරීම
(4) ලාංකා ආණ්ඩුව ලිබරල්කරණය කිරීම
(5) ලංකාවේ පාර්ලිමේන්තු ආකෘතියේ ආණ්ඩුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම
(6) නිදහස් සහ ස්වාධීන අධිකරණ ක්‍රමයක් ලංකාව තුළ සංවර්ධනයවීම

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(7) සාමාන්‍ය සිවිල් සේවා පරිපාලනය තුළ විශේෂ වරප්‍රසාද බුක්තිවිඳි සමහර කුල සහ වර්ග වලට ඓතිහාසිකවම එම තත්වය අහිමිවීම

(8) ලාංකේය අධ්‍යාපන ක්‍රමය ව්‍යුහගතවීම

කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවල අවාසි

(1) පුරාණ සිංහල සහ දෙමළ සමාජ ක්‍රමයේ මූලික පදනම් අවතක්සේරු කිරීම

(2) වර්ගය හෝ ජාතිය මත පදනම්ව ව්‍යුවුස්ථායක සඟාවට නිලතලවලින් සාමාජිකයන් තිදෙනෙකු නාමෝද්දිෂ්ටයෙන් පත්කිරීමට ආණ්ඩුකරුට හිමිවූ බලය හේතුවෙන් ජනවර්ග අතර ගැටුම් ඇතිවීමට අවශ්‍ය මූලාශ්‍රයක් නිර්මාණය කිරීම. මේ හරහා ව්‍යවස්ථාමය සංවර්ධනයක් වෙනුවට තවදුරටත් වාර්ගික නියෝජනය දිරිගැන්වීම සහ විවිධ ප්‍රජාවන් අතර අපේක්ෂාභංගත්වයක් සහිත දේශපාලන සම්බන්ධතා ගොඩනැඟීමට පටන් ගත්තා.

(3) කිලතලවලින් සාමාජිකයන් නම්කිරීමට ආණ්ඩුකාරවරයාට හිමි වූ බලය ඔහුගේ හිතවතුන් එම තනතුරුවලට පත්කිරීමට ලබාදුන් පහසුකමක් වන අතර ඒ මගින් නීති සම්පාදනය තුළ ජනතා හඬට පැවති ඉඩකඩ අවම කිරීම

නිගමනය : ලංකා ඉතිහාසය තුළ කෝල්බෲක් කැමරන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ වඩාත් ප්‍රතිඵලදායී විස්තීර්ණ ප්‍රවාහ ලෙස හැඳින්විය හැකි. එම ප්‍රතිසංස්කරණ මගින් ලංකාවේ පරිපාලන, ආර්ථික සහ සමාජ ප්‍රගමනයේ නව යුගයක් ඇතිවූවත් කිරීමට අවශ්‍ය රැඩිකල් පරිවර්තනයක් ඇතිකරන ලදී.

ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විධායක කාරක සභා ක්‍රමයේ වාසි සහ අවාසි

අර්ථකථනය: ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ පිහිටවූ විධායක කාරක සභා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සහ එහි යහපත් හා අයහපත් ලක්ෂණ පිළිබඳව අපේක්ෂයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

විෂය පථය: එනෙක් ලංකාවේ ක්‍රියාත්මක වූ ආණ්ඩු ප්‍රතිසංස්කරණවල ක්‍රියාකාරිත්වය සහ ඊට සිදුවෙයුතු වෙනස්කම් පරීක්ෂා කොට නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වර්ෂ 1927 දී ඩොනමෝර් කොමිෂන් පත්කර එවන ලදී. ඩොනමෝර් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ලංකාවේ දේශපාලන සහ සමාජ ප්‍රගමනයට ඉතිහාස් දායකත්වයක් සැපයූහ. ඩොනමෝර් කොමිසමේ ප්‍රධාන යෝජනා සහ ලක්ෂණ පහත ආකාරයට සාරාංශ කොට දක්විය හැක.

- සර්වජන ඡන්දබලය පිරිනැමීම
- වාර්ගික නියෝජනය අහෝසි කිරීම
- භූමිය පදනම්කරගත් නියෝජන ක්‍රමය හඳුන්වා දීම
- විධායක කාරක සභාක්‍රමය
- රාජ්‍ය මන්ත්‍රණ සභාව
- රාජ්‍ය නිලධාරීන් තිදෙනා

අන්තර්ගතය: ඩොනමෝර් ව්‍යවස්ථාවේ එක් ප්‍රධාන නිර්දේශයක් වූයේ විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීමය. ඒ අනුව සාමාජිකයන් 7කට නොඅඩු 8කට නොවැඩි සංඛ්‍යාවකින් සැදුම්ලත් කාරක සභා හතක් ස්ථාපිත කරන ලදී. එම කාරක සභා 7 වූයේ 1. ස්වදේශ කටයුතු, 2. කෘෂිකර්මය, 3. පලාත් පාලන, 4. සෞඛ්‍යය, 5. කම්කරු, කර්මාන්ත සහ වාණිජ, 6. අධ්‍යාපන සහ 7. සංනිවේදනය සහ අනෙකුත් කාර්යයන් ය. මෙම කාරක සභාවල ප්‍රධාන කාර්යය වූයේ තම කාර්ය ක්ෂේත්‍රයට අයත් දෙපාර්තමේන්තු අධීක්ෂණය සහ පාලනයයි. එයට අමතරව එම දෙපාර්තමේන්තුවල අයවැය ඇඟයීම, දෙපාර්තමේන්තු කාර්යයන් නිරීක්ෂනය කිරීම සහ කාරක සභාවේ සමහර තනතුරු වලට සාමාජිකයන් පත්කිරීම වැනි කාර්යයන් ද ඊට හිමිව තිබුණි. කෙසේ වෙතත් විධායක කාරක සභා ක්‍රමයේ යහපත් ලක්ෂණ මෙන්ම යම් යම් සීමාවන් දැකිය හැකි විය. මෙම ක්‍රමයේ වාසි සහ අවාසි පහත ආකාරයට දක්විය හැක.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

වාසි

- එක් ඇමතිවරයකුගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන අමාත්‍යාංශ සහිත කැබිනට් ආකෘතියේ ආණ්ඩුවක් වෙනුවට අදාළ කාර්යයන් පිළිබඳව සිත්දු තීරණ ගැනීමට පුද්ගලයන් කිහිපදෙනෙකුගෙන් යුත් කමිටු හඳුන්වා දීම
- සුළුතර සහ පසුපෙළ මන්ත්‍රීවරුන්ගට දේශපාලන කාරණා වලට ප්‍රවල්ව මැදිහත් වීමට උනන්දු කරමින් චාරිත්‍රික සහ ආගමික වෛෂ්කම් ඔගින් පොළඹවන කණ්ඩායම් වල මතුවීම දුර්වල කිරීමට හේතුවීම
- දේශපාලන පක්ෂ බැඳීම් වලින් තොරව කමිටුවේ සෑම නියෝජිතයකුටම අනෝන්‍ය සහයෝගය පිළිබඳ මූලධර්මය මත පදනම්ව ප්‍රශ්න විසඳා ගැනීමට ඉඩකට ලබාදීම
- විධායක කාර්යයන් වලට ක්‍රියාකාරීව සහභාගීවීමට කාරක සභා සාමාජිකයන් දිරිමත් කිරීම
- සමාජයේ ප්‍රගතිය සඳහා වන ව්‍යවස්ථා සම්පාදනය කිරීමට ඉඩකඩ ලබාදීම
- සෑම පරිපාලන ඒටලුවක් සම්බන්ධයෙන්ම ඔහුතරයේ අදහස් සලකා බැලීමට ඇති ඉඩප්‍රස්ථා පුළුල් කිරීම
- සෑම සභාවකටම සාමාජිකයන් අතර අන්‍යොන්‍ය විශ්වාසය දියුණු කිරීම
- ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල එදිනෙදා ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අවබෝධකර ගැනීමට ශ්‍රී ලාංකිකයන් හට පසුබිම විවර වීම.

විධායක කාරක සභා ක්‍රමයේ අවාසි

- පුද්ගලවාදය මත පදනම්ව ක්‍රියාත්මක වීමට පෙළඹීම
- දේශපාලන, ආර්ථික සහ සමාජ කාරණා මත පදනම්ව නිර්මාණය වූ දේශපාලන පක්ෂ ක්‍රමයේ සංවර්ධනය ප්‍රමාද කිරීම
- වගකීම් භාරගන්නා ප්‍රධාන අමාත්‍යවරයකු නොමැතිවීම නිසා කණ්ඩායමක් ලෙස සාමූහිකව වැඩකිරීම අසාර්ථක වීම
- කාරක සභා තුළ දීර්ඝ සාකච්ඡා පැවැත්වීම නිසා ප්‍රතිපත්ති සම්පාදනය සැලකියයුතු ලෙස ප්‍රමාද වීමට හේතුවීම
- හදිසි අවස්ථාවලදී ක්‍රියාකාරීව සටයුතු කිරීම අසාර්ථකවීම
- එකම කාරණයක් සම්බන්ධයෙන් එකිනෙක වෙනස් කාරක සභා දෙකක් එකිනෙක පරස්පර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- කාරක සභා සාමාජිකයන් අතර එක්සත් බව දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් ස්ථාවර සභ කලින් තීරණය කළ ප්‍රතිපත්ති සම්පාදනයට බාධා ඇතිවීම
- ඡන්ද සංග්‍රහය සහ අයතා පක්ෂාතකම්වලට හේතුවීම
- විවිධ ජනකොටස් අතර චාර්ගික ආතතියක් නිර්මාණය කිරීමට දායක වීම

නිගමනය: විධායක කාරක සභා ක්‍රමය මෙරට ආණ්ඩුක්‍රම වර්ධන ඉතිහාසයේ නවවූ අත්හදා බැලීමක් වීය. යම් යම් අඩුපාඩු තිබුණද විධායක කාරක සභා ක්‍රමය බහුවිද ජනසමාජයක සෑම ජන කොටසකටම විධායක කාර්යයන්ට සහභාගි වීමට ප්‍රබල් ඉඩ ප්‍රස්ථාවක් සළසා දුන්නේය.

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

Q6. පහත දැක්වෙන ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

i. **සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයේ බලතල, කාර්යයන් සහ තත්ත්වය**

ii. **සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය**

iii. **සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධීනත්වය**

6.i. සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයේ බලතල, කාර්යයන් සහ තත්ත්වය

අරම්භය: මෙම ප්‍රශ්නයේ අරම්භය වන්නේ 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ නාමික විධායකය වූ අග්‍රාණ්ඩුකාරවරයාට හිමි වූ බලතල, කාර්යයන් සහ තත්ත්වය 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ජනාධිපති තනතුරට හිමිව තිබූ එම තත්වයන් සමග සංසන්දනය කරමින් එම තනතුරු දෙක අතර පවතින වෙනස විශ්ලේෂණය කිරීමට අපේක්ෂයෙන් තුළ ඇති හැකියාව මැන බැලීමය.

ප්‍රවේශය: 1947 සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යන ව්‍යවස්ථා දෙක මගින්ම ලංකාව තුළ ස්ථාපිත කරනු ලැබුයේ කැබිනට් ආණ්ඩුක්‍රමයක්ය. මේ අනුව ආණ්ඩුක්‍රම දෙක තුළම නාමික විධායක තනතුර ක්‍රියාත්මක විය. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ එම තනතුර අග්‍රාණ්ඩුකාර තනතුර ද පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපති තනතුර ද හැඳින්වීන. නාමික විධායකය යන නමින් එක සමාන වුවද නිලයන් දෙකට අයත් වූ බලතල, කාර්යයන් හා තත්වය බොහෝ සෙයින් එකිනෙකට වෙනස් විය.

අන්තර්ගතය: සෝල්බරි ආණ්ඩුක්‍රමය කැබිනට් ආණ්ඩුක්‍රමයක් විය. කැබිනට් ආණ්ඩු ක්‍රමයක නාමික විධායකය, දේශපාලන විධායකය හෙවත් සත්‍ය විධායකය සහ ස්ථිර විධායකය හෙවත් රාජ්‍ය සේවය යනුවෙන් විධායකයේ ප්‍රභේද තුනක් වේ. සෝල්බරි ආණ්ඩුක්‍රමයෙහි නාමික විධායකය වූයේ බ්‍රිතාන්‍ය රජුගේ හෝ රැජිනගේ (කිරීටයේ) නියෝජිතයා වූ අග්‍රාණ්ඩුකාරවරයාය.

අග්‍රාණ්ඩුකාරවරයා නාමික විධායකය බවට පත්වන්නේ ඩොමීනියන් තත්ත්වයේ නිදහස හිමිවන බ්‍රිතාන්‍යයේ යටත් විජිතවලය. 1948 පෙබරවාරි 04 වන දින ලංකාව ඩොමීනියන් තත්ත්වයේ නිදහස හිමි වූ හෙයින් 1948 සිට 1972 දක්වා ලංකාවේ නාමික විධායකය වූයේ අග්‍රාණ්ඩුකාරවරයාය.

අග්‍රාණ්ඩුකාර ධුරය සඳහා ලංකාවේ අගමැතිවරයා නිර්දේශ කරන තැනැත්තෙකු බ්‍රිතාන්‍ය රජු හෝ රැජින විසින් පත් කරනු ලැබේ. අග්‍රාණ්ඩුකාර ධුරයේ නිල කාලය සෝල්බරි ව්‍යවස්ථාවෙහි සඳහන් නොවුවද සම්ප්‍රධායක් වශයෙන් එම නිල කාලය වසර 05 ක් විය. නිල කාලය අවසන් වූ අග්‍රාණ්ඩුකාර වරයෙක් නැවත එම තනතුරට පත් කළ හැකි විය.

සෝල්බරි ව්‍යවස්ථාවට අනුව අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල, අධිකාර හා කාර්යයන් බ්‍රිතාන්‍ය රජුගේ හෝ රැජිනගේ බලතල අධිකාර හා කාර්යයන්ට බෙහෙවින් සමාන විය යුතු විය. එමෙන්ම අග්‍රාණ්ඩුකාරවරයාගේ තත්ත්වය බ්‍රිතාන්‍ය රජු ගේ හෝ රැජිනගේ තත්ත්වයට සමාන විය.

ව්‍යවස්ථාවට අනුව අග්‍රාණ්ඩුකාරවරයාගේ තත්ත්වය බ්‍රිතාන්‍ය සම්ප්‍රදායානුකූලව මෙසේ විය. එනම් රාජ්‍යයක ප්‍රධානියා, විධායකයේ ප්‍රධානියා සහ සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා යනුවෙනි. අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල සහ කාර්යයන් ව්‍යවස්ථාවෙහි සවිස්තරාත්මකව සඳහන් නොවූ අතර එම බලතල සහ කාර්යයන් බ්‍රිතාන්‍ය සම්ප්‍රධායානුකූලව අග්‍රාණ්ඩුකාර ධුරය වෙත පැවරී තිබුණි. එය පහත සඳහන් ආකාරයෙනි.

- පාර්ලිමේන්තුව කැඳවීම, විසුරුවා හැරීම, එහි සැසිවාර ආරම්භ කිරීම සහ නල් තැබීම, පාර්ලිමේන්තු සැසිවාර ආරම්භයේ දී රාජාසන කථාව පැවැත්වීම, මංගල අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම, පාර්ලිමේන්තු පනත් සඳහා අනුමැතිය ලබා දීම.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට වුළු ජාතීන් වෙතුවෙන් නියෝජිතයින් 06 දෙනෙක් නාමයෝජනයෙන් පත් කිරීම. විශිෂ්ට මහජන සේවයක් කරන ලද පුද්ගලයින් අතුරින් 15 දෙනෙක් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම
- අගමැති පත් කිරීම, ඇමතිවරුන් පත් කිරීම, උප ඇමතිවරුන් පත් කිරීම, ඇමති මණ්ඩලයේ ලේකම්වරුන් පත් කිරීම, ඇමතිවරුන් සහ උප ඇමතිවරුන් අවාහෘ මණ්ඩලයෙන් ඉවත් කිරීම
- යුද්ධය සහ සාමය ප්‍රකාශ කිරීම.
- ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ පොලිස්පති පත් කිරීම. රජයේ උසස් නිලධාරීන් පත් කිරීම
- විදේශ කානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන් පත් කිරීම, පිළිගැනීම, ආපසු කැඳවීම
- අග්‍රවිනිශ්චයකාරයා සහ අනෙකුත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවන් පත් කිරීම
- චරදකරුවන්ට සමාව දීම සහ දඩුවම් ලිහිල් කිරීම
- රාජ්‍ය මුද්‍රාව තැබීම
- පාර්ලිමේන්තුව කම්මතු කරන බවට ඔලාන්මක වීම සඳහා අග්‍රාණ්ඩුකාරයාගේ නිර්දේශය අවශ්‍යවේ.

මෙසේ අග්‍රාණ්ඩුකාරයා වෙත පැවරුණු බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වූයේ අගමැතිවරයාගේ උපදෙස් පරිදි වේ. මේ අනුව අග්‍රාණ්ඩුකාරයාගේ බලතල නාමික විධායක බලතල විය. අග්‍රාණ්ඩුකාරයාට එරෙහිව නඩු පැවරිය නොහැක. නිල කාලය අවසන් වීමට පෙර අගමැතිගේ උපදෙස් පරිදි ක්‍රියාහාර කිරීමට අග්‍රාණ්ඩුකාරයා බැරෙරෙන් ඉවත් කල හැකි විය.

1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මඟින්ද කැබිනට් ආණ්ඩුක්‍රමයක් ස්ථාපනය කෙරුණි. එම ආණ්ඩුක්‍රමය යටතේ නාමික විධායකයා වූයේ ජනාධිපතිවරයායි. ශ්‍රී ලංකාවේ ජන්ද බලය හිමි මිනිසුන් ප්‍රජාවැසියෙකු ජනාධිපතිධුරයට පත් කිරීමේ බලය අගමැතිවරයාට හිමි විය. ජනාධිපතිවරයාගේ නිල කාලය වසර 04 කි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියාද, විධායකයේ ප්‍රධානියාද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයාද වන්නේය. මෙනුවෙන් ජනාධිපතිවරයාගේ තත්ත්වය සඳහන්කර තිබේ. ජනාධිපතිවරයා වෙත ව්‍යවස්ථාවෙන් පැවරූ බලතල සහ කාර්යයන් පහත සඳහන් පරිදි විය.

- යුද්ධය සහ සාමය ප්‍රකාශ කිරීම
- ජාතික රාජසභාව කැඳවීම, වාර අවසාන කිරීම, ජාතික රාජ්‍ය සභාව විසුරුවා හැරීම
- අගමැතිවරයාද අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් ඇමතිවරුන්ද, නියෝජ්‍ය ඇමතිවරුන්ද පත් කිරීම
- අභියාචනා විනාඩිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීම සහ වෙනත් රාජ්‍ය නිලධාරීන් සහ කොමසාරිස්වරුන් පත් කිරීම
- කානාපතිවරුන් මහ කොමසාරිස්වරුන් ප්‍රතිග්‍රාහකයි රාජ්‍ය දූතයින් පත් කිරීම, බලතල පැවරීම, හා පිළිගැනීම
- ජාතික රාජ සභාවේ වාර ආරම්භයේ දී හා මංගල අවස්ථාවලදී එහි මුලසුන දැරීම
- රාජ්‍ය මුද්‍රාව තබා ගැනීම,
- වරදකරුවන්ට දඩුවම් දීම සහ දඩුවම් ලිහිල් කිරීම

ජනාධිපතිවරයා වෙත ව්‍යවස්ථාවෙන් පැවරූ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අගමැතිවරයාගේ උපදෙස් අවශ්‍ය වේ. මේ අනුව ජනාධිපති සතු බොහෝ නාමික විධායක බලතල විය. ජනාධිපතිට එරෙහිව නඩු පැවරිය නොහැක. ජාතික රාජ්‍ය සභාවේ නිති බලාත්මක වීම සඳහා ජනාධිපතිගේ නිර්දේශය අවශ්‍ය නොවූ අතර ඒ සඳහා අවශ්‍ය වූයේ කථානායකගේ නිර්දේශයයි.

නිල කාලය තුළ ජනාධිපති ධුරයෙන් ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග දෙකක් අනුගමනය කල යුතු විය. ඉන් එක් ක්‍රියාමාර්ගයක් වූයේ ජනාධිපති ඉවත් කිරීම සඳහා අගමැතිවරයාගේ යෝජනාවක් ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයින් තුනෙන් දෙකේ බහුතරයකින් සම්මත කිරීමයි. දෙවෙනි ක්‍රියාමාර්ගය වූයේ ජනාධිපති ඉවත් කිරීම සඳහා ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයෙක් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් ජාතික රාජ්‍ය සභාවේ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමයි. මේ අනුව සෝල්බරි අග්‍රාණ්ඩුකාර ධුරයට සාපේක්ෂකව ජනාධිපති ධුරය ස්වාධීන විය.

Alevel උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

නිගමනය: සෝල්බරි ආණ්ඩුක්‍රමයේ සහ 1972 ආණ්ඩුක්‍රමයේ නාමික විධායකයේ තත්ත්වය බලතල සහ කාර්යයන් මූලික වශයෙන් සමාන වන බව පෙනේ. එහෙත් සෝල්බරි ආණ්ඩුකාරවරයා ජාතික නායකයෙක් නොව විශේෂ රාජ්‍ය නායකයෙකුගේ දේශීය නියෝජිතයා විය. එහෙත් 1972 ආණ්ඩුක්‍රමයෙහි ජනාධිපතිවරයා මෙරටෙහි ජාතික නායකයා වීම පැහැදිලි දේශපාලන වෙනසක් විය. එමෙන්ම සෝල්බරි අග්‍රාණ්ඩුකාර ධුරයට සාපේක්ෂව 1972 ජනාධිපති ධුරය ස්වාධීන තනතුරක් විය.

6.ii. සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය

අරමුණ: 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවේ සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායකය වන ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් හිමිකර දී තිබූ බලතල පිළිබඳව සංස්ථානාත්මක විග්‍රහයක් කරමින් ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් පූර්ණ බලයක් හිමි වූයේ කුමණ ව්‍යවස්ථාදායකයටද යන්න පිළිබඳව අවසාන නිගමනයකට පැමිණීමට අපේක්ෂකයින්ට ඇති හැකියාව පරීක්ෂා කර බැලීමය

ප්‍රවේශය: ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක නීති පැනවීම හෙවත් ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ බලය පැවරී ඇත්තේ ව්‍යවස්ථාදායකයටය. මේ අනුව 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ පාර්ලිමේන්තුවට මෙන්ම 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායකය වන ජාතික රාජ්‍ය සභාවටද නීති සම්පාදනය කිරීමේ බලතල ඒ ඒ ව්‍යවස්ථාව යටතේ එම මණ්ඩල දෙකට පවරා තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් දැකිය හැකි වූ විශේෂ ලක්ෂණය වූයේ ආයතන දෙකට හිමිකර දී තිබූ බලතල සම්බන්ධයෙන් පුළුල් වෙනස්කම් දැකිය නැති වීමය. ඒ අනුව සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ පාර්ලිමේන්තුවට නීති පැනවීම සම්බන්ධයෙන් හිමි වූයේ සීමිත බලයක් ය. නමුත් මෙයට වෙනස්ව 1972 ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ජාතික රාජ්‍ය සභාවට නීති පැනවීම සම්බන්ධයෙන් පූර්ණ බලයක් හිමිවිය.

අන්තර්ගතය: සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29(1) වගන්තියේ සඳහන් වන පරිදි 'මේ රාජ්‍යාංගවේ විධිවිධානවලට යටත්ව දිවයිනේ සාමය සන්සුන්කම සහ මනා පාලනය පිළිබඳ නීති සම්පාදනය කිරීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේය' මේ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නීති සම්පාදනය පිළිබඳ බලතල පාර්ලිමේන්තුවට පවරා තිබේ. එහෙත් එම ව්‍යවස්ථාදායක බලය සීමා කිරීම සඳහාද ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසා තිබුණි. ඒ පහත සඳහන් ආකාරයෙනි.

- ව්‍යවස්ථාවේ 29(2) වගන්තියට අනුව 'එවැනි කිසිම නීතියකින්
(අ) යම් ආගමික් ඇදහීම පිළිබඳ තහනම් කිරීම හෝ සීමා කිරීම හෝ නොකළ යුතුය. එසේම
(ආ) යම් ආගමකට හෝ ජාතියකට අයත් පුද්ගලයින් වෙනත් ජාති හෝ ආගම්වලට අයත් පුද්ගලයින් යටත් නොකළා වූ බාධාවන්ට හෝ සීමාවන්ට යටත් නොකළ යුතුය
(ඇ) යම් ආගමකට හෝ ජාතියකට අයත් පුද්ගලයින්ට වෙනත් ජාති හෝ ආගම්වලට අයත් පුද්ගලයින්ට ලබා දී නැති කිසිම වරප්‍රසාදයක් හෝ වාසියක් නොදිය යුතුය.
(ඈ) යම් ආගමික සංස්ථාවක ව්‍යවස්ථා ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත නැතිව වෙනස් නොකළ යුතුය.
එහෙත් ආගමික සංස්ථාවක් නීතිගත කොට තිබෙන්නා වූ යම් අවස්ථාවක දී ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ ඉල්ලීම පිට මිස එවැනි කිසිම වෙනස් කිරීමක් නොකළ යුතුය.

(3) මේ වගන්තියේ (2) වැනි උප වගන්තිය උල්ලංඝනය කරමින් සම්පාදිත සෑම නීතියක්ම වුවද එකී උල්ලංඝනය කිරීමේ ප්‍රමාණයට බල රහිත වන්නේය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 39 වගන්තිය මගින් පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය සීමා කර තිබේ. ඒ පහත සඳහන් ආකාරයෙනි.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(1) අග්‍රාණ්ඩුකාරයා විසින් අනුදක්නා ලද්දාවූද,

(අ) මේ රාජ්‍යාණවට යා කොට ඇති දෙවන උප ලේඛණයේ දැක්වෙන ලංකා ආණ්ඩුවේ යම්කිසි ස්කන්ධයක් පිළිබඳ වූ විධිවිධානවලින් කවරක් වූවද ස්කන්ධ හිමියාගේ හානියට වෙනස් කෙරෙන බව හෝ

(ආ) එකී යම්කිසි ස්කන්ධයක් පිළිබඳ වූ මූල් ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කෙරෙන බව හෝ

එක්සත් රාජ්‍යයේ මහරජතුමාගේ ආණ්ඩුවට පෙනී යන්නා වූද මිනැම නීතියක් රාජ්‍ය ලේකම් වරයකුගේ මාර්ගයෙන් ප්‍රතිග්‍රහණය කිරීමට මහරජතුමාට පුළුවන.

❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 'අධිකරණ විවරණ බලය' පවරා තිබීම මේ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන පනත් කෙටුම්පතක් හෝ පනතක් අහෝසි කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි විය.

ඉහත සඳහන් විධිවිධාන මගින් සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පාර්ලිමේන්තුවේ නීති පැනවීමේ බලය සීමා වීම හේතුකොට ගෙන පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය යටපත් විය.

1972 ව්‍යවස්ථාව අනුව නීති සම්පාදන බලය ජාතික රාජ්‍ය සභාව වෙත පවරා තිබුණි. එම ආණ්ඩුක්‍රමය මගින් පරමාධිපත්‍ය ජනතාව වෙත පවරා තිබුණි. (ව්‍යවස්ථාවේ 3 වෙනි වගන්තිය) ජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක කිරීමේ බලය ජාතික රාජ්‍ය සභාව වෙත හිමිවිය.

ව්‍යවස්ථාවේ 5 වෙනි වගන්තිය මගින් ජාතික රාජ්‍ය සභාව උත්තරීතර ආයතනය බවට පත් කර තිබුණේය. එනම් 'ජාතික රාජ්‍ය සභාව ජනරජයේ උත්තරීතර ආයතනය වන්නේය. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරන්නේද රටේ ආරක්ෂාව ඇතුළු ජනතාවගේ විධායක බලය ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන්නේද නීතිය අනුව ජාතික රාජ්‍ය සභාව විසින්ම ක්‍රියාත්මක කළ හැකි ස්වකීය බලතල හා වරප්‍රසාද සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය නීතියෙන් ප්‍රතිස්ථාපිත අධිකරණ සහ වෙනත් ආයතන මාර්ගයෙන් ක්‍රියාත්මක කරන්නේද ජාතික රාජ්‍ය සභාවයි' යනුවෙනි.

මෙසේ ජනතාවගේ නීති සම්පාදන බලය හිමි ජාතික රාජ්‍ය සභාව වෙත විශේෂයෙන්ම අධිකරණ බලයද හිමි වූ හෙයින් අධිකරණය ජාතික රාජ්‍ය සභාවට යටත් විය. එහෙයින් ජාතික රාජ්‍ය සභාවේ නීති පැනවීමේ බලය සීමා කිරීමේ කිසිදු බලතලයක් අධිකරණයට හිමි වූයේ නැත. එනම් අධිකරණය වෙත 'අධිකරණ විවරණ බලය' හිමි නොවිය. මේ නත්ත්වය හේතු කොට ගෙන ජාතික රාජ්‍ය සභාවේ නීති කෙටුම්පතක් හෝ නීතියක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවූවද එය අහෝසි කිරීමේ බලය අධිකරණයට හිමි වූයේ නැත. එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉක්මවා නීති පැනවීමට ජාතික රාජ්‍ය සභාවට අත්පත්වන අත්තනෝමතික බලය පාලනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය යනුවෙන් ව්‍යවස්ථානුකූල ආයතනයක් ස්ථාපිත කිරීමට 1972 ව්‍යවස්ථාව මගින් පියවර ගන්නා ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ කාර්යභාරය වූයේ ජාතික රාජ්‍ය සභාවේ නීති කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂාකොට තීන්දු දීමය. මෙහිදී යම් නීති කෙටුම්පතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවේ යැයි ව්‍යවස්ථා අධිකරණය තීන්දු කළහොත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කිරීමට ජාතික රාජ්‍ය සභාවට පුළුවන. එනම් යථෝක්ත පනත් කෙටුම්පත ව්‍යවස්ථාවට අනුකූලවන ලෙස නැවත සකස් කිරීම හෝ එම පනත් කෙටුම්පත යටපත් කරදැමීම හෝ ජාතික රාජ්‍ය සභාවේ 2/3 බහුතරයකින් සම්මත කොට එය ක්‍රියාත්මක කිරීමයි. මෙම ක්‍රියාමාර්ගවලින් වැදගත් වන්නේ කුන්වැන්නයි. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන නීතියක් වූවද සම්මත කොට ක්‍රියාත්මක කිරීමට ජාතික රාජ්‍ය සභාවට බලය හිමිවිය. මෙසේ 1972 ව්‍යවස්ථාව මගින් ජාතික රාජ්‍ය සභාවේ නීති පැනවීමේ බලය ප්‍රඥප්ති ලෙස කාර්යක්ෂම කරන ලදී.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

නිගමනය : සෝල්බරි ආණ්ඩුක්‍රමයෙහි ව්‍යවස්ථාදායක වූ පාර්ලිමේන්තුවේ නිහී සම්පාදන බලය පැහැදිලි වශයෙන්ම සීමා කර තිබුනි. එහෙයින් සෝල්බරි පාර්ලිමේන්තුව උත්තරීතර ආයතනයක් වූයේ නැත. එහෙත් 1972 ආණ්ඩුක්‍රමයෙහි ව්‍යවස්ථාදායකය වූ ජාතික රාජ්‍ය සභාවේ නිහී සම්පාදන බලය කිසිදු ආකාරයකින් සීමා වූ යේ නැත. එහෙයින් ජාතික රාජ්‍ය සභාව උත්තරීතර ආයතනය විය.

6.iii. සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධීනත්වය

අරමුණ: අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සම්බන්ධයෙන් සෝල්බරි ව්‍යවස්ථාව මගින් සහ 1972 ව්‍යවස්ථාව මගින් යොදන ලද විධිවිධාන මොහොවාද සහ එම විධිවිධාන මගින් අධිකරණයේ ස්වාධීනත්වය ප්‍රායෝගික වශයෙන් තහවුරු වූයේද යන්න පිළිබඳව අපේක්ෂකයාට ඇති දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙහි අරමුණ වේ.

ප්‍රවේශය: සෝල්බරි ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නෛතික විධිවිධාන පනවා තිබුණි. එහෙත් 1972 ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද අධිකරණය ව්‍යවස්ථාදායකයාට හෙවත් ජාතික රාජ්‍ය සභාවට යටත් කරන ලදි. එහෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම අධිකරණයේ ස්වාධීනත්වය යටපත්කර තිබුණි.

අන්තර්ගතය: සෝල්බරි ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණයක් වූයේ ස්වාධීන අධිකරණයක් ස්ථාපනය කිරීමයි. මේ අනුව අධිකරණ බලය පාර්ලිමේන්තුවට අහිමි කෙරුණි. සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා විශේෂ විධිවිධාන සැකසීම සිදු විය. එම විධිවිධාන සෝල්බරි ව්‍යවස්ථාවේ 52 සිට 56 දක්වා වගන්තිවල අන්තර්ගත කර තිබේ. ඒ පහත සඳහන් ආකාරයෙනි.

52 වෙනි වගන්තිය

- (1) ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරයාද කනිෂ්ඨ විනිශ්චයකාරවරුන්ද අපරාධ අධිකරණ කොමසාරිස්වරුන්ද අග්‍රාණ්ඩුකාරයා විසින් පත් කරනු ලැබේ.

- (2) ශ්‍රේෂ්ඨාධිකරණයේ සෑම විනිශ්චයකාරයෙක්ම ස්වකීය කාර්ය ක්‍රියාව මනාව පවතින තාක් තම තනතුර දැරිය යුත්තේය. පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මණ්ඩල දෙකෙන් සම්මත වූ සංදේශයක් අනුව අග්‍රාණ්ඩුකාරයාට හැර අන් කිසිවෙකුටවත් ඔවුන් රාජකාරියෙන් පහකළ නොහැක.
- (3) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 62 කි.
  එසේ වුවද වයස අවුරුදු 62 සිරුණු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකුගේ සේවා කාලය මාස 12 කින් දීර්ඝ කිරීමට අග්‍රාණ්ඩුකාරයාට පුළුවන
- (4) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ වැටුප් පාර්ලිමේන්තුවෙන් නිරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය.
- (5) අදාල නොවේ
- (6) විනිශ්චයකාරවරුන්ගේ වැටුප් රාජකාරී කාලය තුළ අඩු නොකළ යුතුය.

53 වෙනි වගන්තිය - අධිකරණසේවා කොමිසන් සභාව

- (1) අග්‍රවිනිශ්චයකාරවරයාගෙන්ද, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරයෙකුගෙන්ද, විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකුගෙන්ද සමන්විත අධිකරණ සේවා කොමිසමක් වන්නේය. එහි සභාපති නීල බලයෙන් අග්‍රවිනිශ්චයකාරවරයා වන අතර සෙසු සාමාජිකයින් දෙදෙනා අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබේ. (අගමැතිගේ උපදෙස් පරිදි)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- (2) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු කොමිසමේ සාමාජිකයෙකු ලෙස පත් කළ නොහැක.
- (3) කොමිසමේ නිල කාලය අවුරුදු 05 කි.
- (4) ඉදිරිපත් කෙරෙන යම්කිසි හේතුවක් මත කොමිසමේ මහැම සාමාජිකයෙකු එම තනතුරෙන් පහ කිරීමට අග්‍රාණ්ඩුකාරවරයාට පුළුවන.
- (5) කොමිසමේ සාමාජිකයින්ගේ තාවකාලික පුරප්පාඩු ඇති වූ විට ඒ සඳහා සුදුසු කම් ඇති පුද්ගලයින් තාවකාලික සාමාජිකයින් ලෙස පත් කිරීමට අග්‍රාන්ඩුකාරයාට බලය තබේ.

- (6) කොමිසමේ සාමාජිකයින්ගේ වැටුප් පාර්ලිමේන්තුවෙන් නිරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබේ. එම වැටුප් ඔවුන්ගේ සේවා කාලය තුළ අඩුකළ නොහැක.

54 වෙනි වගන්තිය

- කොමිසමේ ලේකම්වරයෙකු සිටිය යුතුය.

55 වෙනි වගන්තිය - කොමිසමේ කාර්යභාරය

- (1) අධිකරණ නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම, අස් කිරීම හා ඔවුන්ගේ විනය පාලනය කොමිසම විසින් සිදු කරනු ලැබේ.
- (2) අග්‍රාණ්ඩුකාරවරයා වෙත තම අත්සනින් යවන ලියවිල්ලක් මගින් තනතුරින් ඉල්ලා අස්වීමට මහැම අධිකරණ නිලධාරියෙකුට පිළිවන.
- (3) අදාල නොවේ
- (4) ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ නියෝගයක් පල කරමින් වැටුප් වැඩිවීමක් සිදු නොවන මාරු කිරීම් හැර අනෙකුත් සියළු මාරු කිරීම් අනුමත කිරීම හෝ එම නියෝගයේ සීමාවලට යටත්ව යම් නීතිගරුක් මැඩ බැලීම මිණිස පත් කිරීම පිළිබඳව ලේකම් වෙත බලය පැවරීමට කොමිසමට පිළිවන.
- (5) මේ වගන්තියේ පත් කිරීම යන්නට 'වැඩ බැලීම' හෝ තාවකාලික පත් කිරීම ඇතුලත් වන්නේය. 'අධිකරණ නිලධාරියා' යනුවෙන් මහැම අධිකරණ තනතුරක් දරණ කෙනෙකු අදහස් කෙරෙන නමුත් රට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරයෙක් හෝ අපරාධ අධිකරණ කොමසාරිස්වරයෙක් හෝ ඇතුලත් නොවන්නේය.

56 වෙනි වගන්තිය - අධිකරණ සේවා කොමිසමේ කටයුතුවලට බැඳිහන් වීම දඩුවම් ලැබිය හැකි වරදක් වීම

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා නීතිමය විධිවිධාන පනවා තිබුණද හැබිනයේදී අධිකරණයේ ස්වාධීනත්වය නිසි පරිදි තහවුරු වූයේද යන්න විමසා බැලිය යුතුය. විශේෂයෙන්ම අාමැති ප්‍රබුද්ධ ඇමති මණ්ඩලයේ බලපෑමට අධිකරණය යටත් වූවාද යන්න විමසිම වැදගත්ය. මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරයා සහ අනෙකුත් අග්‍රවිනිශ්චයකාරවරුන් පත් කිරීමේදී අග්‍රාණ්ඩුකාරයා අගමැතිවරයාගේ උපදෙස් ලබා ගැනීම හේතු කොට ගෙන නමන්ට දේශපාලන විශ්වයන් හිතවත් විනිශ්චයකරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කිරීමට අගමැතිවරයාට අවකාශය සැලසේ. ශේෂ්ඨාධිකරණයේ සම්ප්‍රදාය අනුව අගවිනිසුරු ධූරයට පත්වන්නේ ජෙෂ්ඨතම විනිශ්චයකරුවාය. වයස අවුරුදු 62 සම්පූර්ණ වන යම් විනිශ්චයකාරවරයෙකුගේ සේවා කාලය වසරකින් දීර්ඝ වූ විට ඔහුගේ ජෙෂ්ඨත්වය තහවුරු වීමෙන් ඔහු අග්‍ර විනිශ්චකාරධූරයට පත් වීමේ අවස්ථාව උදා කර ගනී. අග්‍රාණ්ඩුකාරධූරයේ වැඩ බැලීම අග්‍රවිනිශ්චකාරයාගේ කාර්යයක් වීම අග්‍රවිනිශ්චකාරධූරයේ දේශපාලන වැදගත්කමට අදාල වන්නකි. සාමාන්‍යයෙන් විනිශ්චයකරුවෙකුගේ සේවා කාලය දීර්ඝ කිරීම අගමැතිගේ දේශපාලන බලපෑම මත සිදුවේ. මේ ආකාරයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ සාමාජිකයින් පත් කිරීම තුළින් ශ්‍රේෂ්ඨාධිකරණය කෙරෙහි අදහැමිමාන බලපෑමක් සිදු කිරීමට ඇගමැතිවරයාට අවස්ථාව උදාවිය. එමෙන්ම අගවිනිසුරුවරයා නීල බලයෙන් අධිකරණසේවා කොමිසමේ සභාපතිවන හෙයින්ද එහි අනෙකුත් සාමාජිකයින් දෙදෙනා අගමැතිගේ දේශපාලන බලපෑම මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන බැවින්ද අධිකරණසේවා කොමිසමේ කටයුතු කෙරෙහි අදහැමිමාන බලපෑමක් සිදු කිරීමට ද අගමැතිවරයාට

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අවකාශය සැලසුණි. මේ ආකාරයෙන් සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ප්‍රායෝගික භාවිතයේදී අධිකරණයේ ස්වාධීනත්වය යථාර්ථයක් බවට පත් වූයේ නැත.

1972 ආණ්ඩුක්‍රමයෙහි මූලිකාංගයක් වූයේ අධිකරණ බලය ජාතික රාජ්‍ය සභාව තුළින් වෘත්තපන්න විමය. එහෙයින් අධිකරණය ස්වාධීන ආයතනයක් නොවූ අතර අධිකරණය ජාතික රාජ්‍ය සභාවට යටත් ආයතනයක් විය. බ්‍රිතාන්‍ය රාජාධිකරණයට ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබූ සම්බන්ධයෙන් පැවති අභියාචනාධිකරණ බලය අහෝසි කරමින් 1971 දී ලංකා පාර්ලිමේන්තුව විසින් අභියාචනා මහාධිකරණ පණත සම්මත කරන ලදී. එමගින් ලංකාවේ ඉහළම අභියාචනා උසාවිය වශයෙන් අභියාචනා මහාධිකරණය පිහිටුවිය. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාවේ උසස් අධිකරණ ආයතන දෙකක් පිහිටුවීය. එනම් ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනා මහාධිකරණයයි. මෙහිදී උසස්ම අධිකරණය වූයේ අභියාචනා මහාධිකරණයයි. එහෙත් 1973 දී සම්මත කළ යුක්තිය පසිඳලීමේ පනත මගින් අභියාචනා මහාධිකරණය සතු බලතල ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරන ලදී. එමගින් අභියාචනා මහාධිකරණය අනෝසි වී ශ්‍රේෂ්ඨාධිකරණය උසස්ම අධිකරණය බවට පත්විය.

122 වගන්තිය

- (1) උසස් අධිකරණ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමි විය.
- (2) විනිශ්චයකාරවරුන් යටා පැවැත්මෙන් සිටින තාක්කල් ධුරය දරන්නේය. ජාතික රාජ්‍ය සභාව සම්මත කරන යෝජනාවක් අනුව ජනාධිපති විසින් ධුරයෙන් ඉවත් නරනු ලැබුව හොත් මිස සිසිඹූ විනිශ්චයකරුවෙක් ධුරයෙන් ඉවත් කළ නොහැක
- (3) ශ්‍රේෂ්ඨාධිකරණ විනාසුරුවෙකුගේ විශ්‍රාම යන වයස අවුරුදු 63 කි
- (4) ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරන්ගේ වැටුප් ජාතික රාජ්‍ය සභාව නියම කරන අතර එම වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය
- (5) විනිශ්චයකාරවරුන්ගේ වැටුප් මවුන්ගේ සේවා කාලය තුළ අඩුකළ නොහැක

124 වෙනි වගන්තියේ සිට 131 වෙනි වගන්තිය දක්වා

- පහළ උසාවිවල අධිකරණ නිලධාරීන්ගේ සහ උපලේඛණ හත රජයේ නිලධාරීන්ගේ බඳවා ගැනීම්, පත්වීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ විනය පාලනය පිළිබඳ සූර්ණ බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලදී. මෙහිදී එම නිලධාරීන් ගේ බඳවා ගැනීම්, පත්වීම් හා මාරු කිරීම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත උපදෙස් ලබා ගැනීම් සඳහා සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත **අධිකරණසේවා උපදේශක මණ්ඩලය** නැමත් ආයතනයද, ඉහත දැක්වූ නිලධාරීන් ධුරවලින් පහ කිරීම හා විනය පාලනය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත උපදෙස් ලබා ගැනීම සඳහා සාමාජිකයින් 03 දෙනෙකුගෙන් සමන්විත **අධිකරණසේවා විනය මණ්ඩලය** නැමත් ආයතනය පිහිටුවන ලදී.

නිගමනය : 1972 ව්‍යවස්ථාවට අනුව උසස් අධිකරණ විනිසුරන් පත් කිරීමේ ක්‍රියාවලිය සෝල්බරි ආණ්ඩුක්‍රමයෙහි එම ක්‍රියාවලියට බෙහෙවින් සමාන වේ. එහෙත් සෝල්බරි ආණ්ඩුක්‍රමයෙහි ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරන්ගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීමට අග්‍රාණ්ඩුකාරයාට පැවති බලය 1972 ආණ්ඩුක්‍රමය යටතේ ජනාධිපතිවරයාට හිමි නොවූ හෙයින් සෝල්බරි ආණ්ඩුක්‍රමයට සාපේක්ෂව 1972 ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට බලපෑම් කිරීමට අගමැතිවරයාට පැවති හැකියාව සීමා වී තිබේ.

එහෙත් පහළ අධිකරණ නිලධාරීන්ගේ පත් වීම් මාරු කිරීම් සේවයෙන් පහ කිරීම් හා විනය පාලනය සම්බන්ධයෙන් සෝල්බරි ආණ්ඩුක්‍රමයට සාපේක්ෂව 1972 ආණ්ඩුක්‍රමය යටතේ පැහැදිළි වෙනසක් සිදුකර තිබුණි. එනම් 1972 ආණ්ඩුක්‍රමය යටතේ එම කටයුතු සම්පූර්ණයෙන්ම ඇමති මණ්ඩලය වෙත (අධිකරණ අමාත්‍යාංශය) පවරා තිබූ හෙයින් අධිකරණ සේවය සෘජු ලෙසම දේශපාලන විධායකයට යටත් විය. එමගින් අධිකරණසේවයේ ස්වාධීනත්වය මුළුමනින්ම යටපත් වී ගියේය.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

Q7 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත දක්වෙන ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

i. **ජනාධිපති තෝරා පත්කර ගැනීමේ ක්‍රමය**

ii. **18 වැනි සහ 19 වැනි ව්‍යවස්ථා සංශෝධන යටතේ ජනාධිපතිගේ තත්ත්වය**

iii. **ජනාධිපතිවරයා තනතුරෙන් ඉවත් කිරීමේ ක්‍රමවේදය**

7.i. ජනාධිපති තෝරා පත්කර ගැනීමේ ක්‍රමය

අර්ථණය: අර්ථණය: 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වෙන විධිවිධාන අනුව ජනාධිපතිවරණය පැවැත්වීම අපේක්ෂකයන්ගේ සුදුසුකම් සහ ජයග්‍රාහී අපේක්ෂකයා තෝරා පත්කරන ආකාරය පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම

ප්‍රවේශය: නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයන් හි විධායකය තෝරා ගැනීම සඳහා විවිධ ක්‍රම භාවිත වේ. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රම තුළ විධායකය වන අග්‍රාමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය රාජ්‍ය නායකයා විසින් ව්‍යවස්ථාදායකය තුළින් තෝරා පත්කරනු ලබයි. ජනාධිපති ආණ්ඩුක්‍රම තුළ ප්‍රධාන විධායකයා වන ජනාධිපතිවරයා තෝරාපත් කරනු ලබන්නේ වක්‍ර හෝ සෘජු මහජන ඡන්ද විමසීමකිනි. ඇමරිකානු එක්සත් ජනපදයේ එම ඡන්ද විමසීම සිදුවන්නේ වක්‍ර ආකාරයකිනි. ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් පවත්වනු ලබන සෘජු මහජන ඡන්ද විමසීමක් මගින් නියත බහුතර ක්‍රමයක් පදනම් කරගෙන වසර පහක නිලකාලයක් (19 වන සංශෝධනය) සඳහා ජනාධිපතිවරයා තෝරාපත්කරනු ලැබේ. (1978 ව්‍යවස්ථාවේ 31 සහ 94 යන වගන්ති බලන්න).

අන්තර්ගතය:

- ජනාධිපති අපේක්ෂකත්වය සඳහා ඇති සුදුසුකම් සහ නාමයෝජනා ඉදිරිපත් කිරීම ජනාධිපතිවරණයට ඉදිරිපත්වන සියළු අපේක්ෂකයන් පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණකොට සිටිය යුතුය.
  (අ). වයස අවුරුදු 35 ක් (19 වන සංශෝධනය) සම්පූර්ණකර තිබීම
  (ආ). ඡන්ද හිමියකු වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම
  (ඇ). ජනතා විසින් දෙවතාවක් ජනාධිපති ධුරයට පත් නොකළ අයෙකු වීම
  (ඈ). දෝෂාභියෝගයකින් තනතුරෙන් ඉවත් නොකළ පුද්ගලයෙකුවීම
  (ඉ). පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරාපත්කර ගැනීමට නොසුදුසු පුද්ගලයකු නොවීම

ඉහත සඳහන් සුදුසුකම් ඇති ඕනෑම පුරවැසියෙක් ජනාධිපති අපේක්ෂකයකු ලෙස නාමයෝජනා ඉදිරිපත් කළ හැකිය. එසේ ඉදිරිපත්වන තැනැත්තාගේ නම;

(අ). එක්කෝ පිළිගත් දේශපාලන පක්ෂයකින් ඉදිරිපත් කළ යුතුය

(ආ). නැතිනම් දැනට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු වේ නම් හෝ මීට පෙර මන්ත්‍රීවරයෙකු ලෙස සිටියේ නම් ඕනෑම දේශපාලන පක්ෂයක් විසින් හෝ ඡන්දදායකයකු විසින් හෝ ජනාධිපති අපේක්ෂකයකු ලස නම්කළ යුතුය.

මෙම විධිවිධාන මගින් ජනාධිපතිවරණයට අපේක්ෂකයන් ස්වාධීනව ඉදිරිපත් වීම සීමා කිරීම බලාපොරොත්තුවන බව පෙනී යන්නේ ය.

- ඡන්දදායකයින් ඡන්දය ප්‍රකාශ කිරීම

ජනාධිපතිවරණයක දී ඡන්දදායකයින් කම ඡන්දය පහත සඳහන් අයුරින් ප්‍රකාශ කළ යුතුය.

(අ). ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයන් තිදෙනෙකු ඉදිරිපත් වී සිටී නම් එහිදී ඡන්දදායකයින්ට ඔය මූලික ඡන්දයට අමතරව දෙවන මනාපයද දැක්විය හැකිය.

(ආ). අපේක්ෂකයන් තිදෙනෙකුට වඩා ඉදිරිපත් වී ඇති නම් එහිදී ඡන්ද දායකයන්ට තම මූලික ඡන්දයට අමතර දෙවන සහ තෙවන මනාපයද ප්‍රකාශ කළ හැකිය.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

➢ ජයග්‍රාහකයා තෝරා පත්කිරීම

ජනාධිපතිවරණයක දී ජයග්‍රාහී අපේක්ෂකයා තෝරා පත්කිරීම සංකීර්ණ කාර්යයකි. සමහරවිට ගණනය කිරීම වට කිහිපයකින් සිදුකෙරේ.

(අ). ප්‍රථම ගණනය කිරීමේ දී ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් අඩකට වඩා ඡන්ද සංඛ්‍යාවක් ලැබූ අපේක්ෂකයකු වෙතොත් ඒ අපේක්ෂකයා ජයග්‍රාහී අපේක්ෂකයා ලෙස ප්‍රකාශ කළ යුතු වේ. මෙය ඒකාන්ත බහුතර ක්‍රමය ලෙස නම්කරනු ලැබේ.

(ආ). එහෙත් ප්‍රථම ගණනය කිරීමේ දී කිසිදු අපේක්ෂකයකු ඒකාන්ත බහුතරයක් ලබා නොගත් අවස්ථාවක දී දෙවන ගණනය කිරීම ආරම්භ වේ. එහි දී මහාපය ගණනය කිරීම සිදුකළ යුතුය. මේ සඳහා වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පළමු වන සහ දෙවන අපේක්ෂකයන් හැර සෙසු අපේක්ෂකයන් තරගයෙන් ඉවත් කොට ඔවුන්ගේ ප්‍රථම ඡන්ද පත්‍රිකාවේ සඳහන් දෙවන මනාපය තරගයේ රැඳී සිටින ප්‍රථම අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් අපේක්ෂකයකුට ප්‍රකාශකොට ඇත්නම් එය එම අපේක්ෂකයාට ලබාදුන් ඡන්දයක් ලෙස ගණනය කර ඔහුගේ හෝ ඇයගේ මූලික ඡන්ද සංඛ්‍යාව සමඟ එකතු කරනු ලැබේ.

(ඇ). දෙවන ගණනය කිරීමේ දී ද ජයග්‍රාහී අපේක්ෂකයා තෝරාපත්කර ගැනීමට නොහැකි වුවහොත් තුන්වන මනාපයද ගණනය කෙරේ. ඒ සඳහා දෙවන මහාපය ගණන් ගනු නොලැබූ එම ඡන්ද පත්‍රිකාවේ ඇති තුන්වන මනාපය රැඳී සිටින දෙදෙනාගෙන් කුමන අපේක්ෂකයාට ප්‍රකාශ කොට ඇත්නම් ඔහුගේ පෙර ඡන්ද සංඛ්‍යාව සමඟ එකතු කරනු ලැබේ. එසේ ගණනය කරනු ලැබූ ඡන්ද සංඛ්‍යාවෙන් බහුතර ඡන්දය හිමිකර ගත්තා අපේක්ෂකයා ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කරනු ලබූ බව ප්‍රකාශ කෙරේ.

(ඈ). රැඳී සිටින අපේක්ෂකයන් දෙදෙනා ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ සමානා තත්ත්වයක් ඇති අවස්ථාවක කුසපත් ඇදීමෙන් ජයග්‍රාහකයා තෝරා පත්කර ගනු ලැබේ.

නිගමනය: ජනාධිපතිවරයා තෝරාපත්කරගනුලබන ඡන්දක්‍රමය ඒකාන්ත බහුතර ක්‍රමය ලෙස නම්කරනු ලැබේ. ප්‍රථම ගණන් කිරීමේ දී ඒකාන්ත බහුතරයක් කිසිදු අපේක්ෂකයකුට නොලැබේ නම් දෙවන සහ තුන්වන මහාප ගණන්කර තරගයේ රැඳී සිටින අපේක්ෂකයන්ගේ ප්‍රථම මහාප සමඟ එකතු කිරීම මගින් ජයග්‍රාහී අපේක්ෂකයා තෝරාපත්කරනු ලැබේ. මෙය ඒකාන්ත විකල්ප ඡන්ද ක්‍රමය ලෙසද නම් කරනු ලැබේ. 1983 සිට 2015 දක්වා පවත්වනු ලැබූ සියළු ජනාධිපතිවරණ වලදී ප්‍රථම ගණනය කිරීමේ දී එක් අපේක්ෂකයකු ඒකාන්ත බහුතරය ලබාගත් බැවින් ඒකාන්ත විකල්ප ක්‍රමය භාවිත කිරීම පැන නොනැගුනි. මේ අනුව ජනාධිපතිවරයා ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමයක් මගින් මහජනයා විසින් සෘජුව තෝරාපත් කරනු ලැබේ. මෙලෙස ජනාධිපතිවරණය සෘජු ක්‍රමයක් සහිත වීම නිසා ජනාධිපති ධුරය බලවත් වීමට හේතුවන අතර එම සෘජු ක්‍රමය නිසා ජනාධිපතිවරයාගේ නිලකාලය විධායකාදායකයේ පාලනයට සහ බලපෑමට ලක් නොවේ.

7.ii. 18 වැනි සහ 19 වැනි ව්‍යවස්ථා සංශෝධන යටතේ ජනාධිපතිගේ කත්තව්‍ය

අරමුණ: පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ 1978 ව්‍යවස්ථාවෙන් ස්ථාපනය කරන ලද ජනාධිපති ධුරයට අයත් තත්ත්වය බලතල හා කාර්යයන් සම්බන්ධ කුමන වෙනස්කම් 18 වෙනි සහ 19 වෙනි ව්‍යවස්ථා සංශෝධන මගින් සිදු කරනු ලැබුවේද යන්න පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කර බැලීමය.

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ප්‍රවේශය: 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපති ධුරය වටා බලකල සංකේන්ද්‍රණය කර තිබුණි. එහෙයින් ජනාධිපති ව්‍යවස්ථානුකූල ඒකාධිපතියෙක් බවට පත් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වෙනි සංශෝධනය මගින් එම ව්‍යවස්ථානු කූල ඒකාධිපතිත්වය කුඨාප්ප්‍රාප්තියට පත්කරන ලදි. එහෙත් 19 වෙනි ව්‍යවස්ථා සංශෝදනය මගින් ජනාධිපති වරයාගේ බලකල සීමාකොට එම ධුරයේ ඒකාධිපති භාවය යටපත් කරන ලදි.

අන්තර්ගතය : 1978 ව්‍යවස්ථාවට 2010 සැප්තැම්බර් මස 07 වෙනි දින අන්තර්ග්‍රහණය කරන ලද 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ තත්ත්වයෙහි කිසිදු වෙනසක් සිදුකරනු නොලැබී ය. (මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(1) වෙනි ව්‍යවස්ථාව වෙනස් කළේ නැත.) 1978 මුල් ආණඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 30(1) ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාගේ තත්ත්වය මෙසේ දක්වා තිබේ. එනම් ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ද වේ.

18 වෙනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිධුරයට අදාලව සිදුකරන ලද මූලික වෙනස්කම් වූයේ ජනාධිපති ධුරයට පත්විය හැකි වාර දෙකේ සීමාව ඉවත් කිරීම ය. මේ අනුව ජනාධිපති ධුරයට පත්වීමට සුදුසුකම් ඇති පුද්ගලයෙකුට ඕනෑමවාර ගණනක් එම ධුරයට පත්වීමේ අවස්ථාව උදාවිය. ඊට අමතරව මාස 03 කට වතාවක් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට සහභාගීවීම පිළිබඳ විධිවිධානය පනවන ලදී.

රජයේ උසස් තනතුරුවලට පුද්ගලයින් පත්කිරීම සඳහා ජනාධිපතිවරයා වෙත මුල් ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයා වෙත පවරා තිබූ බලතල සීමා කිරීම සඳහා 17 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ස්ථාපිත කරන ලදී. එම සංශෝධනය මගින් පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනය මගින් අහෝසි කොට ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාව පිහිටුවන ලදී. එම පාර්ලිමේන්තු සභාව පිහිටුවූයේ රජයේ උසස් තනතුරුවලට පුද්ගලයින් පත්කිරීමේ දී ජනාධිපතිවරයාට උපදෙස් ලබාගැනීම සඳහා ය. මේ අනුව නැවතත් රජයේ උසස් තනතුරුවලට පුද්ගලයින් පත්කිරීමේ දූර්ණ බලය ජනාධිපතිවරයාට හිමි විය.

2015 අප්‍රේල් 28 වෙනි දින සම්මත කරන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ තත්ත්වයෙහි කිසිදු වෙනසක් සිදු කරනු නොලැබී ය. (එනම් මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 30 (1) ව්‍යවස්ථාව වෙනස් නොකෙරුණි).

මුල් ව්‍යවස්ථාවෙහි 30(2) ව්‍යවස්ථාවට අනුව ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරාපත්කර ගත යුත්තේ ය. ජනාධිපතිවරයා සාදුරුදු කාලයක් ධුරය දරන්නේ ය. මෙම විධිවිධානය 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි 30 (2) ව්‍යවස්ථාව මගින් වෙනස් කරන ලදී .ඒ අනුව ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර පහකට සීමා කර තිබේ.

මුල් ව්‍යවස්ථාවේ 31 (2) ව්‍යවස්ථාවට අනුව ජනතාව විසින් දෙවරක් ජනාධිපති ධුරයට තෝරාපත්කර ගනු ලැබූ කිසිම කැනැත්තෙක් ඉන් පසුව එම ධුරයට ජනතාව විසින් තෝරාපත්කර ගනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය. ජනාධිපති ධුරයට පත් වීමේ මෙම වාර දෙකේ සීමාව වර්ෂ 2010 සැප්තැම්බර් මාසයේ සම්මත කරන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි 31(2) (අා) ව්‍යවස්ථාව මගින් අවලංගු කරන ලදී . මේ අනුව යම් පුරවැසියෙකුට ඕනෑම වාර ගණනක් ජනතා ඡන්දයෙන් ජනාධිපති ධුරයට පත් වීමේ අවස්ථාව උදාවිය. එහෙත් 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් 18 වන සංශෝධනයේ 31(2)(අා) ව්‍යවස්ථාව අවලංගු කරමින් යළින් වරක් මුල් ව්‍යවස්ථාවෙහි 31(2) ව්‍යවස්ථාව නීතිගත කරන ලදී . එමගින් යම් පුද්ගලයෙකුට ජනාධිපති ධුරයට තේරී පත්වීමට හැකි වාර ගණන දෙකකට සීමා විය.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ජනාධිපතිවරයාගේ බලතල හා කාර්ය

මූල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් සඳහන් වී තිබෙන්නේ 33 වෙනි සහ 34 වෙනි ව්‍යවස්ථාවල ය. 19 වන සංශෝධනය මඟින් මූල් ව්‍යවස්ථාවේ 33 ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ම අවලංගුකොට නව 33 වෙනි ව්‍යවස්ථාවක් ඇතුළත් කර තිබේ. ඒ අනුව

33 (1) ජනාධිපතිවරයාගේ කාර්ය විය යුත්තේ

(අ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම

(ආ). ජාතික ප්‍රතිසංධානය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම

(ඇ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VII අ ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරිත්වය සහතික කරලීම සහ

(ඈ). මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණයක් නිර්මාණය කිරීම හා තහවුරු කිරීම.

ඉහත සඳහන් කාර්යයන් මූල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ජනාධිපතිවරයා වෙත පැවරී තිබුණේ නැත.

19 වෙනි ව්‍යවස්ථා සංශෝධනයේ 32(3) අනු ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා ස්වකීය ධුරයෙහි බලය ප්‍රකාර මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට සභාගත් විය යුත්තේය. මෙය 18 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි 3(1) අනු ව්‍යවස්ථාවෙහිද ඇතුළත් විය. එම විධිවිධානය මූල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඇතුළත් වූයේ නැත.

19 වෙනි ව්‍යවස්ථා සංශෝධනයෙහි 33 (2) ව්‍යවස්ථාව මඟින් ජනාධිපතිවරයාට පවරා ඇති බලතල හා කාර්යයන් මූල් ව්‍යවස්ථාවෙහි 33 ව්‍යවස්ථාවේ සඳහන්ව තිබුණි. එයට අමතරව 19 සංශෝධනයේ 33(2) ව්‍යවස්ථාවට ඇතුළත්කර තිබූ (ඉ) ඡේදයෙහි ජනාධිපති නිහිඬයින් පත් කිරීමේ බලය මීට පෙර ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා නොතිබුණි.

මූල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අග්‍රවිනිශ්චයකාරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ එහි අනෙකුත් විනිශ්චයකාරවරයන්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හැර අනෙකුත් සාමාජිකයින්, විනිපති, විගණකාධිපති, පොලිස්පති, මහිඳුඩස්මන් සහ පාර්ලිමේන්තු මහලේකම් යන තනතුරු සඳහා පත් වීම් සිදු කිරීමේ බලය හිමි වූයේ ජනාධිපතිවරයාටය. එහෙත් එම බලය 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 41ඇ(1) අනු ව්‍යවස්ථාවට මඟින් ජනාධිපතිවරයාට අහිමිකර තිබේ. එම අනු ව්‍යවස්ථාවෙහි දැක්වෙන පරිදි ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරන ලද නිර්දේශයක් මත එම සභාව විසින් අනුමතකර ඇත්නම් මිස කිසිම ධුරයකට (ඉහතින් සඳහන් කර ඇති) ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තෙකු පත්කරනු නොලැබිය යුත්තේය. මේ ආකාරයෙන් ඉහත දැක් වූ උසස් තනතුරුවලට පත්වීම් කිරීමට මෙතෙක් ජනාධිපතිවරයාට තිබූ බලය සංවරණය කර තිබේ.

මූල් ව්‍යවස්ථාවේ VIII පරිච්ඡේදය 19 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් සම්පූර්ණයෙන් ම අවලංගු කර ඇති අතර ඒ වෙනුවට නව විධිවිධාන සඳහන්ව දී තිබේ. 19 සංශෝධනයෙහි ඇතුළත් VIII පරිච්ඡේදයෙහි විධිවිධාන අතුරින් මූල් ව්‍යවස්ථාවෙහි සඳහන් නොවන සංශෝධිත විධිවිධාන පහත සඳහන් පරිදි වේ.

මූල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේ දී අමාත්‍යවරුන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීම පිළිබඳ සංඛ්‍යාත්මක සීමාවක් පනවා නොතිබුණි. එහෙත් 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 46(1) ව්‍යවස්ථාව මඟින් ඒ සම්බන්ධයෙන් පහත සීමා පනවා තිබේ.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

46 (1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුලු අමාත්‍යවරුන් සංඛ්‍යාව තිහ නොඉක්මවිය යුතු ය.

(ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව සතලිහ නොඉක්මවිය යුතු ය.

එහෙත් ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවක ඉහත සඳහන් අමාත්‍යවරයන් සංඛ්‍යාව නොපමණදායි බව තීරණය කළ යුත්තේ පාර්ලිමේන්තුව විසින් ඔව් 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 46(4) ව්‍යවස්ථාවේ සඳහන් වේ.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47 ව්‍යවස්ථාවට අනුව අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් ඉවත් කිරීමේ අභිමතානුසාරී බලය ජනාධිපතිවරයාට පැවතිය ද එම බලය 19 වන සංශෝධනයේ 46(3) ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට අහිමි කර තිබේ. මෙහිදී ඇමතිවරුන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට ලැබෙන්නේ අගමැතිගේ උපදෙස්මත පමණි .

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47 ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි අගමැතිවරයා ධුරයෙන් ඉවත් කළ හැකි ය. නව සංශෝධනයේ 46(2) ව්‍යවස්ථාවට අනුව ස්වකීය අත්සනින් ජනාධිපතිවරයා වෙත යවන ලිපියකින් ඉල්ලා අස්වූවහොත් හෝ තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු නොවූවහොත් හෝ මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් කාල් කල් අමාත්‍ය මන්ඩලය පවත්නේ ද ඒ කාල් කල් අගමැතිවරයා ස්වකීය ධුරය දරන්නේ ය. මේ අනුව ජනාධිපතිගේ අභිමතය පරිදි අගමැති ධුරයෙන් ඉවත් කිරීමේ බලය අහෝසි කර තිබේ.

ඉහත සඳහන් විධිවිධාන අනුව අගමැති සහ අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් මෙතෙක් ජනාධිපතිවරයා වෙත පැවති බලතල ඉවත් කර තිබෙන අතර එමගින් අගමැතිවරයාගේ බලය ප්‍රබල් වී තිබේ

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) ව්‍යවස්ථාවට අනුව මහා මැතිවරණයක් අවසන්වී වසරක් ගතවූ පසු පාර්ලමේනතුව විසුරුවා හැරීමේ අභිමතානුසාරී බලය ජනාදිපතිවරයාට පැවතුණි . 19 වෙනි සංශෝධනයේ 70(1) ව්‍යවස්ථාවට මගින් මුල් ව්‍යවස්ථාවේ ඉහත විධිවිධානය අහෝසිකර ඇති අතර ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමෙන් අවුරුදු කතරක් සහ මාස හයක කාලයක් අවසන් වීමෙන් පසුව ය. මෙමගින් පාර්ලිමේන්තුවේ අත්තනෝමතික භාවය ඉස්මතු විය හැකිය. එමෙන්ම ජනාධිපති සහ පාර්ලිමේන්තුව අතර අඛණ්ඩ ගැටුමකට ද එය හේතු විය හැක.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(2) වගන්තියට අනුව පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේපිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය නොවන පනතක් ජනමත විචාරණයකට ලක්කර අනුමැතිය ලබා ගැනීමෙන් ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයාට බලය පැවතිණි .එම බලය 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉවත් කර තිබේ .

මුල ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92(අ) ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිධුර අපේක්ෂකයකුගේ වයස් සීමාව අවුරුදු 30ක් විය. එහෙත් නව සංශෝධනය මගින් එම වයස් සීමාව අවුරුදු 35 දක්වා වැඩිකර තිබේ.

19 වන ආන්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 35(1) ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට එරෙහිව ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තිය යටතේ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරිය හැකි බව පිළිගෙන තිබේ.

නිගමනය: මුල් ව්‍යවස්ථාව සහ 18 වෙනි සහ 19 වෙනි ව්‍යවස්ථා සංශෝධන සන්සන්දනය කිරීමෙන් ජනාධිපතිගේ තත්ත්වය සහ බලතල සහ කාර්යයන් සම්බන්ධයෙන් සිදු කර තොතිබෙන වෙනස් කම් මෙන්ම සිදු කර තිබෙන වෙනස්කම් පිළිබඳව අපේක්ෂකයා සඳහන් කර තිබිය යුතුය. මෙහිදී යටෝක්ත සංශෝධන දෙක මගින් ජනාධිපතිගේ තත්ත්වයේ කිසිදු වෙනසක් සිදු කර නොමැති බවත්, 18 වෙනි සංශෝධනයෙන් ජනාධිපති ඒකාධිපතිත්වය වඩාත් නහවුරු කර ඇති බවත්, 19 වෙන් සංශෝධනය මගින් ජනාධිපතිගේ බලතල සීමා කර ඇති බවත් සඳහන් කර තිබිය යුතුය.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

iii. ජනාධිපතිවරයා තනතුරෙන් ඉවත් කිරීමේ ක්‍රමවේදය

අරමුණ: ජනාධිපතිවරයාව තනතුරෙන් ඉවත් කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දී ඇති දෝෂාභියෝග විධිවිධාන සහ ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට සහ අධිකරණයට ලබාදී ඇති වගකීම් සහ යුතුකම් පිළිබඳව විභාග අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම කොටසේ අරමුණ වේ.

ප්‍රවේශය: නූතන පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම තුළ විධායකයේ නිලකාලය අවසන් වීමට පෙර නිලයෙන් පහකිරීමට හැකියා කරන විශ්වාසභංග යෝජනා සම්මතය මෙන් සරල ක්‍රමයකින් ජනාධිපති ආණ්ඩුක්‍රම වල ජනාධිපතිවරයා තනතුරෙන් පහකළ නොහැක. ඒ සඳහා දෝෂාභියෝගය වැනි ඉතා සංකීර්ණ ක්‍රමයක් හැකියා කෙරේ. දේශපාලන විද්‍යාවේ දෝෂාභියෝගය යනු ප්‍රජාත්තන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ දඬුවම් දීමේ අවසාන ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ වසර 5ක නිශ්චිත නිළ කාලයක් සඳහා සෘජු මහජන ඡන්දයෙන් තෝරාපත්වන ජනාධිපතිවරයා ඔහුගේ ධුරකාලය අවසන් වීමට පෙර නිලයෙන් පහකිරීම සඳහා දෝෂාභියෝග ක්‍රමයක් හඳුන්වා දී ඇත.

අනන්තර්ගතය: 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 (2) වගන්තියේ සඳහන් දෝෂාභියෝගය අධියර කිහිපයකින් සමන්විත සංකීර්ණ ක්‍රියාවලියකි.

අදියර 1. දෝෂාභියෝග යෝජනාව සකස්කිරීම සහ එය කථානායකයා වෙත භාරදීම සිදුකිරීම මෙම අධියරේදී සිදු කෙරේ.

ජනාධිපතිවරයාට එරෙහිව ඉදිරිපත් කරන දෝෂාභියෝග යෝජනාවේ පහත සඳහන් කාරණා වලින් එකක් හෝ කිහිපයක් සඳහන් විය යුතුය.

- මානසික හෝ ශාරීරික දුර්වලතාවක් නිසා සිය ධුරයේ කාර්යයන් නියම ලෙස ඉටුකිරීමට නොහැකි වීම
- චෙතනාන්විතව ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම
- රාජ්‍ය ද්‍රෝහීවීම
- අල්ලස් ගැනීම
- මූලධර්ම අයුතු භාවිය, විෂමාචාරය හා දූෂණය
- චරිත දූෂණය

ඉහත සඳහන් කාරණාවක් හෝ කාරණා කිහිපයක් අඩංගු යෝජනාවක් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට කථානායකවරයා වෙත භාරදිය හැකිය.

කථානායකවරයා විසින් එබඳු යෝජනාවක් භාරගත යුත්තේ එම යෝජනාව පිළිබඳ
(අ). මුලු මන්ත්‍රී සංඛ්‍යාවේ 2/3කට නොඅඩු සංඛ්‍යාවක් අත්සන් කර තිබේ නම් හෝ
(ආ). එම යෝජනාව පිළිබඳ දන්වීම මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් අඩකට නොඅඩු පිරිසක් අත්සන් කොට ඇති අවස්ථාවක එම චෝදනා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පරීක්ෂාකොට වාර්තා කිරීමට නෙරෙම් ඒවා සුදුසු බවට කථානායක වරයා සෑහීමට පත්වේ නම් පමණි.

ඉන් පසුව කථානායක වරයා එම යෝජනාව පාර්ලිමේන්තු නියෝග පත්‍රයට ඇතුලත් කරයි.

අදියර 2 ඉහත සඳහන් යෝජනාව පාර්ලිමේන්තුවේදී විවාදයට ලක්කොට නොපැමිණි මන්ත්‍රීවරයින් ද ඇතුළුව මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 2/3 නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කළ යුතු වේ. ඉන්පසු එම චෝදනා පරීක්ෂාකොට වාර්තාකිරීමට කථානායකවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුකළ යුත්තේ ය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යථා පරිදි පරීක්ෂණයක් කිරීමෙන් පසු ස්වකීය තීරණය සහ ඊට හේතුද දක්වෙන වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. එම පරීක්ෂණයේ දී ජනාධිපතිවරයාට පෞද්ගලිකව හෝ නම් නීතිඥවරයකු මඟින් පෙනී සිටීමටද කරුණු කියා සෑමටද අයිතිය ඇත්තේ ය.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අදියර 3. දෝෂාභියෝග වෝදනාවේ සඳහන් කර ඇති පරිදි මානසික හෝ ශාරීරික අවලංගු හේතුවෙන් ජනාධිපතිවරයාට සිය ධුරයේ කාර්යයන් ඉටුකිරීමට නොහැකි බව හෝ එම යෝජනාවේ සඳහන් කවර වූ හෝ වරදක් ජනාධිපතිවරයා සිදුකර ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ලිමේන්තුවට වාර්තා කරන ලද අවස්ථාවක නැවතත් මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 2/3ට නොඅඩු සංඛ්‍යාවක් විසින් එම දෝෂාභියෝග යෝජනාව සම්මත කිරීමෙන් පසු පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කළ හැකිවේ.

නිගමනය: දෝෂාභියෝගයක් යනු අතිවිශේෂ බහුතරයක් තුන් වතාවක් අවශ්‍ය කරවන දීර්ඝ හා සංකීර්ණ ක්‍රියාවලියකි. එය පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර අනුමැතිය සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ සීමිත්වව අවශ්‍ය කරවන ඉතා දුෂ්කර ක්‍රමවේදයකි. එබැවින් ධුරය උසුලන ජනාධිපතිවරයෙකු ප්‍රායෝගිකව ඉවත් කිරීම ඉතා අපහසුය. එම පිළිවෙත කොතරම් අපහසු දයි කිවහොත් ඉහත සඳහන් කළ වැරදි පහ සම්බන්ධයෙන් එකී ක්‍රියා පිළිවෙහ කවර දිනයක හෝ අනුගමනය කළ හැකි වේ දයි යන්න සැක සහිතය. එබැවින් නීතිය කඩකරන, වැරදි සිදු කරන සහ මානසික හා ශාරීරික අබලකාළයේ පෙළෙන උම්මාදක ජනාධිපතිවරයකු වුවද අපට බොහෝ කලක් ඉවසා සිටීමට සිදුවේ.

Q8. පහත දක්වෙන මාතෘකා දෙකක් විභාග කරන්න.

i. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු හා මූලධර්ම

ii. දකුණු ආසියානික කලාපීය සහයෝගිතා සංවිධානයේ අරමුණු හා මූලධර්ම

iii. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ කාර්යභාරය.

8.i.එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු හා මූලධර්ම

අරමුණ: විශ්වීය ආණ්ඩුකරණයේ ප්‍රධාන ක්‍රියාකරු වන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු සහ අනුගමනය කරන මූලධර්ම පිළිබඳ විභාග අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂාකිරීම මෙම ප්‍රකාථනයෙන් අපේක්ෂා කෙරේ.

ප්‍රවේශය: අන්තර්ජාතික සමාජය තුළ අන්තර් රාජ්‍ය දේශපාලන සම්බන්ධතා සම්බන්ධයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන් වැදගත් වන ආර්ථික හා සමාජීය කරුණු සම්බන්ධයෙන්ද අභිඥය වැදගත් භූමිකාවක් ඉටුකරන ප්‍රධානම අන්තර් රාජ්‍ය සංවිධානය වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයයි. එය හොඳහැටි සිහිතබාගන්නේ පහත දැක්වෙන අරමුණු සහ මූලධර්ම වනය.

- **අරමුණු**
  1) අන්තර්ජාතික සාමය සහ සුරක්ෂිතාව පවත්වා ගෙනයාම.
  2) ජනතාවගේ ස්වයං තීරණ ගැනීමේ සහ සමාන අයිතිවාසිකම් පිළිබඳ මූලධර්මයට ගරුකරමින් ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම.
  3) අන්තර්ජාතික ආර්ථික, සමාජය, සංස්කෘතික හා මානවප්‍රශ්න විසඳීම සඳහාත්, මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වර්ධනය කිරීම් සඳහාත් අන්තර්ජාතික සහයෝගිතාව වර්ධනය කිරීම.
  4) ඉහත දක්වන ලද අරමුණු ඉටුකර ගැනීම උදෙසා ගනු ලබන පියවරවල් එක්තැන් කොට ඒවා අතර සම්බන්ධීකරණය පවත්වා ගෙනයාමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- **සාමාජික රාජ්‍යයන් කෙරෙහි අදාළ මූලධර්ම**

1) සියලුම සාමාජිකයින් ස්වාධිපති සමානයන් වේ.
2) සාමාජිකයින් ප්‍රඥප්තියෙන් කමන්ට පැවරී ඇති බැඳීම් හොඳ හිතින් ඉටුකළ යුතුය.
3) අන්තර්ජාතික සාමයට සහ සුරක්ෂිතභාවයට, සධාරණත්වයට හානියක් සිදු නොවන ආකාරයට සාමාජිකයින් තමන් අතර හට ගැනෙන අර්බුද සාමකාමී මාර්ග වලින් විසඳා ගත යුතුය.
4) ජාතීන් අතර සම්බන්ධතා පවත්වා ගෙන යාමේදී වෙනත් රාජ්‍යයකට එරෙහිව තර්ජනය කිරීමෙන් හෝ බලය යෙදවීමෙන් සාමාජිකයින වැලකිය යුත්තේය.
5) එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූලව සංවිධානය විසින් ගනු ලබන ඕනෑම පියවරකට සෑම රාජ්‍යයක්ම සම්පූර්ණ සහාය දැක්විය යුතු අතර, සංවිධානය විසින් රාජ්‍යයන්ට එරෙහිව සම්බාධක පනවා ඇති විටක එවැනි රාජ්‍යයන්ට සාමාජික රාජ්‍යයන් කිසිදු සහායක් නොදිය යුත්තේය.
6) අන්තර්ජාතික සාමය සහ සුරක්ෂිතභාවය ඉටුකිරීමේ අරමුණින් ඉහත දැක්වූ මූලධර්ම අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය කටයුතු කිරීමේදී සංවිධානයේ සාමාජිකයින නොවන රාජ්‍යයන් විටද සහය දක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
7) රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතු වලට මැදිහත් වීමට ප්‍රඥප්තිය යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට බලය නිමී නොවේ.

8.II. දකුණු ආසියානික කලාපීය සහයෝගිතා සංවිධානයේ අරමුණු හා මූලධර්ම

අරමුණ: කලාපීය සහයෝගිතාවය වර්ධනය කිරීම සඳහා දකුණු ආසියානික රාජ්‍යයන් විසින් සාක් සංවිධානය පිහිටුවා කිබෙන අරමුණු සහ මූලධර්ම පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය සහ දැනුම පරීක්ෂාකිරීම මෙම කොටසේ අපේක්ෂාවයි.

ප්‍රවේශය: 1985 දෙසැම්බර් 8 දින ඩකා ප්‍රකාශනය හෙවත් සාක් ප්‍රකාශනය පදනම් කරගෙන පිහිටුවන ලදි. සාමාජික රාජ්‍ය සංඛ්‍යාව අටකි. ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය, ශ්‍රී ලංකාව, නේපාලය, භූතානය, මාලදිවයින සහ ඇෆ්ගනිස්ථානය එම රාජ්‍යයන් අට වේ.

අන්තර්ගතය: දකුණු ආසියානික කලාපීය සහයෝගිතා සංවිධානයේ අරමුණු සහ මූලධර්ම පහත පරිදි වේ.

- අරමුණු

1) දකුණු ආසියානික ජනතාවගේ සුභසාධනය හා ජීවන මට්ටම නගා සිටුවීම.
2) කලාපය තුළ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම, සමාජ ප්‍රගතිය වර්ධනය කිරීම, කලාපයේ ජනතාවගේ හැකියාවන් වර්ධනය කරමින් ආත්මාභිමානයෙන් ජීවත්වීමට ඉඩ සැළසීම.
3) දකුණු ආසියානික රාජ්‍යයන්ගේ සාමූහික පැවැත්ම ශක්තිමත් කිරීම.
4) අනෙන්‍යෝන්‍ය විශ්වාසය හා අවබෝධය තුළින් එකිනෙකාගේ ප්‍රශ්න තේරුම් ගැනීම.
5) ආර්ථික, සමාජ, සංස්කෘතික, තාක්ෂණික සහ විද්‍යා ක්ෂේත්‍රයන්හි සහයෝගය හා ආධාර උපකාර කරගැනීම වර්ධනය කර ගැනීම.
6) සංවර්ධනය වෙමින් පවතින රටවල් සමග සහයෝගය ශක්තිමත් කිරීම.
7) සංවිධානයේ සාමාජික රාජ්‍යයන්ට බලපාන පොදු කරුණු පිළබඳව අන්තර්ජාතික සංවිධාන තුළ සාමූහිකයෙන් ක්‍රියාකිරීම ශක්තිමත් කිරීම.
8) සමාන අරමුණු සහිත අනෙත් අන්තර්ජාතික සහ කලාපීය සංවිධාන සමග සහයෝගිතාව වර්ධනය කිරීම.

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- මූලධර්ම

1) ස්වාධිපති සමානාත්මතාවය, දේශසීමා ඒකාග්‍රතාව, දේශපාලන නිදහස, අභ්‍යන්තර කටයුතු වලට මැදිහත් නොවීම සහ අන්‍යෝන්‍ය ආධාර උපකාර කර ගැනීම යන මූලධර්ම මත පිහිටා සාමාජිකයින් ක්‍රියා කිරීම.

2) සංවිධානයේ සිරුර ගැනීම ඒකමතිකව ගැනීම.

3) ද්විපාර්ශවික හා අර්බුදකාරී කරුණු සංවිධානය තුළ සාකච්ඡා නොකිරීම.

8.iii. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම් සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ කාර්යභාරය.

අරමුණ: මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ස්ථාපිතකොට ඇති ප්‍රධානම ආයතනය වන මානව හිමිකම් කවුන්සිලයේ කාර්යභාරය කුමක්ද යන්න සම්බන්ධව විභාග අපේක්ෂකයාගේ අවබෝධය සහ දැනුම විභාග කිරීම මෙම කොටසේ අරමුණ වේ.

ප්‍රවේශය: මානව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලය විසින් මානව හිමිකම් කවුන්සිලය පිහිටවූයේ 2006 මාර්තු 15 දිනය. එය ක්‍රියාත්මක වන්නේ මහා මණ්ඩලයේ සහායක ආයතනයක් වශයෙනි. මානව හිමිකම් කවුන්සිලය පිහිටුවීමත් සමග 1946 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ මානව හිමිකම් කොමිසම අහෝසි විය.

අන්තර්ගතය: මානව හිමිකම් කවුන්සිලයේ අරමුණු වන්නේ (අ). ඒ ඒ රාජ්‍ය වල මානව හිමිකම් කඩවීම් කෙරෙහි අවධානය යොමුකොට ඒවාට පිලියම් යෙදීම සහ (ආ). මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමය. මානව හිමිකම් කවුන්සිලය සමන්විත වන්නේ මහා මණ්ඩලය විසින් එහි සාමාජික රාජ්‍යයන් අතුරින් තෝරාපත් කරනු ලබන සාමාජිකයින් 47 දෙනෙකුගෙනි. සාමාජිකයින් තෝරන්නේ කලාපීය පදනම් මතය. ඒ අනුව අප්‍රිකානු කලාපයට 13 ක්, ආසියානු කලාපයට 13 ක්, නැගෙනහිර යුරෝපයට 06 ක්, ලතින් ඇමරිකාව සහ කැරිබියානු කලාපයට 08 ක්. බටහිර යුරෝපයට සහ අනෙක් කලාප වලට 07 ක් වශයෙන් තෝරාපත් කරනු ලැබේ. සාමාජිකයින්ගේ නිල කාලය වසර 03 කි. මහා මණ්ඩලයේ 2/3 ක බහුතර අනුමැතියෙන් සාමාජිකයින් සාමාජිකත්වයෙන් ඉවත් කළහැක. කවුන්සිලය සෑම වර්ෂයකම මාර්තු, ජූනි සහ සැප්තැම්බර් යන මාස වලදී රැස්වීම් පවත්වනු ලැබේ.

මානව හිමිකම් කවුන්සිලයේ ප්‍රධාන බලතල අතර නිර්දේශකිරීම් සිදුකිරීම, ප්‍රමිතීන් නිර්ණය කිරීම අනුගතකිරීම් නිරීක්ෂණය කිරීම සහ නාකෝණික බලතල වැදගත් වේ.

1) නිර්දේශකිරීම්: විශේෂිත රාජ්‍යයන් සම්බන්ධව හෝ තේමාත්මක ගැටලු සම්බන්ධව හෝ පොදු සහ සංවිධානාත්මක උල්ලංඝනයන් (නිදසුන් ලෙස කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම) සම්බන්ධව නිර්දේශ කිරීම සහ යම් යම් ස්ථාවරයන් පිළිපැදීමට ඇති බලය මින් අදහස් වේ. කෙසේ වෙතත් මෙම නිර්දේශ පිළිපැදීමට සාමාජික රාජ්‍යයන් බැඳී නොමැති අතර පවතිනාස හ යෝජිත නීති ප්‍රකාර වලදී හාවිතා කිරීමට පිළිවන.

2) නිර්දේශ සැකසීම්: රාජ්‍ය බැඳීම් සහ වගකීම් වල පදනම සැකසීමට අවශ්‍ය ප්‍රතිමාණ අනුමත කිරීම සහ මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ අන්තර්ජාතික ප්‍රමිතීන් ස්ථාපිත කිරීම (මානව අයිතිවාසිකම් පිළිබඳව සහ පෞද්ගලික ව්‍යවසාය මාර්ගෝපදේශ සැකසීම)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

3) අනුගතවීම් නිරීක්ෂණය කිරීමේ බලතලෑ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රාජ්‍යයන් අනුගතවන ආකාරය නිරීක්ෂණය කිරීම වැනි අධීක්ෂණ කාර්යයන් ඉටුකරයි. එහි නිර්දේශ සහ නිරීක්ෂණයන්ට සහයෝගය නොදක්වන රාජ්‍යයන් සමඟ කටයුතු කිරීමට එයට පැවරී ඇති වගකීමකි. එවැනි තත්ත්වයක් පැනගැගි අවස්ථාවක මානව හිමිකම් කවුන්සිලයේ විශේෂ නියෝජිතයකු එම රාජ්‍යයන්ට යැවීමට හෝ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට හෝ ආරක්ෂක කවුන්සිලයට වැදගත්වන ලෙස ඉල්ලා සිටීමට ක්‍රියා කළහැකිය.

4) තාක්ෂණික බලතලෑ රාජ්‍යයන්, එක්සත් ජාතීන්ගේ අනු ආයතන සහ නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු විවිධ ක්‍රියාකරුවන් සමඟ තොරතුරු හුවමාරුකරගැනීම මෙහි දී සිදුවේ. සාකච්ඡා හරහා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ උපදේශන සේවාවන් හා තාක්ෂණික සහයෝගිතා සේවාවන් සැපයීමද මීට අයත් වේ. විවිධ ක්‍රියාකරුවන් අතර සාකච්ඡා පවත්වන මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක විය.

කවුන්සිලයේ ඉහත බලතල වලට අමතරව පහත සඳහන් කාර්යයන් ඉටුකිරීම

1) එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සහ අනෙකුත් ලියකියවිලි වල මූලධර්මයන් මත පදනම්ව සහයෝගීතාව සහ සාකච්ඡාවන් පැවැත්වීම
2) මානව හිමිකම් උල්ලංඝනය වන හදිසි අවස්ථාවලදී සහ පොදු මානව අයිතිවාසිකම් උල්ලංඝනය වී වැලැක්වීම හා සම්බන්ධව කටයුතු කිරීම
3) මානව හිමිකම් සම්බන්ධ ජාත්‍යන්තර නීතිය හා එක්සත් ජාතීන්ගේ වෙනත් විවිධ සම්මුතීන් ඵලදායීව ක්‍රියාත්මකවීම නහවුරු කිරීම
4) මානව හිමිකම් පිළිබඳ රාජ්‍ය නොවන සංවිධානා වැනි සහයෝගිතා ආයතනවලට අවශ්‍ය විශේෂඥ උපදේශ ලබාදීම
5) මානව අයිතිවාසිකම් ආරක්ෂණය සහ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් නිර්දේශ සහ විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
6) මානව අයිතිවාසිකම් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
7) මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිමාන දියුණු කිරීම
8) විශ්වීය මට්ටමින් කාලීන ඇගයුම් පැවැත්වීම

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.